සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2558ක් වූ වෙසක් මස (ව්‍යවහාරික වර්ෂ 2014 මැයි)

31 වෙනි කලාපය




රු. 20/-

● සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# පරිණාමය සහ විපරිණාමය



හට ගත් දෙයක් කල් යන විට වෙනස් වෙවී
නොමළත් තවත් අයුරක් වෙයි කොටස් ගෙවී
මළමුත් තමන් හට එල නැති දෙයක් දැවී
නැති වෙත් දුකක් ඒ ගැන කිසි සිතක් නොවී

වෙනස් වෙවී ගිය පළියට හැම දේම
ගෙනත් නොදේ දුක් කරදර විට සෑම
තැනක් නොදෙන විට මනසට රිසි සේම
කෙනත් ළඟින් හිටි දුක් ගොන්නකි බෝම

ළමා ළපටි උන් ලොකු වෙන විටදී එන
නිමා නැති සතුට පරිණාමයකි වන
පමා වෙලා උන් වයසට යනෙන තැන
තමා විපරිණාමය නැත සුවය දෙන

එරෙහිව තම සිතට පරිණාමය වීම
නොහැකිව නවත ගන්නට සිත දුක කීම
තව දීව ගිය ද මරණයටම යට වීම
එය ලොව විපරිණාමෙකි හැම තැන දීම

කැමති ලෙස යමක් පරිණාමය වේ ද
නැමෙති වැළඳ ගන්නට කරමින හාද
නොමැති විටදී රිසි ලෙස සිදු වෙද බාධ
විමති වෙවී වැළපෙයි දහවල රෑ ද

රිසි ලෙස නොමැති වෙනසක් නම් දුකක් දෙති
නිසි නැත විපරිණාමය යැයි දෙයක් ඇති
ඇසි පිය ලන විටත් පරිණාමයක් වෙති
කිසි විට කැමති පරිණාමය දුකක් නැති

බැරි විට විපරිණාමය යැයි කියන සත
හරි ගිය විටදී පරිණාමය කියනු ඇත
පරිණාමය නොවන කිසිවක් ලොවෙහි නැත
මැරි මැරි යනෙන සසරෙහි සොබ දැකිය යුත

වදන්වල ඇලී නොම කිවි අරුත දැනා
සදන් නිවෙන මග මතු දුක් නොදෙන තැනා
බඳන් හිටපු ලොව රිසි ලෙස නොමැති වෙනා
නොදන්න විට නිසි තතු තව දුකම දෙනා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

11 වන කොටස

දැනට කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුපියාණන් වහන්සේ ලොව වැඩ හිටපු කාලයේ සුනන්ද කියන තවුසෙකුට දින හතක් මුළුල්ලේ කරපු මල් පූජෝපහාරයකින් ලැබෙන ආනිසංස පිළිබඳව දේශනා කරපු මොහොතක් ගැන මේ කියන්නෙ. උන්වහන්සේ ඒ මොහොතෙම මේ තවුස්තුමාට ගෞතම බුද්ධ සාසනයෙදි ලැබෙන නිවන ගැනත්, නම් ගොත් ගැනත් (ඒ කාලෙට අහවල් නමින්, අහවල් අය මවුපියන් වෙලා... ආදී වශයෙන්) විවරණය කළා. ඉතින් මේ සිද්ධිය දැකපු තවත් කෙනෙක් හිටියා. එතන හිටපු බොහෝ උදවිය, සුනන්ද නමැති තවුසා බුදුන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලාට පූජෝපහාර කරල තමන්ගෙ ගතිය පිරිසිදු කළැයි කියල ඒ තවුස්තුමාට වැඳල ගෞරව පුද කළා.



දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, මොකක්ද මේ ගතිය පිරිසිදු කරනවා කියන්නෙ කියල. ඒ වගේම බුදුන්, දහම්, සඟුන් කෙරෙහි පැහැදිලා කරන පූජෝපහාරවලින් ගතිය පිරිසිදු වෙන්නෙ කොහොමද කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. කෙනෙක් ඇළුම් කරන දෙයක් සිද්ධ කළාම හෝ ඇළුම් කරන තැනකට ගියාම කියන වචන මාලාවක් තමයි, එතන මාර ගතියක් තිබුණා... පුදුම ගතියක් දැනුනා... ආදී වශයෙන් කියන්නෙ. දැන් ටිකක් පැහැදිලි වෙනව මොකක්ද මේ ගතිය කියල. ඒ කියන්නෙ තමන් ඉන්න තත්වයෙන් වෙනස් තත්වයකට පත් වුණා.

එතකොට මනුස්සයින්ට ප්‍රධාන ගති 5 යි තියෙන්නෙ. ඒකෙන් දේව, මනුස්ස කියන්නෙ සුගති දෙක. ප්‍රේත, තිරිසන්, නිරය කියන්නෙ දුගති 3. මේ ගතිය හැම තිස්සෙම මානසිකව එන දෙයක්. කායිකත්වයේ ඇති වන වෙනස්වීම් ඒ ගතියට උපනිශ්‍රය වෙනවා. ඉන්ද්‍රිය 6 න් ගන්න අරමුණු මුල් වෙලා තමයි ගතිය වෙනස් වෙන්නෙ. ඒ අරමුණු යෝනිසෝ මනසිකාරයෙන් සිහි කළොත් ගතිය සුගති වෙනවා. අයෝනිසෝ මනසිකාරයෙන් සිහි කළොත් ගතිය දුගති වෙනවා. එතකොට ආර්යන්ට ගති නියතයි. මොකද ඒ අයට සතර අපාගත වෙන මට්ටමේ ගති, අනුශයත් එක්කම බිඳිල තියෙන නිසා යෝනිසෝ මනසිකාරය පිහිටනවා. ඒ නිසා ප්‍රඥාවෙන් මෙනෙහි කරනවා. එතකොට සත්‍යය තමයි එන්නෙ. අයෝනිසෝ මනසිකාරය තියෙන පෘතජ්ජන උදවිය අවිද්‍යාවෙන් හෙවත් මුලා සහගත මනසකින් තමයි සිහි කරන්නෙ. එතකොට සත්‍යය වැටහෙන්නෙ නෑ. මෙතනදි ගතිය වෙනස් වෙන්නෙ ඒ අනුව තමයි.

මේ ගතිය එන්නෙ මානසිකව. උදාහරණ විදියට සිසිල් සුළඟක් හෝ සුව පහසු පුටුවක ඉඳ ගන්න ලැබීම, ඉතාම උෂ්ණ වෙලාවක සිසිල් බීමක් ලැබීම වගේ සිද්ධියකදි කයට දැනෙන සුව පහසුවෙන් කොයි ආකාරයෙන් හෝ ඇති වන්නා වූ මානසිකත්වයට කියනව ගතිය කියල. ඒ මොහොතෙ ඉඳන් පුද්ගලයා ක්‍රියාත්මක වෙන්නෙ ප්‍රබෝධයෙන්, ඒ ගතියෙන් ලැබුන ශක්තියෙන්. කොටින්ම කියනව නම්, යම්කිසි සිද්ධියක් නිසා අපේ ගත, සිත වෙනස් වීම එහෙම නැත්නම් ඇස, කන, දිව, නාසය, ශරීරය, මන ඒ අනුව සකස්වීම හෙවත් ආයතන වීම සිද්ධ වෙන්නෙ ගතිය අනුව.

හැබැයි මෙතනදි එකම භෞතික ස්වභාවයක් තුල ඇති වන ගතිය පුද්ගලයා අනුවත් වෙනස් වෙනවා. උදාහරණ විදියට නිස්කලංක පරිසරයක සිසිල් සුළඟක් එන කොට කෙනෙකුට හිතෙන්න පුළුවන්, කාන්තාවක් සමග කම්සුව විඳින්න පුළුවන් හොඳ නිහඬ තැනක්, කාටවත් පේන්නෙත් නෑ... ආදී වශයෙන්. ඒ තමයි අවිද්‍යාවෙන්, අයෝනිසෝ මනසිකාරයෙන් අරමුණු සිහි කිරීම. ඒක දුගතියට හේතු වෙන්නෙ. ඒ වගේම තවත් කෙනෙක් හිතන්න පුළුවන්, භාවනා කරන්න නම් මෙතන කියාපු නිස්කලංක තැන, කවුරුවත් නැති නිසා දහැන් වඩන්න හරිම නිදහස් හුදෙකලා තැනක් ... ආදී වශයෙන්. ඒ තමයි යෝනිසෝ මනසිකාරයෙන් සිහි කිරීම. ඒක සුගතියට හේතු වෙනවා. එතකොට එකම භෞතික පරිසරයෙ තියෙන එකම ලක්ෂණ අනුව දෙන්නෙක් දෙවිදියකට හිතනවා. ඒකෙන් ගති 2 ක් පහළ වෙනවා.

එතකොට අපි හිතන, කියන, කරන දේවල් වෙන්නෙ ඒ ගතියට අනුව. ටිකක් ගැඹුරෙන් හිතනව නම් ඇස, කන, දිව, නාසය, ශරීරය, මන ආයතන වන නිසා ඒ ආයතන ප්‍රත්‍යයෙන් ගොඩනගන ස්පර්ශත් ඒ ගතියට සමානයි. ඒ ස්පර්ශයෙන් ගොඩනගන වේදනා හෙවත් දැනීමත් ඒ ගතිය තුල තියෙනවා. ඒ වේදනා තුලින් අපේ හිතට එන ඇලීම හෙවත් තණ්හාවත් ඒ ගතිය තුල තියෙනවා. ඒ තණ්හාවෙන් ගොඩනගන උපාදානය හෙවත් ඒ තුලම බැඳී හිටීමත් ඒ ☞

ගතියෙන්මයි එන්නෙ. ඒ උපාදානයෙන් ශක්තියක් ගොඩ නගනවා. ඒ ශක්තියට කියනවා භවය කියල. මේ ශක්තියෙන් අවසානයේ ගොඩ නගල දෙන්නෙත් අර මුලින් තිබ්බ්ච ගතියෙම ජාතියක්.

එතකොට වැඩේ පටන් ගත්තෙ බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝයාට පූජෝපහාර කරල ලබා ගත්තු මහා පුණ්‍ය කුසල වාසනාවකින්. ඒකෙන් ලැබෙන ගතිය අනුව ගොඩ නගන ජාති තමයි බුදුන් වහන්සේ නමකගෙ අනාවරණ ඥානයට පෙනිල විවරණ දෙන්නෙ. මෙච්චර වාර ගණනක් දෙව් වෙනවා, මෙච්චර වාර ගණනක් සක්විති රජ වෙනවා... ආදී වශයෙන් කියන්නෙ, මේ ගොඩනගන භව ශක්තියෙන් එන ජාතින් 100% ක්ම දැකල. මේ ශක්තිය ඉතා බලවත්. ඒක වෙනස් කරන්න පුළුවන් සමතෙක් නෑ. ඒක බුදු ඇසට පෙනිල තමයි උන් වහන්සේ හරියටම කියන්නෙ, මතු කල්පයක මේ නමින් මේ බුද්ධ සාසනයේ මේ තනතුර ලබනවා, මේ විදියට නිවන් දකිනවා... ආදී වශයෙන්. ඉතින් ඔය ගතිය තමයි අපේ මතු ජාතියත් තීරණය කරන්නෙ.

මේ ජාතිය ඊළඟ මොහොතෙ වෙන්නත් පුළුවන්. කොටින්ම ඊළඟ තත්පරේ වෙන්නත් පුළුවන්. මනුස්සයෙක් වෙලා ඉඳෙද්දිම බේබදු ජාතිය, බලු ජාතිය, උපාසක ජාතිය, මිනීමරු ජාතිය ... ආදී වශයෙන් මේ හැම එකක්ම අපි ඒ ඒ මොහොතෙ කරන කියන හිතන දේවල් අනුව ගතිය වෙනස් වෙලා ගොඩ නැගිච්ච ජාති. ඒ නිසා තමයි ඒ කාලෙ කෙනෙක් මළාම බුදුන් වහන්සේ ළඟට ඇවිත් මිනිස්සු අහන්නෙ, ස්වාමීනි අහවල් කෙනා මළා, එයා අපේ නෑදෑයෙක්, එයාගෙ ගතිය මොකක්ද, උප්පත්තිය මොකක්ද (ජාතිය) ආදී වශයෙන්. ඉතින් උන් වහන්සේ ඒ ඒ අය උප්පත්ති ගත්ත තැන් කියනවා, පෙන්වනවා. ඊළඟට හැම තිස්සෙම මිනිස්සු මේ වගේ දේවල් අහන්න එන්න ගත්ත නිසා, මේක තථාගතයන් වහන්සේට වෙහෙසක් වුණා. ඒ නිසා මම ක්‍රමය කියල දෙන්නම් නුඹලාම බලාගන්න කියල, උන් වහන්සේ පටිච්ච සමුප්පාද ක්‍රමයෙන් මාර්ගයක් ලෝකෙට දේශනා කළා. ඒ ඒ සංඛාරවලින් ගතිය හැදෙන හැටි, ඒ ගතියෙන් ජාතිය ගොඩනැගෙන හැටි, ඒ ඒ මොහොතෙ ජාති, ගති පහළ වෙන හැටි, ඒ ගති නිරෝධ කළාම ඒ ජාතිය නිරෝධ වෙන හැටි ආදී වශයෙන් ලෝකෙට පෙන්වල දුන්නා.

ඉතින් මේ සුනන්ද කියන තවුස් තුමාට මිනිස්සු ගෞරව කළා. ඒ කාරණය, ගෞතම බුද්ධ සාසනයේ විනයට අග්‍ර වෙච්ච උපාලි තෙරුන් වහන්සේ ඒ කාලෙ හිටපු සිටු අත්බැවේදි දැක්කා. උන් වහන්සේ ඒ කාලෙ මහත් ධනය තිබ්බ්ච සිටුවරයෙක්. එතකොට මේ සිටුවරයා උපමාවක් කියනවා, මහ සයුර කළඹන්න පුළුවන් ඒත් ඒ වෙනකොට මගේ ළඟ තියෙන ධනය කලඹන්න බෑ කියල. ඒ තරම් විශාල ධනස්කන්ධයක්. දැන් කල්පනා කළා මම කරන්න ඕන පිංකම මොකක්ද කියල. ඔහොම කල්පනා කර කර ඉන්න කොට, පාධීක කියන රහත් උතුමෙකුට පදුමුත්තර බුදු පියාණන් වහන්සේ විසින් විනයට අග්‍ර තනතුර පිරිනමනව දැක්කා. ඉතින් ඒ චිත්ත ප්‍රසාදයෙන් මමත් බුදුන් කෙරෙහි, සඟුන් කෙරෙහි මගේ ධනය වියදම් කරල, දන් දීල ඒ තනතුර පතනවා කියන සිතිවිල්ලෙන් තමන් සතුව තිබ්බ්ච මනරම් උයනක් ඒ කාලෙ තිබු මුදල්වලින් ලක්ෂයකට විකුණල සංඝාරාමයක් කළා. ඊට පස්සෙ ඒක බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කළා. ඉතින් පදුමුත්තර බුදුන් වහන්සේ, ඒ පූජාවෙන් සසර පුරා එන ලැබීම් ගැන විස්තර කරල ඔහුට ඒ තනතුර ලැබෙන බවටත් සහතික කරල නියත විවරණ දුන්නා.

නමුත් ඒ අප්‍රමාණ ලැබීම එක්ක එන සසර ගමනෙදි ඇති වෙච්ච අතපසු වීමක් නිසා අවසාන අත්බැවේ ලෝක සම්මත සමාජ කුලයෙන් අඩු, අනෙක් අයගේ හිස කෙස්, රැවුල් බාල ජීවත් වෙන කුලයක උප්පත්තිය ලැබුවා. මේකට හේතුව තමයි එක අත්බැවක එතුමා සක්විති රජ කෙනෙකුගෙ පුතෙක් වෙලා, තාන්නෙන් මාන්නෙන් මත් වෙලා වාසය කිරීම. ඉතින් ඔහු දවසක් ඇතෙක් පිට නැගිල පසේ බුදුවරයන් වහන්සේ නමකට කිසිම ගෞරවයක් නොකර, උන් වහන්සේ යන මග අවුරා ගෙන හිටියා. නමුත් පසේ බුදුවරයන් වහන්සේ කිසිම කම්පාවක් නැතිව ඒ ගමන වැඩියා. ඔහුත් කමා කරවීමක් නොකරම මාන්නෙන් යන්න ගියා. ඒ කරපු පාපය හේතුවෙන් ඒ මොහොතෙම ඔහුගේ හිතත් ගතත් දැවෙන්න පටන් ගත්තා. හිස ගිනි ගන්නවා වගේ දැනුනා. මේක දරාගන්න බැරි තැන තමන්ගෙ පියා වන සක්විති රජතුමාට කිව්වා. එතුමා මේ කරපු පාපයේ බරපතලකම දැනගෙන හිටියා. වහාම උන් වහන්සේ වැඳ නමස්කාර කොට කමා කරගන්න කියල අවවාද කළා. නැත්නම් හත් දිනක් ඇතුලත මුළු සක්විති රාජ්‍යයම විනාශ වෙන බවට අනතුරු ඇඟෙව්වා. සසර පුරුද්ද නිසාත්, කලින් බුදුන් වහන්සේ ඇතුළු සඟුන් පුදා ඇති පුරුද්ද නිසාත් වහාම ගිහින් සමාව ගත්තා. පසේ බුදුවරයන් වහන්සේ ඒ කුමාරයාට අනුශාසනා කරල කමා කළා. එහෙම කමා කළත් තමන්ට වඩා උසස් ආර්ය ජාතියේ හිටපු උත්තමයෙකුට පෘථජ්ජන කියන පහත් ජාතියේ ඉඳගෙන අවමන් කරපු නිසා, මාන්නයෙන් උද්දාම වුන නිසා, අවසන් අත්බැවේ විපාක විදිහට ලෝක සම්මතයේ පහත් කුලයක උප්පත්තිය ලැබුවා. අනෙක් අයගෙ වැඩපළ කරල දීල ඒකෙන් ජීවත් වෙන තත්වෙට පත්වුනා. ඉතින් අර පුත් කුමාරයා තමයි මෙකල උපාලි තෙරුන් වහන්සේ.

ඒ වගේම මේ උපාලි තෙරුන් වහන්සේගෙ පැවිදි වීමත් ඉතා විශේෂ සිද්ධියක්. භද්දියශාක්‍ය, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත කියන ශාක්‍ය කුමාරවරු බුදුන් වහන්සේ ළඟ පැවිදි වෙන්න යන වෙලාවෙ ආභරණ ටික බාර දෙන්න එක්ක ගියේ උපාලි කියන කරණවැමියා (පොත පතේ උපාලි කපු මහත්තයා කියලත් සඳහන් වෙනවා). ඉතින් මේ ශාක්‍ය කුමාරවරු ආභරණ ටික ගලවල උපාලි අතට දීල කිව්වා, මේ ටික ඔබට ජීවත් වෙන්න ඇති, ඔබ දැන් යන්න අපි මහණ වෙනව කියල. උපාලි අඩමින් කැලය දිගේ මේ ආභරණ ටික අරගෙන යද්දි මෙහෙම සිතිවිල්ලක් පහළ වුනා. ''මේ කුමාරවරු මට ආභරණ ටික ගන්න කියල දුන්න තමයි, ඒත් ශාක්‍යයෝ කියන එවුන් හිතක් පපුවක් නැති එවුන්, උන් මේක විශ්වාස කරන එකක් නෑ, මම මේ කුමාරවරු මරල ආභරණ ටික ගත්ත කියල හිතුවොත් මටත් මැරෙන්නයි වෙන්නෙ.'' මෙහෙම හිතල ආපසු හැරිල ගිහින්, මටත් පැවිදි වෙන්න ඕන කියල පැවිද්ද ඉල්ලා සිටියා.

මෙතනදී මේ කර්මය කියන එකත් හරි පුදුම දෙයක්. ඒක බුදුවරයන් වහන්සේ නමකට හැරෙන්න වෙන කෙනෙකුට ලේසියෙන්, ඒ වගේම 100% ක් තේරුම් ගන්න බැරි විෂයක්. කර්ම විෂය අචින්ත්‍යයි කියල උන් වහන්සේ දේශනා කළෙත් ඒ නිසා. උපාලි ගියේ පැවිදි වෙන්න නෙවෙයි, නමුත් හොඳට හෝ නරකට පැවිදි වෙන්න ඕන කියල සිතිවිල්ලක් ආවා. එහෙම නැතිව සසර කලකිරිල, කවුරු හෝ මැරිල, එහෙමත් නැත්නම් තමන්ට මහත් දුකක් කරදරයක් වෙලත් නෙවෙයි මේ එක පාරටම පැවිදි වෙන්න හිතුණෙ. ඒ වගේම පෙර සසර කරපු පැතුමක් මතක් වෙලත් නෙවෙයි. ඒත් කර්මය විසින් ඒ ඒ පුද්ගලයො ඒ ඒ අවශ්‍ය තැන්වලට තල්ලු කරල දානවා. උපාලිටත් වුනේ ඒ වගේ සිද්ධියක්. ඉතින් බුදුන් වහන්සේත් මේ අවස්ථාවෙ පැවිදි

☞

කිරීම සම්බන්ධයෙන් ලෝකයාට ඉතා වටිනා ආදර්ශයක් දුන්නා. ඒ අනුව මුලින්ම මහණ කළේ උපාලි කියන ලෝක සම්මත අඩු කුලේ තැනැත්තා. ඊට පස්සෙ අර ශාක්‍ය කුමාරවරුන්ට කියල උපාලි තෙරුණ් වහන්සේට වැන්දෙව්වා.

මොකද උපාලි විනයට අග්‍ර වුනොත් කුල ප්‍රශ්නය නිසා, අඩු කුලයෙ කෙනෙක් විනය ගැන කියන අවවාද ශාක්‍ය කුලයෙ අය පිළිගන්නෙ නෑ. අඩු කුලේ අය අපිට අවවාද දෙන්න එනවද කියන මාන්නය ශාක්‍යයන් ළඟ තියෙන ගති ලක්ෂණයක්. නමුත් මාන්නය දුරු වෙන්නත් ඕන, යථාර්ථය දකින්නත් ඕන. මේ දෙකම සිද්ධ වෙන්න ඕන. ඒ නිසා තමයි බුදුන් වහන්සේ මේ ක්‍රමය අනුගමනය කළේ. මොකද ඉස්සෙල්ල මහණ කරපු කෙනා මොහොතකින් හරි වැඩිමහල්. වැඩිමහල් කෙනාට බාල කෙනා වැඳීම, වැඩිමහල් කෙනෙක් බාල කෙනෙකුට උපදෙස් දීම ගැටළුවක් නෙවෙයි. ඒ කාලෙ වැඩිමහල් බව මනින්නෙ පැවිදි වෙච්ච මොහොතෙ පටන්. එතැන් පටන් තමයි වස් ගනින්නෙ. ඒ කියන්නෙ අද වගේ නෙවෙයි, ඒ කාලෙ පැවිදි වෙච්ච මොහොතෙම උපසම්පදාවත් ලැබෙනවා. අද වගේ සාමණේර කියල වෙනම කාලයක් තිබුණෙ නෑ. ඒ නිසා උපාලි ඉස්සෙල්ල මහණ කරල, ශාක්‍ය කුමාරවරු පස්සෙ මහණ කළාම, උපාලි මොහොතකින් හරි වැඩිමහල් වෙනවා. ඒ කාරණය බුදුන් වහන්සේ තුන් කල් නුවණින් දැකල තමයි මෙහෙම දෙයක් කළේ.

දැන් අර කලින් සඳහන් කරපු පසේ බුදුවරයන් වහන්සේගෙ සිද්ධියත් වැටහෙන්න ඕන. බුද්ධ සාසනයේ පැවිද්ද හෙවත් සංඝ ජාතිය (ආර්ය ජාතිය) ලෝකයේ තියෙන අනෙක් සම්මත කුල සියල්ලටම වඩා අග්‍රයි. ලෝක සම්මතයෙ මොන කුලේ හිටියත්, මොන තානාන්තර දැරුවත් සංඝ කියන ගුණය ඉක්මවන්න බෑ. සක්විති රජ කිව්වත් සඟ ගුණයත් එක්ක අබ ඇටයක් තරම්වත් ප්‍රමාණ කරන්න බෑ. මේ ආදර්ශය ලොව්තුරා බුදු පියාණන් වහන්සේ ලෝකෙට දුන්නා. ඒ වගේම උන් වහන්සේගෙ මහා කරුණා ගුණයත් පෙන්නුවා. අහවලා ලොකුයි, අහවලා පොඩියි, මේ මගේ කුලය, මේ පහත් කුලය, මේ ඉහල කුලය කියල වෙනසක් උන් වහන්සේට නෑ. ලෝක සත්වයා කුල මල භේද නැතුව පොදුවේ විඳින අප්‍රමාණ දුකක් තියෙනවා කියල, ඒ දුක නිවන මාර්ගය සොයා ගෙන පෙන්වා දුන්නා. ඒ දුක කරණවැමියාටත් එකයි, ශාක්‍ය කුමාරයන්ටත් එකයි, සක්විති රජුටත් එකයි, දෙවියන්ටත් එකයි, බ්‍රහ්මයාටත් එකයි. ඒ දුකට හේතුවත් එකයි, ඒ දුක් නැති කර ගැනීමේ මාර්ගයත් එකයි, ඒ මාර්ගය අනුගමනය කරමින් දුක නිවාගන්න හැටිත් එකයි. ඒ නිසා උන් වහන්සේ ළඟට විසඳුමක් හොයා ගෙන එන හැම කෙනාම එක පොදු ජාතියකට ගෙනාවා. ඒ තමයි ආර්ය සංඝ කියන ජාතිය. උන් වහන්සේ බුදු වෙන්න යන වෙලාවෙ නිමිත්තක් හැටියට එක එක දිසාවෙන් එන එක එක පාට කුරුල්ලො එකම පාටක් අරගෙන තමන් වහන්සේගෙ දෙපා මුල වැටෙන හැටි දැක්කා. මොන ලෝක සම්මත කුලයෙන් ආවත් උන් වහන්සේගෙ සංඝ කියන ජාතියට පත් වෙනවා කියන කාරණය තමයි ඒකෙන් පෙන්නුම් කළේ.

උපාලි තෙරුන් වහන්සේගෙ වචනවලින්ම බුදු පියාණන් වහන්සේ ගැන කියනව නම්,

බුදුරජාණන් වහන්සේ, වධක වූ දේවදත්තයා ය, චෞර වූ අංගුලිමාලයා ය, මත් වී ඉදිරියට ආ ධනපාල හස්තියා ය, ඖරස පුත්‍ර වූ රාහුල තෙර ය යන මේ සියළු දෙනා හට සම මෙත් ඇති සේක. මොවුන් කෙරෙහි පටිඝයක් (තරහක්) නැත. එසේම මොවුන් පිළිබඳ රාගයක් (ඇලීමක්) ද නැති සර්වඥතෙමේ, තමන් මැරීමට ආ වධකයාට ද තමන්ගේම ඖරස පුත්‍රයාටද සම මෙත් ඇත්තේය. (අපදාන පාලිය 1)

ඊළඟට උපාලි තෙරුන් වහන්සේ පැවිදි වෙලා නොබෝ කලකින් අරිහත් ඵලයට පත් වුනා. විනයධර තෙරුන් වහන්සේලා අතරින් අග්‍ර තනතුර ලැබුවා.

ඒ වගේම ඉහතින් ධනපාල හස්තියා කියල සඳහන් වෙන්නෙත් නාලාගිරි හස්ති රාජයාමයි. නාලාගිරි ඇතාට රා පොවල, මත් කරල බුදුන් වහන්සේ ඉදිරියට එව්වත්, උන් වහන්සේ ඉදිරියේ ඇතාගෙ ඔද තෙද සියල්ලම බිඳිල, ඒ විගසම බිම දණ ගහල, හිස නමාගත්ත ගමන් නැගිටින්නෙ නැතිව එහෙම්ම හිටියා. ඒ ප්‍රාතිහාර්ය දැකල අවට බලන් හිටපු මිනිස්සු තමන්ගෙ ඉහේ කනේ තිබ්බ රන් රිදී ආභරණ සියල්ලම ගලවල මේ ඇතාගෙ ඇඟට දැම්මා. අන්තිමට ඒ ආභරණවලින්ම ඇතා වැහුණා. ඉතින් ඒ ලැබිච්ච රන් රිදී ආදී සියලු ධනය ඇතා වෙනුවෙන් හිමි වෙච්ච නිසා, ධනය ඇති අර්ථයෙන් ධනපාල ඇතා කියල නම වැටුණා.

ඒ වගේම මෙතනදි කාටත් එක හා සමානව සැලකීම බුද්ධ සාසනය තුළ ඇති විශේෂ ලක්ෂණයක්. නමුත් ඒ කාරණය සම මෙතත් එක්ක පටලවා නොගත යුතුයි. (සම මෙත ගැන නිවැරදි විග්‍රහයක් හෙළ බොදු පියුම 2 වන කලාපයෙන් ඉදිරිපත් කර ඇත) සෝවාන්, සකෘදගාමී ආදී මගඵල පහළ කුලේ අයට අඩුවෙන් ලැබෙන්නෙ, ඉහළ කුලවල අයට වැඩියෙන් ඉක්මනට ලැබෙන්නෙ කියල එහෙම දෙයක් නෑ. කුලේ මොකක් වුනත් ඒ ඒ මගඵලවලට හිමි මානසික ස්වභාවය එකයි. ඒක බුද්ධ සාසනය තුල තියෙන ආශ්චර්යමත් ධර්මතාවයක්. ඒ බව මැනවින් අංගුත්තර නිකායේ 5 වන කාණ්ඩයේ එන <u>පහාරාද සූත්‍රයේ</u> විග්‍රහ කරල තියෙනවා.

පහාරාදය, යම් පරිදි යම් කිසි මහා නදීහු වෙද්ද, එනම් ගංගාය, යමුනාය, අචිරවතී ය, සරභූ ය, මහී ය යන මොවුහුයි. මොවුහු මහ මුහුදට පැමිණ පළමු නම් ගොත් හරිත් ද, මහ මුහුදැයි කියාම සංඛ්‍යාවට යෙත්ද, පහාරාදය, එපරිදි ම ක්ෂත්‍රියහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශූද්‍රයහයි මේ චතුර් වර්ණයෝ වෙත් නම් ඔහු තථාගත ප්‍රව්දිත වූ ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය බවට පැමිණ පළමු නම් ගොත් හැරලත්, ශ්‍රමණ ශාක්‍ය පුත්‍රීයහ යන සංඛ්‍යාවට ම යෙත්. පහාරාදය, යම් හෙයකින් ක්ෂත්‍රියහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශූද්‍රයහයි මේ චතුර් වර්ණයෝ වෙත් නම් ඔහු තථාගත ප්‍රව්දිත ධර්ම විනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය භාවයට පැමිණ පළමු නම් ගොත් හැරලත් ද, ශ්‍රමණ ශාක්‍ය පුත්‍රීයහ යි කියා ම සංඛ්‍යාවට යෙත්ද, පහාරාදය, භික්ෂූහු යම් ආශ්චර්යක් පුනපුනා දැක මේ ධර්ම විනයෙහි අභිරමණය කෙරෙත් නම් මේ ධර්ම විනයෙහි මේ සිවුවන ආශ්චර්ය අද්භූත ධර්මයයි.

ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී කියන මේ ගංගා ගලාගෙන ගිහින් මුහුදට වැටුණාට පස්සෙ ඒ සියල්ලටම මුහුද කියනව මිසක් දැන් ඒවට කලින් නම් භාවිතා කරන්නෙ නෑ. ඒ වගේ රජ, බමුණු, ගොවි, වෙළඳ ආදී මේ කවුරුත් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර කියන මේ මොන කුලයෙන් ඇවිත් පැවිදි වෙලා මග ඵල ලැබුවත් ඒ සියල්ලෝම සංඝ කියන කොටසට වැටෙනවා. එතකොට ඒ මුහුදයි, මේ මුහුදයි උපමා කරල පෙන්වනවා. ඒ කියන්නෙ ජල මුහුද සහ දහම් මුහුද.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග අපදාන පාලිය 1 - උපාලිස්ථවිරවදානය ඇසුරින් සකස් කළේ:*

**රිෆ්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**


# ජයමංගල ගාථා
# අරුත්බර දහම් ඇසින්....

බොහෝ උත්සව අවස්ථාවලදී, විශේෂයෙන් විවාහ උත්සවවලදී මුලින්ම ගායනා කරන එක්තරා ආකාරයක ආශිර්වාදාත්මක ගාථා පන්තියක් තමයි ජයමංගල ගාථා කියන්නෙ. විශේෂයෙන් එහි එන සෑම ගාථාවක් අවසානයේම, මේ හේතුවෙන් ජය මංගල්ලයක්ම වේවා කියල සෙත් පැතීමක් කරනවා. දැනට බොහෝ දෙනෙක් මේ ජයමංගල ගාථා සජ්ජායනය සම්ප්‍රදායක් විදියට කරගෙන ආවත්, මේකට මුල් වෙච්ච හේතු කාරණා දැනගෙන නැති බව බැලු බැල්මට පෙනී යනවා. ඒක හරියට උදැල්ලට වැඳල ගොවිතැන් කරන්න යන ගොවි මහත්තයෙක් වගේ. ඒ කියන්නෙ මුලින් තුනුරුවන් ගුණ සිහි කරල වැඳල වැඩ පටන් ගත්තු ගොවි මහත්තයෙක් දිහා, පිටින් බලපු කෙනෙක් ගත්ත තීරණයක් අනුව කරගෙන යන වැඩපිළිවෙලක් වගේ. එතකොට පිටින් දකින කෙනා දකින්නෙ, උදැල්ලට වැන්දා මහ පොළොවට වැන්දා වගේ දෙයක්. හැබැයි එහෙම කරන අයට හරියනවත් දැකල තියෙනවා.

ඒ නිසා අර මුලින් එහෙම කරපු කෙනා ඇයි එහෙම කළේ කියල අහන්නෙත් නැතුව, මමත් ඒකම කරන්න ඕන කියල තමන් බැස ගත්ත තීරණයකට අනුව මතු පිටින් ඒ වැඩේම කරගෙන යනවා. අද ජයමංගල ගාථාවලටත් වෙලා තියෙන්නෙ මේ වගේ දෙයක්. ඒ කියන්නෙ ඔහේ කියන්නන් වාලෙ කියාගෙන යනවා. ජයමංගල ගාථා පුරුද්දක් වශයෙන් කියනව මිසක්, ඇයි එහෙම කියන්නෙ, මොකක්ද හේතුව, ඒකෙන් මංගල්ලයක් වෙන්නෙ කොහොමද කියල බොහෝ අය දන්නෙ නෑ. කනට මිහිරි නිසා අහන අයත් ඔහේ අහගෙන ඉන්නවා. ඉතින් කරුණු කාරණා ඤාණ සම්ප්‍රයුක්තව හරියටම දන්නව නම්, මහා සෙතක් ශාන්තියක් කරගන්න පුළුවන් ගාථා මාලාවක් තමයි මේ තියෙන්නෙ. හරියට රතන සූත්‍රයේ එන විස්තර වගේ. ආර්ය ගුණ කියල ඒ ගුණයෙන් සෙතක්ම වේවා කියල තමයි රතන සූත්‍රයෙන් සරලව කියන්නෙ. ඉතින් ජයමංගල ගාථා එකින් එක නුවණින් විමසල බැලුවොත් මහා සත්‍ය ක්‍රියාවක් ගැබ් වෙච්ච ගාථා පෙළක් කියල වැටහෙන්න ඕන.

**බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං**
**ගිරිමේඛලං උදිතඝෝර සසේනමාරං**
**දානාදිධම්මවිධිනා ජිතවා මුනින්දෝ**
**තං තේජසා භවතු තේ ජයමංගලානි**

දහසක් අත්වලින් දහසක් සැත්, දුනු මුගුරු වගේ විවිධ ආයුධ දරාගෙන, ගිරිමේඛලා නම් දරුණු ඇත් රාජයා පිට එන මාරයා සහ ඒ මාර සේනාව, භාග්‍යවතුන් වහන්සේ විසින් දානාදි පාරමිතාවන් අඩුවක් නැතිව සසර පුරා කරගෙන ආ ශක්තියෙන් පරාජය කළා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා, සෙතක්ම වේවා.



පළමු ගාථාවෙන් එන සරල අදහස තමයි ඒ. ඉතින් උන්වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට වඩා දන් දුන් බලය තමයි එතනදි නැගිල ආවෙ. උන්වහන්සේගෙ මුඛ්‍ය අරමුණ වුනේ, මමත් මේ දුකින් එතෙර වෙලා ලෝකයාත් මුදවනව කියල. ඉතින් මේ දුකින් එතෙර වෙන්න විවිධ පර්යේෂණ කළා. ඒ පර්යේෂණ කරපු කාලය කෙනෙකුට හිතාගන්නවත් බැරි අප්‍රමාණ කාලයක්. අපේ මනසට අවුරුදු 10 ක් 100 ක් 1,000 ක් හිතාගන්න පුළුවන්. නමුත් අවුරුදු 100,000 ක් හෝ ඊටත් එහා කාලයක් හිතාගන්න මනස හසුරුවන්න හැකියාවක් නෑ. ඒක ගෝචර වෙන්නෙ නෑ. එතකොට කල්පයක් කියන දිගු කාලයක් තෝරගන්න සාමාන්‍ය කෙනෙක්ගෙ මනස කොහොමත් ප්‍රබල මදි. බුදුන් වහන්සේ දුන්නු උපමාවකින්ම තමයි ඒ කාරණය තෝර ගන්න වෙන්නෙ. ගිජ්ජකූට පර්වතය වගේ අති විශාල ගල් පර්වතයක් අවුරුදු 100 කට සැරයක් සිනිඳු සළුවකින් එක පාරක් පිරිමදිනවා. මේ පිරිමදින කොට ඒ මහා ගල් පර්වතයෙන් යම් කිසි කොටසක් ක්ෂය වෙලා යනවා. මේ මහා ගල් පර්වතය අංශු මාත්‍රයක්වත් ඉතුරු නොවී ඒ විදියට ක්ෂය වෙන්න යම් කාලයක් ගත වෙනවද, ඊටත් වඩා කල්පය දිගයි කියල තමයි ඒ උපමාව අනුව කියන්නෙ. ඉතින් මේ වගේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකටත් වැඩි කාලයක් දීපු දානයේ බලය කිසිම කෙනෙකුට මැඩ පවත්වන්න බෑ. ඒ කාලය තුල සම්පූර්ණ කරපු එක පාරමිතාවක් තමයි දානය කියන්නෙ. ඒ දන් දුන්නු කාලය සහ ප්‍රමාණය වෙන කෙනෙකුට සම කරන්න බෑ. ඒ තරම් දීර්ඝ කාලයක් දන් දීමෙන් රැස් කරපු ශක්තිය, බලය කාට නම් කියන්න පුළුවන්ද? මෙතනදි දානය විශේෂ වුණා. ඊට අමතරව උන්වහන්සේ සීල, නෙක්ඛම්ම, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී හා උපේක්ෂා කියල තවත් පාරමිතා සම්පූර්ණ කළා.

ඒ වගේම ආමිස දානය, අභය දානය, ධර්ම දානය කියන මේ ප්‍රධාන දාන 3 ට දාන පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී වශයෙන් ගැනෙන සියල්ලමත්, කලින් සඳහන් කරපු දස පාරමිතා සියල්ලමත් අයිති වෙනවා. උදාහරණ විදියට අභය දානය කිව්වම ලෝක සත්වයින්ට දුක් කරදර නොදීම, මෙත් වැඩීම කියන කාරණාත් අහු වෙනවා. ඒ කියන්නෙ මෛත්‍රී පාරමිතාව. ඒ වගේම ධර්ම දානය කිව්වම නෙක්ඛම්ම පාරමිතාව ඇතුළු තවත් පාරමිතා අයිති වෙනවා. කෙටියෙන් කියනව නම් දානය කියන වචනය මුල් කරගත්තම සියලු පාරමිතා ඒකට ☞

ඇතුලත් වෙනවා. ඒ නිසා දස පාරමිතා කියන්නෙ දානයේම තවත් විග්‍රහයක්.

එහෙනම් දන් දෙන්නෙ ඇයි, ඒ බලය නැගුනෙ කොහොමද, දස මාර සේනාවම පරාජය කළේ කොහොමද කියන කාරණා දන් කෙනෙකුට පැන නගින්න පුළුවන්. අපදාන පාලියේ එන ලිපි පෙල කියවන පින්වතුන් දැනටමත් දන්නවා ඇති, බුද්ධාදී උතුමන්ට දින හතක් පමණක් දන් දීල ලබා ගත් ප්‍රතිඵල සහ ඉන් නැගිච්ච බලයෙන් සසර පුරා දුගතියක නොවැටී සුගති මාර්ගයකම ඇවිත් නිවන් පූර්ණ කරපු උදවිය ගැන. ඉතින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට වඩා දන් දුන් උත්තමයෙකුගෙ බලය ගැන කවර කතාද? අත් දාහක් නෙවෙයි, අත් කෝටියක් මවාගෙන ආවත් උන් වහන්සේට විරුද්ධව අතක් උස්සන්න ශක්තියක් එයිද? ඔය අත උස්සගෙන ආපු මාරයාටම කී පාරක් නම් උන් වහන්සේ පෙරුම් පුරන කාලයේ දන් දීල ඇත්ද? ඒ තේජස මෙච්චරයි කියල මනින්න පුළුවන්ද? බොහෝ පින්වතුන්ටත් දන් දීමේ අත්දැකීම් ඇති, හිතට නැගෙන චිත්ත ප්‍රසාදයේ අත්දැකීම් ඇති, ඒකෙන් ලැබෙන ප්‍රතිඵල ගැනත් අත්දැකීම් ඇති. ඒකෙන් නැගෙන තේජස හිතට අරගෙන මහ බෝධි සත්වයන් වහන්සේ අප්‍රමාණ කාලයක් පුරා දන් දුන් ශක්තිය, තේජස අනුමාන කරන්න පුළුවන්. කොච්චර තේජසක් ඒකෙන් නැගෙන්න ඇත්ද කියල ඒ අනුමානයෙන් හිතා ගන්න පුළුවන්. ඒ තේජසින් විහිදෙන ශක්ති ප්‍රමාණය සත්‍යයක්, මටත් අත්දැකීම් තියෙනවා, ඒක බොරුවක් නෙවෙයි, ඒ ශක්තියෙන් තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, හොඳක්ම වේවා කියල පැතුවොත්, ඒ පැතුම කොච්චර බලවත්ද කියල අමුතුවෙන් කියන්න ඕන නෑ. බුද්ධ දේශනාවට අනුව නම් ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා කියන 4 න් යුක්තව සැදැහැ සිතින් යම් පැතුමක් පතනවද, ඒක ඒකාන්තයෙන්ම ඉෂ්ඨ සිද්ධ වෙනවා.

**මාරාතිරේක මභියුජ්ජිත සබ්බරත්තිං**


**ඝෝරම්පනාලවක මක්ඛමථද්ධයක්ඛං**

**ඛන්තීසුදන්තවිධිනා ජිතවා මුනින්දෝ**


**තං තේජසා භවතු තේ ජයමංගලානි**

මුළු රැයක් පුරාම මාර සේනාවට පමණක් දෙවෙනි බලයක් තිබුණු ආලවක යක්ෂයාගෙන් නැගුන තර්ජන ගර්ජන හමුවේ, ඒ යක්ෂයා නැගූ ප්‍රශ්න හමුවේ නොසැලුන උන් වහන්සේගෙ සිල් ගුණය හා ඉවසීම නිසා ඒ යක්ෂයා දමනය කළා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි දෙවන ගාථාවෙ සරල තේරුම.

සීල පාරමිතාව කියන්නෙත් දස පාරමිතාවන්ගෙන් එකක්. ඒකත් ඉහත



කිව්ව ආකාරයටම සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට වඩා පුරපු පාරමිතාවල ප්‍රතිඵලයක්. ඒ කියන්නෙ සත්‍යාවබෝධය සඳහා අවශ්‍ය කරන ගුණ වැඩීමක් තමයි ඒ කාලය ඇතුලත සිද්ධ කළේ.



උන්වහන්සේට වඩා සිල්වතෙක් මේ තුන් ලෝකෙම හිටියෙ නෑ. ඉතින් සියලු කෙලෙසුන් නසා ලැබුණු සංවරත්වය නිසා නොසැලෙන, සිදුරු නැති, නොකැඩෙන අසම සම සීලයක් උන්වහන්සේ සතුව තිබුනා. ඒ වගේම පාරමිතා කාලය තුල දිවි පරදුවට තබා රැක්ක සීලයක ශක්තියත් තිබුනා. එක්තරා ජාතක කතාවක උන් වහන්සේ භූරිදත්ත කියන නාග රාජයෙක් වෙලා රැක්ක සීලයේ තරම ගැන සඳහන් වෙනවා. ඉතින් මේ සීල පාරමිතාව පූර්ණ කරල හිටිය උන් වහන්සේ අසම සම සීලයෙන් යුක්තයි.

එතකොට ආලවක යක්ෂයා ආවෙ, මගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නෙ නැත්නම්, මම ඕකගෙ පපුව පළල අර ගඟට විසි කරනවා කියන සිතිවිල්ලෙන්. ඒ නිසා එළියට බැහැපන් කිව්වම කිසිම සද්දයක් නැතුව උන් වහන්සේ බැහැල එළියට වැඩියා. ඊළඟට ඇතුලට පලයන් කිව්වම නැවතත් ඇතුලට වැඩියා. හැබැයි තුන් පාරයි එහෙම කළේ. මොකද **තථාගතයන් වහන්සේ නමකට එහෙම තුන් වතාවකට වඩා යමක් අණ කරල හෝ සැරෙන් කියන්න ගියොත් ඒ පුද්ගලයගෙ හිස හත් කඩකට පැලෙනවා. ඒක දරන්න බැරිව යනවා.** ඒ කාරණය උන් වහන්සේ දන්න නිසාම තමයි ආලවක ගැන අනුකම්පාවෙන් තුන් වතාවකට වඩා ඒක නොකළෙ. එහෙම අප්‍රමාණ පාරමිතා ශක්තියකින් අසම සම සිල් ගුණය සම්පූර්ණ කරල බුදු බව ලබා ගත් උත්තමයෙකුට අණ කරන්න පුළුවන් සමතෙක් මේ තුන් ලෝකෙම නෑ. නමුත් ලැබුණු අණ පරිදි එහෙම එළියට ගියේ අර ආලවකයට මුලින්ම ශ්‍රද්ධාවක් ඇති කළ යුතු නිසා. ඒ නිසා අඩු තරමෙ, උන්වහන්සේ මම කිව්ව දේ ඇහුවනේ කියන තැන ඉඳගෙන, මාත් උන්වහන්සේ කියන දේ පොඩ්ඩක් හරි අහල බලන්න ඕන කියන තැනට ආලවකගෙ මානසිකත්වය ආවා. ඊට පස්සෙ තමයි උන් වහන්සේගෙන් ප්‍රශ්න ඇහුවෙ. ඒ ලැබුන උත්තර අනුව ආලවක සෝවාන් වුණා.

ඉතින් සීලය උපමා කළේ මහ පොළවට. මහ පොළවට මිනිස්සු නොයෙක් දේවල් දානවා, කපනවා, කොටනවා, ජරාව දානවා, වස විස දානවා. නමුත් මහ පොළව ඒ දාපු දේවල් ගැන කිසිම කම්පිත බවක් නොගෙන, මොනව දැම්මත් නොසැලී ඒ දාපු දේ දිරවගෙන, ඒ දාපු අයටම ප්‍රයෝජනවත් වෙන දෙයක් එළියට දානවා. මේ සිද්ධියත් එහෙමයි. ආලවක නොයෙක් සද්ද දැම්මත් උන්වහන්සේ නොසැලී ඉවස ගෙන හිටියා. ඒ දාපු දේම අරගෙන හොඳ දෙයක් බවට හරවල නැවත දුන්නා. ඒකෙන් ආලවක අනන්ත අප්‍රමාණ සසර දුකෙන් මිදුනා. ඔබටත් සීලයේ අත්දැකීම් තියෙනව නම්, ඒ අත්දැකීම් අරගෙන බුදුන් වහන්සේගෙ සීලය කොච්චරද කියල අනුමාන කරන්න පුළුවන්. ඉන් නැගෙන තේජසින් විහිදෙන ශක්ති ප්‍රමාණය සත්‍යයක්, මට අත්දැකීම් තියෙනවා, ඒ බොරුවක් නෙවෙයි, ඒ ශක්තියෙන් තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා,

හොඳක්ම වේවා කියල පැතුවොත්, ඒ පැතුම කොච්චර බලවත්ද කියල අමුතුවෙන් කියන්න ඕන නෑ.

**නාලාගිරිං ගජවරං අතිමත්ථභූතං**

**දාවග්ගිචක්ක මසනීව සුදාරුණන්තං**

**මෙත්තම්බුසේක විධිනා ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානි**

හෙණ හඬ නංවමින් සුරා මතින් මත් වෙලා බුදුන් වහන්සේ කරා දුව ආ නාලාගිරි නම් ඇත් රාජයා, උන්වහන්සේ මහා මෛත්‍රියෙන් දමනය කළා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි තුන් වෙනි ගාථාවෙ සරල තේරුම.

ඉහත ආකාරයටම මෙත්තා පාරමිතාව කියන්නෙත් දස පාරමිතාවලට අයිති එකක්, බුද්ධත්වයට පත්වෙන කොට පූර්ණ කරපු මහා ශක්තියක්. උන්වහන්සේ බුද්ධත්වය කරා යන ගමන පටන් ගත්තෙම මේ මෛත්‍රී සහගත සිතිවිල්ලෙන්. මමත් එතෙර වෙලා ලෝකයාත් එතෙර කරනවා කියන මේ සිතිවිල්ල එසේ මෙසේ සිතිවිල්ලක් නෙවෙයි. නොවිඳිනා දුක් වින්දෙ තමන් වෙනුවෙන් නෙවෙයි, අනුන් වෙනුවෙන්. ඒ අයට කරගන්න බැරි දේ තමන් කරගෙන ඒක පෙන්වා දීම ලේසි පහසු දෙයක් නෙවෙයි.

බුදුන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කාලෙ එක්තරා දෘෂ්ටියක් නිසා මාන්නයෙන් මත් වෙච්ච කෙනෙක් හිටියා. මම යන්නෙ නෑ භවත් ගෞතමයන් ළඟට, ඕහුට ඕන නම් මගේ ළඟට ආපු දෙන් කියන සිතිවිල්ලෙන් තමයි ඒ පුද්ගලය හිටියෙ. මේක ආනන්ද හාමුදුරුවො බුදුන් වහන්සේට සැළ කළාම උන් වහන්සේගෙ මහා කරුණා ඥානයට හසුවුනා, මේ මනුස්සයට සෝවාන් වෙන්න හේතු තියෙනව කියල. ඒ නිසා ඒ මනුස්සය කරා යොමු කරල මහා මෛත්‍රී සිතක් පහල කළා. හැබැයි ඒ සිත අද කාලෙ කියනව වගේ, අනේ කොත්තමල්ලි උගුරක් වත් නොබී ඉන්න තරමට නිරෝගි වෙන්න ඕන, මඟුල් ගෙදරක ඉන්නව වගේ සතුටින් ඉන්න ඕන... ආදී වශයෙන් කියන ඒ ජාතියේ ලෞකික සිතිවිල්ලක් නම් නෙවෙයි. මොකද උන්වහන්සේ දන්නවා ඒ සේරම ගෙවිල වැනසිලා යන දේවල් කියල. ඒ නිසා මේ කියන්නෙ ඊට එහා ගිය මෙත් සිතක්. මේ මනුස්සය මග ඵල අවබෝධයට හේතු වාසනා ඇත්තෙක් කියල දැනගෙනම තමයි මෙත් සිතක් පැතිරෙව්වෙ. ඒ සිත පතුරුවන කොටම අර මනුස්සයා බඩගින්නෙ ඉන්න වහු පැටියෙක් කිරි හොයා ගෙන තමන්ගෙ මවු කරා යනව වගේ දුවගෙන ඇවිත් බුදුන් වහන්සේ පා මුල වැඳ වැටුනා. එතකොට යමක් හිතන්න කියන්න පුළුවන් මනුස්සයෙකුට තමයි එහෙම වුනේ. ඒ වෙලාවෙ ඔහු මත් පැන් පානය කරල මත් වෙලා හිටියෙත් නෑ. හැබැයි මාන්නයෙන් මත් වෙලා හිටියෙ.

නමුත් නාලාගිරි කියන්නෙ රා කල 7 කින් මත් වෙලා හිටපු තිරිසන් සතෙක්. ඒ අවස්ථාවෙදි කිසිම කෙනෙකුට දමනය කරන්න හැකියාවක් තිබුනෙ නෑ. ආනන්ද හාමුදුරුවො ඉදිරියට පැන්නම උන්වහන්සේ එතතින් ඉවත් කළේ ඒ නිසා. බුදු කෙනෙකුගෙ මහා මෛත්‍රියම ඕන වුනා මේ තිරිසන් සත්වයාගෙ මනස සැහැල්ලු කරල දමනය කරන්න. පාරමිතා ශක්තියෙන් ඒ මහා මෙත් සිත පතුරන කොට අර තිරිසන් සතාගෙ වෛරී හිඳිල උන්වහන්සේ පා මුල වැටී හිටියා. ඉතින් අපිත් මෙත් සිත පුරුදු කරල තියෙනව නම්, අපිටත් අනුමාන කරන්න පුළුවන් අපේ



අත්දැකීම් අනුව, උන්වහන්සේගේ ශක්තිය, තේජස කොච්චර බලවත් වෙන්න ඕනද කියල. ඒ තේජසින් විහිදෙන ශක්ති ප්‍රමාණය සත්‍යයක්, මටත් අත්දැකීම් තියෙනවා, ඒක බොරුවක් නෙවෙයි කියල ඒ ශක්තියෙන්, තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත් ඒ පැතුම කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.

**උක්ඛිත්තඛග්ග මතිහත්ථ සුදාරුණංතං**

**ධාවං තියෝජනපථංගුලිමාලවන්තං**

**ඉද්ධීභිසංඛතමනෝ ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානී**

අතින් කඩුවක් අරගෙන උන්වහන්සේ පසු පස යොදුන් තුනක් හඹා ආ අංගුලිමාල නම් දරුණු සොරා ඍද්ධි බල පෙන්වා දමනය කළා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි 4 වන ගාථාවෙ සරල තේරුම.

අංගුලිමාල කියන්නෙ ඉතාම දරුණු මිනීමරුවෙක්, සොරෙක්. ගුරු පඬුරු පුදන්න කියල මිනිස්සු දහස් ගාණක් මරපු කෙනෙක්. බුදු කෙනෙකුට පමණක් දමනය කරන්න පුළුවන් මට්ටමට ඒ දරුණු ගතිය ඇවිල්ල තිබුණෙ. දුවන අසුන්, මුවන් පවා පස්සෙන් පන්නල නවත්ත ගන්න හැකියාවක් අංගුලිමාලට තිබුනා. මඳ කිපුණු ඇතුන් පවා බළල් පැටව් වගේ සද්දයක් නැතුව අංගුලිමාල ඉදිරියේ හිටියෙ. ඒ තරම් දරුණු මනුස්සයෙක්. ඉතින් බුදුන් වහන්සේ පසුපස යොදුන් තුනක් එලවලත් අල්ලගන්න බැරි වුනා. මේ උන්වහන්සේ මහා ඍද්ධි ප්‍රාතිහාර්යක් පෙන්නුව අවස්ථාවක්. ඒ කියන්නෙ පිටින් බලන කොට පේන්නෙ ඉතාම ශාන්තව ගමන් කරන පැවිදි රුවක්. නමුත් අංගුලිමාල ඉතාම වේගයෙන් යොදුන් තුනක් දුවලත් ළඟටවත් කිට්ටු කරන්න බැරි වුනා. මේ උන්වහන්සේගෙ අධිෂ්ඨානයේ ප්‍රතිඵලයක්. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට වඩා පුරපු දස පාරමිතාවන්ගෙන් එකක් වූ අධිෂ්ඨාන පාරමිතාව නිසා නැගුන මහා ශක්තියක්. ඒක කිසි කෙනෙකුට සම කරන්න බෑ. ඒකෙන් නැගෙන තේජසත්, ප්‍රාතිහාර්යත් ඒ වගේ. අර දුවන මුවන්, අසුන් අල්ල ගන්න මහා වේගයෙන් දුවන්න පුළුවන් කෙනෙකුට, යොදුන් තුනක් දුවලත් ශාන්ත ගමනින් වඩින බුදුන් වහන්සේ අල්ල ගන්න බැරි වෙන්න කරපු මහා ප්‍රාතිහාර්යක්.

මේ ලිපිය කියවන පින්වතුන්ටත් ප්‍රාතිහාර්ය කෙසේ වෙතත් කරපු පුංචි අධිෂ්ඨානයකවත් අත්දැකීම් ඇති. මම අද පුර පසළොස්වක පොහොයට ප්‍රාණ ඝාතයෙන් වෙන් වෙලා ඉන්නවා කියන අධිෂ්ඨානයේ, ශක්තියේ අත්දැකීම් ඇති. ඉතින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක පාරමිතා ශක්තිය ඒ අනුව අනුමාන කරන්න පුළුවන්. මට මෙහෙම ඉන්න පුළුවන් නම්, උන්වහන්සේගෙ තේජස කොහොම ඇත්ද කියල අනුමාන කරන්න පුළුවන්. ඉතින් ඒ තේජසින් විහිදෙන ශක්ති ප්‍රමාණය සත්‍යයක්, මටත් අත්දැකීම් තියෙනවා, ඒක බොරුවක් නෙවෙයි, ඒ ශක්තියෙන් තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත් ඒ පැතුම

කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.

**කත්වාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා**

**චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ**

**සන්තේන සෝම විධිනා ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානි**

ගර්භනී මාතාවක් ලෙස වෙස් වලාගෙන දර මිටියක් කුසේ බැඳගත් චිංචි මානවිකාව මහ සෙනග මැද්දේ බුදුන් වහන්සේට නොයෙක් නින්දා අපහාස කළා. නමුත් උන්වහන්සේගෙ සමාධි ගත නොසැලුන සිත, සංසුන් සිත නිසාම ඒක මැඩ පවත්වන්න පුළුවන් වුණා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි පස් වන ගාථාවෙ සරල සිංහල තේරුම.

ලාභ සත්කාර නොලැබූ, අන්‍ය තීර්ථකයින් විසින් පොළඹවා එවපු චිංචිමානවිකාව කියන රූමත් ස්ත්‍රියක් උන්වහන්සේට අභූතයෙන් චෝදනා කළා. ඇයට දරුවෙක් ලැබෙන්න ඉන්න බවත්, ඒ දරුවගෙ පියා බුදුන් වහන්සේ බවත් කියල අභූතයෙන් චෝදනා කරපු පුවත හැමෝම වගේ අහල තියෙනවා. මේ විදියට චෝදනා කළාම, උන්වහන්සේ මේ කාරණය බොරුවක්ද ඇත්තක්ද කියල දන්නෙ අපි දෙන්න පමණයි කියල සිංහ නාදයක් කළා. ඒකෙන් උන්වහන්සේගෙ ඍජු බව, අවංක බව, සිතින් කයින් වචනයෙන් වංක නැති බව පෙන්නුම් කළා. තමන් වහන්සේ පත් වූ බුද්ධත්වය ඇද නැති බව, කෙලින් බව, ඍජු බව ලෝකයාට පෙන්වපු අවස්ථාවක්. මොනම හේතුවකටවත් නැතිවෙච්ච මේ නොසැලෙන ගුණය පෙන්වපු අවස්ථාවක්. උන්වහන්සේට ලාභ සත්කාර ලැබුනෙ කිසිවක් ඉල්ලල නෙවෙයි. උන්වහන්සේ ලෝකයට දුන් දායාදය, අටලෝ දහමින් කම්පා නොවන ගුණය නිසා. ඒ මාර්ගය අනුගමනය කරමින් ඒ ගුණයට, අකම්පා්‍ය බවට පත්වීමයි උන් වහන්සේ පෙන්නුවෙ. මේ ආර්ය මග වඩන පින්වතුන්ටත් මේ අත්දැකීම්, අකම්පා්‍ය බව සුළුවෙන් හෝ ඇති. ඒ මාත්‍රය හෝ හිතට අරගෙන මේ මහා උත්තමයගෙ අකම්පා්‍ය බව අනුමාන කරන්න පුළුවන්. ඒකෙන් නැගෙන තේජස, ශක්තිය අනුමාන කරන්න පුළුවන්. ඒක බොරුවක් නෙවෙයි සත්‍යයක්. ඒ ශක්තියෙන් තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත් ඒ පැතුම කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.

**සච්චං විහාය මතිසච්චක වාදකේතුං**


**වාදාභිරෝපිතමනං අතිඅන්ධභූතං**


**පඤ්ඤාපදීපජලිතෝ ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානී**

සත්‍යය පැත්තක තියල නිතර වාද කරල තමන්ගෙ තර්කවලින් අන්ධ වෙලා හිටපු සච්චක නමැති වාදකරුවා ප්‍රඥා ප්‍රදීපය දල්වල පරාජය කළා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි හය වන ගාථාවෙ සරල තේරුම.

ප්‍රඥා පාරමිතාව කියන්නෙ දස පාරමිතාවලින් එකක්. සාරාසංඛ්‍ය කල්ප





ලක්ෂයකට වඩා නොයෙක් ප්‍රකාරයන් දකිමින් ඒ ඒ හේතුන්ගෙ ඵලයන් නිරීක්ෂණය කරමින් අවසානයේ බෝධි මූලයෙදි පටිච්ච සමුප්පාදී ධර්මයන් සිහි කරල පරිපූර්ණත්වයට පත් වූ ප්‍රඥාව කියන්නෙ එසේ මෙසේ එකක් නෙවෙයි. ඒ වගේම බුදු කෙනෙකුට පමණක් පිහිටන අසාධාරණ ඥාන හයකින් උන්වහන්සේ බැබලුනා.

**1. ඉන්ද්‍රිය පරෝපරියන්ත ඥානය** - සත්වයාගේ ඉන්ද්‍රියන් පහ, ඒ කියන්නෙ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි සහ ප්‍රඥා ඉන්ද්‍රියන් කොච්චර දුරට වැඩිල තියෙනවද, එයින් ප්‍රබලම ඉන්ද්‍රිය මොකක්ද ආදී වශයෙන් දැන ගැනීමේ ඥානය.

**2. ආසයඅනුසය ඥානය** - යම්කිසි සත්වයෙකුට කොච්චර ප්‍රමාණයක කෙලෙස් ඉතුරු වෙලා තියෙනවද කියල දැන ගැනීමේ ඥානය

**3. යමක මහා ප්‍රාතිහාර්ය ඥානය** - යමක මහ පෙළහර හෙවත් විරුද්ධ ලකුණු 2 ක් එකවර සිද්ධ වෙනව වගේ පෙන්වන්න පුළුවන් හැකියාව. උදාහරණ විදියට සිරුරින් එකවර ගින්න (තේජෝ ධාතුව) සහ ජලය (ආපෝ ධාතුව) පිටවන්නා සේ පෙන්වීමට ඇති හැකියාව. මේ හැකියාව ජලය, ගින්න සම්බන්ධයෙන් විතරක් නෙවෙයි, ඕනෑම ප්‍රතිවිරුද්ධ කාරණා 2 ක් සම්බන්ධයෙන් කරන්න පුළුවන්. ඒක බුදු කෙනෙකුට පමණක් කරන්න පුළුවන් ප්‍රාතිහාර්යයක්.

**4. මහා කරුණා සමාපත්ති ඥානය** - ලෝක සත්වයා දුකින් මිදවීම සඳහා ලෝකය දෙස යොමු කරමින්, හේතු වාසනා තියෙන අය හඳුනා ගන්න පුළුවන් ඥානයක්. මමත් එතෙර වෙලා අනුනුත් එතෙර කළ යුතුයි කියන පරිපූර්ණත්වය තමයි මේ ඥානය.

**5. සබ්බඤ්ඤුතා ඥානය හෙවත් සර්වඥතා ඥානය** - සියලු ලෝකවල සියල්ල සියලු ආකාරයෙන් අංශු මාත්‍රයකවත් අඩුවක් නැතිව දැන ගැනීමේ හැකියාව.

**6. අනාවරණ ඥානය** - කිසි දෙයක් වහන්න බෑ, ආවරණ නෑ කියන අර්ථය තමයි මේකෙන් කියවෙන්නෙ. ඒ කියන්නෙ අතීතයේ සියල්ලමත්, වර්තමානයේ සියල්ලමත්, අනාගතයේ සියල්ලමත් වැසුම් නැතිව දකිනවා. කාටවත් යමක් වහන්න, හංගන්න බෑ. වහල හංගල තියෙන ඒවත් දකිනවා. ඒ කියන්නෙ කිසිම ආවරණයක් නැතිව දකිනවා.

මේ අසාධාරණ ඥාන 6 ඇතුළුව ඥාන 73 ක (තෙසැත්තෑ) පූර්ණත්වයක් තමයි උන්වහන්සේගෙ ප්‍රඥාව තුල තිබුනෙ. මේ සියළු ඥාන ගැන සවිස්තරයක් පටිසම්භිදාමග්ගප්‍රකරණයෙ පළමු පොතේ සඳහන් වෙනවා. ඉතින් සච්චක වගේ අය වාද කරන්න එන කොටම උන් වහන්සේ දන්නවා, මොකටද එන්නෙ, මොනව හිතා ගෙනද එන්නෙ, ඊළඟට මොකක්ද කියන්නෙ, කලින් අත් බැව් මොනවද කිව්වෙ කළේ, ඊට කල්ප ලක්ෂයකට පෙර මේ ☞

මනුස්සයා කියපු කරපු දේ, මතුවට කරන දේ ... ආදී වශයෙන් මේ හැම දෙයක්ම දන්නවා. මේ සියළු ඥාන උපයෝගි කරගෙන අවිද්‍යා මෝහාන්ධකාරයෙන් වැහිල හිටපු ලෝක සත්වයාගෙ මනස ප්‍රඥාලෝකයෙන් ආලෝකමත් කළා. දස දහසක් සක්වලටත් එහා විහිදෙන මේ ආලෝකයේ තේජස සුළුපටු නෑ. අනේ මේ ලෝකය මෙහෙමයි, එහි අසාරත්වය මේකයි කියල අංශු මාත්‍රයක් හෝ ප්‍රඥාවෙන් තේරුම් ගත්ත පින්වතුන් ඒකෙ වටිනාකම දන්නවා. ඉතින් ඒ අංශු මාත්‍රය එහෙම නම්, ෂඩ් අසාධාරණ ඥාන එක්ක 73 ක් ඥානයන්ගෙන් පරිපූර්ණ මේ මහා උත්තමයගෙ ප්‍රඥාලෝකයේ තේජස අනුමාන කරන්න පුළුවන්. ඒ ශක්තියෙන්, තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත් ඒ පැතුම කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.

**නන්දෝපනන්දභුජගං විබුධං මහිද්ධිං**

**පුත්තේන ථේරභුජගේන දමාපයන්තෝ**

**ඉද්ධූපදේසවිධිනා ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානී**

මහා සෘද්ධි ඇති, විෂ ඇති නන්දෝපනන්ද කියන නා රජුන් සෘද්ධි බලයෙන් පරදවන්න උන්වහන්සේ ශ්‍රාවකයෙකුට උපදෙස් දුන්නා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි 7 වන ගාථාවෙ සරළ තේරුම.

නන්දෝපනන්ද කියන්නෙ චාතුර්මහාරාජිකයත්, මනුස්ස තලයත් අතර තියෙන මහාමේරු පර්වතය අසළ නාග ලෝකයේ හිටපු සෘද්ධි සම්පන්න නාගයෙක්. දේව නාග කියන කොටසට අයිති වෙන්නෙ. නමුත් ඒ සෘද්ධි බලය බුදුන් වහන්සේගෙ සෘද්ධි බලයට සමාන කරන්න බෑ. ඒත් උන්වහන්සේ ලෝකයාට යමක් පෙන්නුවා. ඒ තමයි උන් වහන්සේ කරන්නා වූ ප්‍රාතිහාර්යෙන් යම් ප්‍රමාණයක්, මේ මග යන උන් වහන්සේගෙ ශ්‍රාවකයන්ටත් කරන්න පුළුවන් කියන කාරණය. අවශ්‍ය වෙන්නෙ හරියාකාරව දෙන උපදෙස් පමණයි. ඉතින් මේකට ඉදිරිපත් වුනේ මුගලන් මහ රහතන් වහන්සේ. උන්වහන්සේ සෘද්ධි බලවලින් අග්‍ර වූ උත්තමයෙක්. බුදුන් වහන්සේගෙ සෘද්ධි බල තේජසට විතරයි ඒක දෙවෙනි වුණේ. ඉතින් ඉහත කියපු ආකාරයටම ඒ තේජසත් බොරු නෙවෙයි, ඒකත් සත්‍යයක්. අපිටත් ඒ ගැන සත්‍ය ක්‍රියා කරන්න පුළුවන්. ඉතින් ඒ ශක්තියෙන්, තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත් ඒ පැතුම කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.

**දුග්ගාහදිට්ඨි භුජගේන සුදට්ඨහත්ථං**


**බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං**

**ඤාණාගදේන විධිනා ජිතවා මුනින්දෝ**

**තං තේජසා භවතු තේ ජයමංගලානී**

මහා මාන්නයෙන් දෘෂ්ටිගත වෙලා හිටපු බක නම් බ්‍රහ්ම රාජයාගෙ මාන්නය උන්වහන්සේගෙ මහා ඥානයෙන් බිඳ හෙලුවා. ඒ තේජස් බලයෙන් ජය මංගල්ලයක්ම වේවා. මේ තමයි අටවෙනි ගාථාවෙ සරල සිංහල තේරුම.

බ්‍රහ්ම ලෝකෙ හිටපු බක නම් බ්‍රහ්මයා තමන්ගෙ සම්පත්තියට ඉතාම මාන්නයෙන් දෘෂ්ටිගත වෙලා හිටියෙ. බුදුන් වහන්සේ ලොව පහල වෙලා ධර්ම දේශනා කරනව කියල දැන ගෙන හිටියත්, මාන්නය නිසා බණ අහන්න ගියේ නෑ. ඉහත පෙන්වපු මහා බුද්ධ ඥානයන්ගෙන් පරිපූර්ණ වූ බුදුන් වහන්සේ බක බ්‍රහ්මයාගෙ මාන්නය බිඳ හෙලුවා. කලින් බුද්ධ ඥාන අනුමාන කළා වගේම මෙතැනත් ඒ තේජසින් තමන්ට හෝ කාට හෝ ජය මංගල්ලයක්ම වේවා, යහපතක්ම වේවා කියල පැතුවොත්, ඒ පැතුම කොච්චර බලවත්ද කියල තමන්ටම හිතාගන්න පුළුවන්.



**ඒතාපි බුද්ධජයමංගල අට්ඨගාථා**

**යෝ වාචකෝ දිනදිනේ සරතේ මතන්දි**

**හිත්වාන නේකවිවිධානි චුපද්දවානි**

**මොක්ඛං සුඛං අධිගමෙය්‍ය**

**නරෝ සපඤ්ඤෝ**

මේ ගාථා අට යමෙක් දිනපතා කියනව නම්, ඔහුට හෝ ඇයට එන බොහෝ උපද්‍රවවලින්, බාධකවලින් ජයගන්න පුළුවන්. එසේම නුවණැත්තා සියලු බාධකයන් ජයගෙන නිවනින්ම කෙලවර කරගන්නවා. අවසාන ගාථාවෙ සරල සිංහල තේරුම තමයි මේ.

එතකොට මේ ගාථා ආවට ගියාට හදපු ඒව නෙවෙයි. අක්ෂර, ගණ, මාත්‍රා ගලපල ශබ්ද විද්‍යානුකූලව හදල තියෙන්නෙ. ඒ වගේම මේ ගාථාවල හේතු ප්‍රත්‍යයත් සම්පූර්ණයි. අවශ්‍ය කරන **භෞතික පසුතලයත් සකස් වුනාම මේ ගාථා සජ්ජායනයෙන් මනුස්සයින්ගෙ ලෞකික යහපතට, අභිවෘද්ධියට හේතු වෙනවා. ඒ අභිවෘද්ධියට තියෙන බාධක දුරු වෙන්න මේ ගාථා හරි විශේෂ වෙනවා. ඒ වගේම විශේෂයෙන් වෘක්ෂ දේවතාදී කොටස් පවා මේ ජයමංගල ගාථාවලට හරි කැමතියි. මොකද ඒ අය ඉන්න විමන්, ඒව පිහිටල තියෙන ගස් කොළං පවා රැකෙනවා. ඒ නිසා මේ ජයමංගල ගාථා උදේ හවා භාවිතා කරනව නම් බොහොම හොඳයි.**

ඉතින් මේ ගාථා අටේම සාරංශය තමයි මේ නව වෙනි ගාථාවෙ තියෙන්නෙ. සරලව කියනව නම් ප්‍රධාන වශයෙන්ම බුදුන් වහන්සේගෙ අනුත්තර පුරිසදම්ම සාරථී ගුණය ගැන කරන සත්‍ය ක්‍රියාවක් තමයි ජයමංගල ගාථාවලින් කියවෙන්නෙ. ඉතින් ලෞකික උපද්‍රව වගේම, සියලු දුකින් මිදීමටත් මේ ගාථා පෙල නුවණින් විමසා බලන කෙනෙකුට භාවිතා කරන්න පුළුවන්. ඒකෙන් දකින්නෙත් අනන්ත බුදු ගුණ. ඒ ගුණ දැකල, තමන්ට හැකි පමණින් ගුණයක පිහිටල වැඩ කළොත් ඒ ගුණයෙ තියෙන ශක්තිය තමන් කරාත් එනවා. ඒ ගුණය තුළ තියෙන්නෙ නිවනේ ශාන්තිය. ඒ අනුව කටයුතු කළා නම් කවදා හරි රාග, ද්වේශ, මෝහ කියන උපද්‍රවයන්ගෙන් බේරිලා, රාගක්ඛයෝ නිබ්බානං ද්වේශක්ඛයෝ නිබ්බානං මෝහක්ඛයෝ නිබ්බානං කියන නිවනින්ම නිවී සැනසෙන්න පුළුවන්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැගවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**

**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# දානය සහ අත්හැරීම

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් හෝ තමන්ට අයිති ධනයෙන් සකස් කරන දාන වස්තු, වෙනත් කෙනෙකුට කැප කිරීම හෝ පරිත්‍යාග කිරීම දානයක් විදියට තමයි බොහෝ අය සලකන්නෙ. නමුත් දානය කියන පුණ්‍ය ක්‍රියාව පිළිබඳව හෝ දන් දිය යුත්තේ ඇයි කියන කාරණය පිළිබඳව හෝ පැහැදිලි අදහසක් ඒකෙන් ලැබෙනවද? දානයක් දෙන්නත් හේතුවක් තියෙන්න ඕන. මේ පිළිබඳව යථාවබෝධයක් ලබා ගන්න නම් දානය කියන වචනය මුලින්ම විග්‍රහ කරගන්න ඕන. ''**ණය ගෙවා දැමීම**'' **කියන අර්ථයෙන් දානය (දා + ණය) යන වචනය සකස් වෙලා තියෙන බව එහි නිරුක්තිය සොයා බැලීමෙන් පෙනී යනවා.** ආපසු ගෙවා දැමිය යුත්තේ කුමන ආකාරයකින් ගත් ණයද කියන කාරණය පටිච්ච සමුප්පාද ධර්මයට අනුව විග්‍රහ කර බැලීමෙන් ණය වෙන්න හේතු සොයා ගන්න පුළුවන්.

ලෝභ, ද්වේශ, මෝහ, අලෝභ, අද්වේශ, අමෝහ කියන කරුණු හය හේතු කර ගෙන තමයි ලෝක සත්ත්වයා කර්ම භවයක් සකස් කරගෙන උප්පත්ති භවයක් ලබල ජාතියක් හැටියට ලෝකෙට පහළ වෙන්නෙ. ලෝක සත්ත්වයා අනන්ත සංසාර ගමනක් තුළ අන්‍යෝන්‍ය වශයෙන් කරගන්නා ලද අවැඩ අසාධාරණයන් මුල් කරගෙන ගොඩ නගන ලද අපුඤ්ඤාභි සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණත්, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූපත්, නාම රූප ප්‍රත්‍යයෙන් සළායතන, සංඵස්ස, සංඵස්සජා වේදනා, තණ්හා, උපාදාන ආදී වශයෙන් කර්ම භවයක් සකස් වෙලා, ඒ භව ප්‍රත්‍යයෙන් හටගන්නා ජාතිය තම තමන් විසින් කරගන්නා ලද අවැඩට අසාධාරණයන්ට වන්දි ගෙවමින් දුක්ඛ, දෝමනස්ස, උපායාස විඳින්න සිදුවන ආකාරයට හේතු ඵල ධර්මතාවය සකස් වෙලා තියෙනවා.

හැබැයි මෙතනදි අපුණ්‍යාභි සංඛාරවලින් එන විඤ්ඤාණ කියනකොට, පටිසන්ධි විඤ්ඤාණ ගැන නෙවෙයි කියන්නෙ. කර්ම විඤ්ඤාණ ගැන. මොකද අපුණ්‍යාභි සංඛාරවලින් එන පටිසන්ධි විඤ්ඤාණ හේතු වෙන්නෙ සතර අපායෙ උප්පත්තියට. කර්ම විඤ්ඤාණවලින් අවසානයේ කර්ම භවය සකස් වෙලා ඉදිරියට අලෝභ, අදෝස, අමෝහවලින් එන පටිසන්ධි විඤ්ඤාණයකින් සුගතියක උපන්නත්, කල්ල සුක්ඛං කල්ල සුක්ඛ විපාකං කියන පින් පවු මිශ්‍රනයෙන් පාප විපාක සකස් වෙලා ප්‍රවෘත්ති විපාක වශයෙන් ඵල දෙන්න ඇදිල එනවා. ඒක තමයි මේ කියන්නෙ.

එතකොට ලෝක සත්ත්වයින්ට පොදුවේ භුක්ති විඳීම සඳහා ඔවුන්ගේ අලෝභ, අද්වේශ, අමෝහ මානසිකත්වය හේතු කොට ගෙන පුණ්‍ය ශක්තියට අනුව ස්වයං ජාතව පහළ වෙච්ච දේවල් එක් පිරිසක් අසාධාරණ විදියට සොරකම් කර ගෙන භුක්ති විඳින්න යාම නිසා, අන්‍යයන්ට ගෙවා දැමිය යුතු ණයක් උරුම කරගෙන තමයි මේ ලෝක ධර්මතාවය තුළ සත්ත්වයා බිහි වෙන්නෙ.



බුදු කෙනෙක් ලෝකෙ පහළ වෙලා මේ කරුණ පෙන්වල දෙනකල්, අවිද්‍යාව තුළ සිටින ලෝක සත්ත්වයින්ට මේ පිළිබඳව යථාවබෝධයක් නැති නිසා, ණය ගෙවල නිදහස් වීම වෙනුවට ඔවුන් තව තවත් ණය වෙමින් සංසාර ගමන තව තවත් දික් කරගන්නවා. මේ පිළිබඳව නොදන, මානයෙන් මත් වෙලා ළාමක වූ දස අකුසල් කරමින් උදම්ව හිටපු බ්‍රාහ්මණ වංශිකයන්ගේ මානය බිඳ දැමීම සඳහා වාසෙට්ඨ, භාරද්වාජ යන ථෙරනුවන් අරභයා බුදු පියාණන් වහන්සේ දේශණා කළ අග්ගඤ්ඤ සූත්‍රයේ, ලෝක සත්ත්වයා තණ්හාව නිසා සිදු කරගන්නා විපත පැහැදිලි කරල තියෙනවා. (<u>අග්ගඤ්ඤ සූත්‍රය</u>, දීඝ නිකාය 3)

**මේ ණය ගෙවා දැමීමෙන් සිදුවන ලාභයක් වගේම නොදීමෙන් සිදුවන සාපයකුත් තියෙනවා.** ලෝක සත්ත්වයින් දුක් විඳින්නෙ තම තමන්ම කරගත් මේ සාපය නිසා. ඒ අනුව මේ සාපයෙන් මිදිල දුකින් මිදෙන්න නම් අසාධාරණයෙන් රැස් කරගත් දේ ආපසු දිය යුතුමයි, අත්හැරිය යුතුමයි, දන් දිය යුතුමයි. ඒ බව සුමණා සිටු දුවට බුදු පියාණන් වහන්සේ දේශනා කරන්නෙ ඒ නිසා.

''සුමනාවෙනි, දන් දිය යුතුමය, පින් කළ යුතුමය. දෙවි වූවන්ටත්, මිනිස් වූවන්ටත්, ශ්‍රමණ වූවන්ටත් පින උපකාරී වේ.'' (<u>සුමනා සූත්‍රය</u> - අංගුත්තර නිකාය 3)

**තණ්හාව සාපයට මුලයි.**

වාසෙට්ඨ, භාරද්වාජ කියන තෙරණුවන් බ්‍රාහ්මණ කුලය අත හැර ගිහි ගෙයින් නික්මිලා සසුන් ගතවීම නිසා අන්‍ය බමුණන්ගෙ ගැරහීමට ලක්වුනා. මහා බ්‍රහ්මයගෙ මුවින් බිහි වූ බමුණන්, මහා බ්‍රහ්මයගෙ පාදයෙන් ඉපදුණු මුඩු මහණුන් සමග වාසයට යාම නොමනා දෙයක් හැටියට සලකල තමයි ඔවුන් එසේ ගැරහීමට ලක් කළේ. බුදු පියාණන් වහන්සේ දේශනා කරනවා, ඒ බමුණන් පුරාණ ලෝකෝප්පත්ති කථාව දන්නෙ නෑ කියල. ඒ බ්‍රාහ්මණයින් ඍතු නියම වූද, දරු ගැබ් හටගන්නා වූද, දරුවන් බිහි කරන්නා වූ ද, බැමිණියන්ගේ යෝනියෙන් ඉපදුණු අය. එසේම ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්ෂුද්‍ර යන හතර වංශවලම අය ළාමක වූ දස අකුසලය සිදු කරන නිසා ගැරහීමට ලක් වන බවත් ඒ සියලු ආශ්‍රවයන්ගෙන් මිදුනා වූ ආර්ය පුද්ගලයා ඒ සැම අතුරෙන් අග්‍ර බවත් පෙන්වා දෙමින් බමුණන්ගෙ මානය බිඳ දමන්න බුදුපියාණන් වහන්සේ ලෝකෝප්පත්ති වංශ කථාව දේශනා කරනවා.

**දිගු කලකට පස්සෙ ලෝක ☞**

**විනාශයක් සිද්ධ වෙන කාලයක නියත මිත්‍යාදෘෂ්ටිකයින් ලෝකාන්තරික නරකයේත්, අන් සියලු සත්ත්වයින් ආභස්සර බ්‍රහ්ම ලෝකයේත් ඉපදෙනවා. අලුත් කල්පයක් ආරම්භ වීමේදී සත්ත්වයින් ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් චුත වෙලා, ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම තලයේත්, එතැනින් චුතවෙලා මනුස්සයින් ලෙසත් ඉපදෙනවා.** ඔවුන් ප්‍රීතිය ආහාර කරගෙන ස්වයං ප්‍රභා ආලෝකයෙන් යුක්තව පුණ්‍ය සෘද්ධියෙන් පහළ වූ සිත්කලු වස්ත්‍රාභරණයන්ගෙන් සැරසිලා අහසේ සැරිසරමින් බොහෝ කාලයක් ඉන්නවා. එකල සියලු සක්වල එකම දිය කඳක් සේ පවතිනවා. එසේම මහා ගණඳුරක් පවතිනවා. සඳ, හිරු, තරු, රෑ, දහවල් බිහිවෙලා නෑ. මෙසේ දිගු කලකට පස්සෙ යම් ආකාරයකට තියෙන්නා වූ කිරි මතු පිට යොදයක් හටගන්නා සේ දිය මතුපිට පැතිරෙමින් රස පොළව පහළ වෙනවා. මේ රස පොළව මනා කොට සකසන ලද ගිතෙල් හෝ වෙඬරු මෙන් සුවඳින් හා රසයෙන් ද පැහැයෙන් ද යුක්ත වෙනවා. රස පොළව පිළවුන් නැති දඬුවැල් බෑ මී වදයක් මෙන් රසවත්. එක්තරා කෑදර සත්ත්වයෙක් රස පොළවෙන් මඳක් ඇඟිල්ලෙන් ගෙන දිව ගා බලනවා. එහි තිබූ ප්‍රිය භාවය නිසා ඔහුගේ සිත තුළ තණ්හාව ඇතිවෙනවා. ඉන්පසු අන්‍යයන් ද රස පොළව ගුලි කොට අනුභව කරන්න යෑමෙන් ඔවුන් තුළත් රස තණ්හාව ඇති වෙනවා. මෙසේ ඒ සත්ත්වයින්ගේ තණ්හාව නිසා ඔවුන් තුළ තිබූ ස්වයං ප්‍රභා ආලෝකය අතුරුදන් වෙන්න පටන් ගන්නවා. මෙසේ කලක් යන විට ඔවුන්ගේ ශරීර රළු බවට පත්වෙනවා. මේ අයගෙන් කෙනෙක් පැහැපත් වන අතර අනෙක් අය පැහැයෙන් අඩුයි. පැහැපත් වූවන් අනෙක් අය හෙලා දකින්න පටන් ගැනීමෙන් හටගත් මානය නිසා රස පොළව අතුරුදන් වෙන්න පටන් ගන්නවා.

මෙසේ රස පොළව අතුරුදන් වුනාට පස්සෙ භූමි පටක නම් බිම් හතු වර්ගයක් පහළ වෙනවා. මේ බිම් හතුත් වෙඬරු මෙන් වර්ණයෙන් ද, මී වද මෙන් රසයෙන් ද යුක්තයි. පෙර සේම භූමි පටක අනුභව කිරීමෙන් හටගත් වර්ණය නිසා ඇති වූ මානය හේතුවෙන් බිම් හතුත් අතුරුදන් වෙලා පෙර සේම රසවත් බදාලතා නමින් වැල් ජාතියක් පහළ වෙනවා.

**ස්වයං ජාත ඇල් පහළවීම**

කල්ගත වීමේදී ඒ සත්ත්වයින් තුළ හටගත් මානය නිසා බදාලතා කියන වැල් ජාතිය අතුරුදන් වෙලා, සී සා සකස් නොකළ පොළවේ හටගෙන පැසෙන, කුඩු නැති දහයියා නැති සුවඳැති ස්වයං ජාත ඇල් නමින් සහල් ජාතියක් පහළ වෙනවා. සවස් කාලයේ ඒවායින් කිසියම් ප්‍රමාණයක් ආහාරයට ගත්තම පසුදා උදෑසන නැවත ඒ ප්‍රමාණයට නොඅඩු කොටසක් යළි හටගන්නවා. ඒ ස්වයං ජාත ඇල් ආහාරයට ගනිමින් කලක් ගත වෙන කොට ඒ අයගේ සිරුරු බොහෝ රළු බවට පත්වෙලා, පෙර සසර පැවති ගති ලක්ෂණ අනුව ස්ත්‍රී පුරුෂ ලක්ෂණ පහළ වෙලා ඔවුනොවුන් කාම මෛථුනයේ යෙදෙන්න පටන් ගන්නවා. මෙසේ කෙනෙක් රාගයට ගැති වෙන කොට තවත් අය ඔවුන් නැසේවා යන අදහසින් ඔවුන්ට පස් ආදියෙන් දමා ගසමින් නිග්‍රහ කරන්න පටන් ගන්නවා. මෙසේ ප්‍රිය භාවයෙන් ඇසුරු කිරීමට බාධා



පැමිණෙන විට සැඟවී සිටීමට ප්‍රිය වූ අස්සක් (පියස්සක්) සහිතව, ගැරහීමෙන් බේරී සිටින්න ගෘහයක් හදා ගන්නවා.

අදත්තා දානය දස අකුසලයට මුල් වෙනවා. ස්වයං ජාතව පුණ්‍ය ශක්තියට ලැබුණු ආහාර, සමගියෙන් සමාදානයෙන් පරිහරණය කරමින් සිටින අතර එක්තරා අලස ගති ඇති තැනැත්තෙක් උදේ හවස සහල් ගෙන ඒම වෙහෙසකර නිසා එක දිනකට ප්‍රමාණවත් ආහාර එක වර ගෙන ආවා. මේක දුටු තවත් කෙනෙක් දෙදවසකටත්, ඒ දුටු තවත් කෙනෙක් දින හතකටත් වශයෙන් පසුව යම් කාල සීමාවකටම ගෙනැවිත් රැස් කරන්න පටන් ගත්තා. මේ නිසා ඒ සහල්, කුඩු සහ දහයියාවලින් වසා ගනු ලැබුවා. ස්වයං ජාත ඇල් කපාගත් තැන්වල නැවත වැඩුනෙත් නෑ. පොදු අයිතියට හිමි දේ අන්‍යයන්ට අහිමි කිරීමේ විපාකයට ණය වීමක් සිදු වුනේ මේ ආකාරයට. පොදුවේ තිබුණ දේ මම, මගේ කියන දෘෂ්ඨිය තුළ එක් කොටසක් කටයුතු කරන කොට අන්‍යයන්ට හිඟ වීම නිසා අසාධාරණව රැස් කළ අයගෙන් හොරකම් කරගෙන පරිභෝජනය කරන්න ඒ අයට සිදු වුණා. ඔහු අල්ලා ගත් අනෙක් අය, ඔහු ලාමක හෙවත් පහත් දෙයක් කළයි කියල ඔහුට පහර දෙන කොට එයින් බේරෙන්න බොරු කියන්න පටන් ගත්තා. මේ නිසා ගැරහිය යුත්තන්ට ගරහන්නත්, දොස් නගන්නත්, ඔවුන්ට දඬුවම් දෙන්නත් පටන් ගෙන, ඔවුන් අතුරෙන් වඩා රූප සම්පන්න ශක්තිමත් කෙනෙක් පත් කරගෙන ඔහුට මහා සම්මත කියල නමකුත් තබා ගත්තා.

ලෝක සත්ත්වයින්ගේ පොදු අයිතියට හිමි මහ පොළව පොදුවේ භුක්ති විඳීමට නොහැකි වන සේ එක් සත්ත්ව කොටසකට පමණක් මැන මැන වෙන් කර දීම නිසා ඔහු මනු රජ්ජුරුවන් ලෙස හඳුන්වනු ලැබුවා. මෙසේ රජෙක් පත් කරගෙන අසාධාරණ තීරණ නීතිය ලෙස පිළිගන්නා ආකාරයට සම්මත කරගත්තා. එසේ පොදු අයිතිය අහිමි කොට මහ පොළව මැන මැන උස්සා ගැනීම නිසා (මැන + උස්සා) මනුස්ස වුණා. මේ නිසා තිරිසන් සතුන්ට පවා උන්ගෙ හිමිකම නැති වුණා. උසස් මනසක් තිබූ නිසා මනුස්ස වෙනව නම්, මෙවැනි අසාධාරණකම් වෙන්න බෑ. ඊළඟට තම කටයුතුවලට බාධා ගෙන දෙන සතුන් පලවා හරිමින්, තමන්ට ආධාර උපකාර වන සතුන් අල්ලා හීලෑ කරගෙන උන්ගෙන් අසාධාරණ ලෙස වැඩ ගන්නත් පටන් ගත්තා.

මෙසේ මැන මැන කොටු කර ගැනීමේදී ඒ අතර සිටි පාරමිතා පුරන බෝසතුන් වහන්සේලාටත්, ආර්ය උතුමන්ටත්, තවත් ගුණවත් සිල්වත් උතුමන්ටත් අවහිර හිරිහැර බාධා පැමිණීමෙන් මහා සාපයකුත් සිද්ධ වෙලා තියෙනවා.

**සාපයට වන්දි ගෙවන්න හේතුඵල දහම ක්‍රියාත්මක වෙනවා.**

මුල් කාලය යහපත් නිසා කිසිම හිඟයක් තිබුනෙ නෑ. අග කාලය අයහපත් නිසා අග හිඟ වෙන්න පටන් ගත්තා. ස්වයංජාත ඇල් වඳවී යාම නිසා

උත්සාහයෙන් වීර්යෙන් යුක්තව සීසා පොළව සකස් කොට වගා කරගෙන ආහාර භෝග සකස් කර ගන්න මිනිස්සුන්ට සිද්ධ වුණා. ඉඩම් කොටු කර ගන්න බැරිව භෝග වගා කරගැනීමට නොහැකි වූ අය අසාධාරණ පරිභෝජන රටාව තුළ සොරකම් කරන්න පටන් ගත්තා. පොදු දේපල අසාධාරණයෙන් කොටු කරගෙන ණය වීමේ විපාකය විදියට මෙසේ මහන්සියෙන් වගා කළ භෝගවලින් වන්දි ගෙවන්න සිද්ධ වුණා. අන්‍යයන්ගේ දේ සොරකම් කළ අයටත් සතුටින් ඉන්න ලැබෙන්නෙ නෑ. වෙහෙස මහන්සියෙන් නිපදවන දේ තවෙකෙක් සොරකම් කිරීමේ කණගාටුවෙන් මියගිය අය ඒ ණය ආපසු ගන්න ඔවුන් ළඟ ඉපදෙනවා. **මුල් කාලවල කාම සම්භෝගයක් තිබුණට දරුවන් ගැබට ආවෙ නෑ. මනුස්සයින් ඕපපාතිකව බිහිවුණේ.** සොරකම් කරල කාපු අයගෙන් ඒ වන්දිය ගන්න ඒ අය ළඟ ඉපදෙනව කියල, මියගිය අය තමයි කුසට ඔක්කන්ති වුනේ. ඒ වන්දි ගෙවන්න කුස තුළ තබාගෙන පෝෂණය කරන්න සිදු වුණා. එකතු වෙලා සහයෝගයෙන් ඒ හොරකම් කරපු නිසා අම්මයි තාත්තටයි දෙන්නටම වන්දි ගෙවන්න වෙනවා. දරුව වුනාට පස්සෙ ලෙන්ගතු කමක් ඇතිවෙනවා. උපක්‍රමය යොදපු අම්මා පෝෂණයටත්, ඒක ක්‍රියාත්මක කරපු පියා වෙහෙස මහන්සි වෙලා උපයා සපයා දෙන්නත් විපාක වශයෙන් වන්දි ගෙවන්න ක්‍රමයක් සකස් වුණා.

සොරකම් කරපු අයට දඬුවම් කරන්න ඕන කියල පාලකයන් නීති සම්මත කරගත් නිසා ප්‍රාණඝාතය ආරම්භ වුණා.

මේ ආකාරයට ඉඩම් කොටු කරගෙන සී සා වපුරා ක්ෂේත්‍ර සකස් කරගෙන ඒවාට අධිපතිකම් කරපු අය ක්ෂත්‍රිය වංශය ලෙස ව්‍යවහාරයට පත් වුණා. මේ කටයුතුවලදී ප්‍රාණ ඝාත, අදත්තාදාන වගේ පාපී ළාමක වූ පාප අකුසලයන් කෙරෙන නිසා තවත් අය ඒවායින් බැහැර වෙලා වනගත ප්‍රදේශවල කුටි තනාගෙන ධ්‍යාන කරන්න පටන් ගත්තා.

පාපී අකුසලයන් බැහැර කරන්න ධ්‍යාන කරන නිසා ඒ අය බ්‍රාහ්මණ කියන ව්‍යවහාරයට පත් වුණා. එයින් කොටසක් මෛථුන සේවනය හෙවත් කාම සේවනයේ යෙදෙමින් විස්සුක කර්මාන්ත කරන්න වීම නිසා ඒ අය වෛශ්‍ය නමින් ව්‍යවහාරයට පත් වුණා. ඉතිරි අය පහත් දුශ්චරිත ක්‍රියාවල යෙදීම නිසා ක්ෂුද්‍ර බවට පත් වුණා. මෙසේ පහත් වූ අකුසල ධර්මයන් සේවනය කරමින් අන්‍යයන්ට ණය වීම නිසා විපාක වශයෙන් මේ අය සතර අපායට යනවා. සම්මතය බිඳිමින් කාම මිච්ඡා චාරයට අයත් දුශ්චරිතවල යෙදුණු අය මරණින් පසු පහත් උප්පත්ති ලබමින් තිරිසන් වෙලා උපදිනවා. පහත් වැඩ කළාම කෙලින් යන්න බෑ. තිරස් අතට නැමිල යන්න වෙනවා. තමන්ට තියෙද්දිත් අනුන්ට අත පාමින් අනුන්ගෙ දේට කෑදර වීම නිසා ප්‍රේත (පර හේ අත) වෙලා ඉපදෙනවා. සූර කමින් වෙහෙස මහන්සි වෙලා උපයා ගන්නෙ නැතුව අනෙක් අය ගෙනත් දෙන දේ භුක්ති විඳිමින් අසුර ලෙස කාලය ගත කරල අසුරයො වෙලා උපදිනවා. අන්‍යයන්ට කරපු සාපයට



විපාක දෙන්න සතර අපා ගතවන ආකාරයට හේතු ඵල සකස් වෙන්නෙ මෙහෙමයි.

**ණය දීමෙන් සාපයෙන් මිදෙනවා.**

කෙනෙක් තමාට විපාක වශයෙන් ලැබෙන කයේ පැවැත්මට අවශ්‍ය මූලික දේවල් වන ඇඳුම්, ආහාර, නිවාස, බෙහෙත් යන සතර ඉක්මවා (පුණ්‍ය සම්පත්තියට ලැබෙන දේ හැර) අන්‍යයන්ට හිමි දේ අසාධාරණයෙන් බලහත්කාරයෙන් කඩා වඩාගෙන යමක් භුක්ති විඳිනව නම් ඒ සියල්ල ලෝභ, ද්වේශ, මෝහ යන ක්ලේශයන් හේතු කරගෙන වටිනවා කියන අවිද්‍යාවේ දෘෂ්ඨිය නිසා එකතු කරගත් දේවල්. ඒවා සම්මත නීතිරීති යටතේ කොටු කරගෙන භුක්ති වින්දම, ඒ නීති රීති පින් පවු මත හෝ සාධාරණ ධර්මතාවයක් යටතේ හෝ ගොඩ නැගිච්ච දේවල් නොවන බව දැනගෙන සම්මතය වෙනස් කරන්න බැරි වුනත්, තමන්ට අයිති කොටස පමණක් භුක්ති විඳිමින් අන්‍ය ලෝක සත්ත්වයන්ට අයත් දේ ඒ අයට පරිත්‍යාග කරපු තැනැත්තා ණයෙන් නිදහස් වෙලා සුද්ධ භාවයට පත්වෙනවා. එතකොට ස්වභාවිකව ලැබෙන්න තියෙන සියලු හිමිකම් ලැබෙන්න පටන් ගන්නවා.

ජිනේ කදරියන් දානේන - කෑදරයා දානයෙන් දිනන්නේ ඒ ආකාරයට කෑදරකමින් මගේ කියල එක් රැස් කරගත් දෙයින් තමාට හිමි කොටස පමණක් තබාගෙන ඉතිරි සියල්ල අතහැරිය විටයි.

මෙයින් සිදුවෙන්නෙ අලුත් පිනක් ගොඩනැගීම නෙවෙයි. තිබිච්ච කෙලෙස් කහට නැති කර ගැනීම. දානයෙන් කුසලය නැගී එන්නෙ ඒ ආකාරයට. ශාන්ත පද නම් වූ නිවනට පත්වීමට කළ යුතු අර්ථවත් වූ කුසලය ගැන කරණීය මත්ත සූත්‍රයෙත් සඳහන් වෙනවා.

'කරණීය මත්ත කුසලේන යංතං සංතං පදං අභිසමෙච්ච'

පිනකින් කෙරෙන්නෙ පුණ්‍ය සංඛාර ගොඩනැගීම. කුසලයෙන් කෙරෙන්නෙ දුශ්චරිත ගෙවා හැරීම. ප්‍රාණඝාත, අදත්තාදාන ආදී පහත් දස අකුසලයන් ගෙවා හැරීම තමයි කුසලය කියන්නෙ.

'තුච්ඡ වූ නින්දිත වූ ළාමක වූ පාපයන් සලාහරින නිසා කුසල කියල අටුවාවල විග්‍රහ වෙනවා.

''කෝසානි විචෙයිය කේවලානි දිබ්බං මානුසකංච බ්‍රහ්මකෝසං සබ්බ කෝස මූලබන්ධනා පමුත්තෝ කුසලෝ තාදි පවුච්චතෝ තථත්තා''

කෝස කියන්නෙ ඉපදෙන තැන. දිව්‍ය, බ්‍රහ්ම, මනුස්ස සහ සියලු උප්පත්ති සඳහා මූල බන්ධනය වන අවිද්‍යා, තණ්හා දෙක පහ කිරීම කුසලය ලෙස හඳුන්වල තියෙනවා. මේ අනුව දන් දීම සතුටු විය හැකි පිනක්. ණය ආපසු දීමෙන් සිදුවන මානසික සුද්ධතාවය කුසලයක්. ඒ නිදහස් මානසිකත්වය සමග ලැබීම සිදුවෙනවා.

අලෝභය ලැබීමටත්
අද්වේශය (අදෝසය) ☞

සමගියටත්
අමෝහය ප්‍රඥාව වැඩීමටත් හේතු වෙන්නෙ මේ ආකාරයට.

නිවන් අවබෝධ කරගන්න කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් ආකාරයට මුලින්ම කරන්න ඕන ''සක්කෝ'' තත්ත්වයට පත්වීම. සක්ක කියන්නෙ සුද්ධතාවය. ලෝභ, දෝස, මෝහ යන ක්ලේසයන්ගෙන් සුද්ධ වීම. සකස් වූ වැඩ පිළිවෙලක් යටතේ දන් දුන් නිසා සක්‍ර දේවේන්ද්‍රයා සක්ක කියල හඳුන්වනවා. සත් සුත් වූ ඉඳුරන් ඇති විට රැස් කරගන්නෙ අල්ප වූ දෙයක් (අප්පගබ්භෝ) පමණයි. අලෝභ, අදෝස, අමෝහ මානසිකත්වය තුලත් තමාට හිමි කොටස පමණයි භුක්ති විඳින්නෙ. මේ ආකාරයට අසමාචාර ක්‍රියාවල නොයෙදී සුචරිතයට පත් වූ තැනැත්තා සතර අපා දුක් කෙළවර කරල ක්ෂේමයට හෙවත් නිවනට පත් වෙනවා.

භව භෝග සම්පත්වලින් හෝ උපයන දෙයින් අග්‍ර කොටස, බුද්ධාදී උතුමන් වෙත පූජා කරන්න ඕන. පොදුවේ ලෝක සත්ත්වයන්ට හිමි දේවල් අසාධාරණ විදියට මැන මැන කොටු කර ගැනීමේදී පාරමිතා පූරන මහ බෝසතුන් වහන්සේලාටත්, පසේ බුදුවරයන් වහන්සේලාටත්, මහ රහතුන් වහන්සේලා වීමට ශ්‍රාවක පාරමිතා පූරන සිල්වත් ගුණවත් උතුමන්ටත් බාධා අවහිර පැමිණ වීමෙන්, වැට කඩොලු බැඳීමෙන් සහ පහර ගැසීමෙන් සිදු කරන ලද සාපයෙන් මිදෙන්න තම තමන්ගෙ භෝග සම්පත්තිවල අග්‍ර කොටස පළමුවෙන්ම වෙන් කරල, බුද්ධාදී උතුමන් සඳහා දාන වශයෙන් සකස් කරල පූජා කරන්න ඕන. පැරණි මුතුන් මිත්තන් තමන්ගෙ කුඹුරුවල ගොයම් කිරි වැදිල පැසීගෙන එන කොට අස්වැන්න කපල පාගන්න පෙර එහි අග්‍ර සශ්‍ය කොටස කපල වෙන් කරල, අතින් පොඩි කරල සහල් සකස් කරගෙන ගමේ සියලු දෙනාම එකතු වෙලා බුදු, පසේ බුදුවරු ප්‍රමුඛ මහා සංඝරත්නය වෙත මහා දානයක් පූජා කිරීමේ සිරිතක් තිබුණා. ගොයම් පැහෙන කොට අග්‍ර කොටස සාසනයට පූජා කරල අවසන් කරනවා.

**දෙවෙනි කොටස දෙවියන්ට පූජා කිරීමෙන් අභිවෘද්ධියක් මිස පිරිහීමක් නෑ.**

මනුස්ස වෙලා ඉඳෙද්දි අන්‍යයන්ට ජීවත් වීමට අවශ්‍ය ළිං, පොකුණු, ඇල දොළ, වැව් අමුණු, මංමාවත්, පාලම් ආදිය හදල දීල, දුශ්චරිතය පිටු දකිමින් දැහැමි කටයුතුවල යෙදුනු අය චාතුර්මහා රාජිකය වගේ දිව්‍ය ලෝකවල උපදිනවා. නමුත් ඒ දෙවිවරුන්ට දේවත්වයේ ඉඳල පින් කරගන්න අපහසුයි. ඒ අය මනුස්ස අත්බැව්වල ඉන්න කාලෙ කරපු උපකාරවලට කෘතෝපකාර සලකමින් ධාන්‍යවලින් දෙවෙනි කොටස පැරණි අයට වෙන් කරල ඒ අයට ආරාධනා කරල ඒ අය වෙනුවෙන් දානයක් සකස් කරල දෙනවා. මේ වගේ දානයන් දෙන කොට පන්සල්, දේවාල ආදිය පිළිබඳ යම් යම් දෘෂ්ටීවලට නොබැස, සම්මතය තුළ ඉඳගෙන ඒවා කරන්න ඕන. **දෙවියන්ට පූජෝපහාර කිරීමෙන් අභිවෘද්ධියක් මිස පිරිහීමක් නොවන බව සප්ත අපරිහානි ධර්ම පිළිබඳව ලිච්ඡවී රජ දරුවන්ට බුදුපියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා.**

ඊළඟට ඉඩකඩම් හිමිකර දුන් මුතුන් මිත්තන්ගෙ කොටස ඒ අය වෙනුවෙන් වෙන් කරන්න ඕන. ගොවිතැන් කටයුතු සඳහා ඉඩකඩම් සකස් කොට පවත්වා ගෙන ඇවිත් ඒවා හිමි කර දුන් මුතුන් මිත්තන් වෙනුවෙනුත් කෘතෝපකාර සලකා ඒ අය වෙනුවෙන් ධාන්‍යවලින් කොටසක් වෙන් කරල, මහා සංඝයා වහන්සේ වෙත දානයක් පූජා කරල පින් අනුමෝදනාවක් කරනවා.

**අසල්වාසීන්, දුප්පතුන් සහ සතුන්ටත් කොටසක් අයිතියි.**

කෙත් වතු අවට වාසය කරන අසල්වාසීන් අනියම් ආකාරයකින් හෝ ඒවා රැකබලා ගන්න දායක වෙන නිසා ඒ අයටත් ඒවායේ හිමිකමක් තියෙනවා. උපකාරයට කෘතෝපකාර සලකා ඒ අයටත් කොටසක් වෙන් කරන සිරිතක් පැරැණ්නන් ළඟ තිබුණා. ලෝක සත්ත්වයින් අසාධාරණ විදියට හිමි කර ගත් දේවල් නිසා දුගී දුප්පත් බවට පත් වූ දුගී මගී යාචකාදීන්ටත් කොටසක් වෙන් කරල දෙන සිරිතක් අතීතයේ තිබුනා. වැට කඩොලු බැඳ ගැනීමෙන් තමන්ගෙ හිමිකම අහිමි වූ සතුන්ට හිමි කොටස ඒ අයට දෙන්න, බලු කපුටු ආදී සියලු සතුන්ට දානයක් පිළියෙල කරල දෙනවා. ඈත අතීතයේ මිනිස්සු තමන් වගා කරන කුඹුරුවලින් ලියද්දක්ම කුරුල්ලන්ට වෙන් කළා. සමහර ග්‍රාමීය පෙදෙස්වල පැරණි අය භාවිතා කරපු මේ ණය ගෙවීමේ ක්‍රම අදත් ක්‍රියාත්මක වෙනවා. සමහර සත්ත්ව කොටස් හීනයන් බවට පත්වෙන විදියට, අසාධාරණව අන්‍යයන් සතු දේ හිමි කර ගැනීමේ විපාක වශයෙන් යම් යම් අපල උපද්‍රවයන්, විවිධ දුක් කරදර පැමිණෙන කොට ඒවා සෙනසුරු අපල විදියට සලකල කපුටු දාන දෙන්නෙත් ඒ නිසා.

ඒ අය දන් අපට උදව් උපකාර නොකළත්, පෙර ඒ අයට හිමි වෙලා, ඒත් දැන් අහිමි වෙච්ච කොටස නැවත දෙන්න ඕන. එතකොට උපකාරයට කෘතෝපකාරය සැලකීමක් වශයෙන් දෙන එක වෙනම ගුණයක්. නමුත් පොදුවේ මේ සියලු දෙනාටම හිමි වෙච්ච හිමිකම ලබාදීම අනිවාර්යෙන්ම කරන්න ඕන.

මේ නිසා රැකියාවකින් හෝ ව්‍යාපාරයකින් හෝ කවර ආකාරයකින් හෝ මුදල් උපයා ගත්තත්, අන්‍යයන්ට අයත් අසාධාරණ කොටසක් තමන්ගෙ ආදායමට ඇතුලත් වෙලාද කියල අවංකව සොයල බලල නිදහස් වීම නිවන් මගට හේතු වෙනවා. රැකියා කරල හරි, ව්‍යාපාරයක් ගොවිතැනක් කරල හරි, වෙහෙසෙන්න වෙන්නෙ පෙර කරපු අසාධාරණයන්ට වන්දි ගෙවන්න. **කෙනෙක් දහඩිය මහන්සියෙන් හරි හම්බ කරල සාධාරණව උපයාගත් දෙයකින් දෙන දානයේ ආනිසංස වැඩියි.** ඒ විදියට සාධාරණව උපයන පුද්ගලයට අභිවෘද්ධියක් මිස පිරිහීමක් නෑ කියල බුද්ධ දේශනාවල සඳහන් වෙනවා. මේ නිසා ඊළඟ කන්නවල සශ්‍රීකත්වයත් වැඩි වෙනවා. බාධක දුරුවෙලා ක්ෂුද්‍ර ජීවීන්, කෘමීන් වගේ සතුන්ගෙන් සිද්ධවෙන හානිත් නැති වෙනවා. පැරණි මුතුන් මිත්තන් මේ ආකාරයට කරගෙන ගිය චාරිත්‍ර වැනසිලා ගිය නිසා තමයි අද කෘමි උවදුරු වැඩි වෙලා අස්වැන්න පවා අඩුවෙලා තියෙන්නෙ.

චාරිත්‍ර කියන්නෙ ආර්යන් කරගෙන ගිය වැඩ පිළිවෙල. ච+අරිය+අත්‍ර යන වචන එකතු වෙලා තමයි මේ වචනය හැදිල තියෙන්නෙ. ආර්ය චින්තනයේ ආකාරයට කර ගෙන ගියේ චාරිත්‍ර. ආර්යන් වළකා දැමූ දේවල් වාරිත්‍ර. (ව+අරිය+අත්‍ර - වාරිත්‍ර) ආර්යන් ඇසුරු කරපු දේවල් හෙළයන් ඇසුරු කළා. ආර්යන් වැළකූ දේවල් හෙළයන් බැහැර කළා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*


**ඇල්. අමරසිංහ**
**(විශ්‍රාමික ලංකා බැංකු ජ්‍යෙෂ්ඨ කළමනාකරු)**
**පිළියන්දල.**

# ලොවුතුරා බුදුන් වහන්සේට සුවිශේෂ වූ අෂ්ඨ මධුර ස්වර...

(පසුගිය කලාපයෙන්: ශබ්ද විද්‍යාව සමග බැඳුණු නැකත් ශාස්ත්‍ර ආදියේ බලපෑම් .......)

ශබ්ද විද්‍යාව ගැන කතා කරන කොට තවත් වැදගත් කොටසක් තමයි අෂ්ඨ මධුර ස්වර හෙවත් අෂ්ඨ බ්‍රහ්ම ස්වර කියන්නෙ. ඒ කාරණය වැදගත් වෙන්නෙ විශේෂයෙන් ලොවුතුරා බුදුන් වහන්සේට පිහිටන ලක්ෂණයක් නිසා. අෂ්ඨාංග සමුපෙත් මධුර ස්වරය කියන්නෙත් ඒකට. මෙතනින් පෙන්වන්නෙ ධර්ම දේශනාවකදි උන් වහන්සේගෙ හඬේ තියෙන විශේෂාංග 8 ක්. ඒ වගේම ඒ කාරණය බ්‍රහ්මයාට උපමා කිරීමෙන් තමයි බ්‍රහ්ම ස්වර කියල කියන්නෙ. ඒ කියන්නෙ බ්‍රහ්මයගෙ හඬ එන්නෙ වා පිත් සෙම්වලින් සම්බන්ධයක් නැතිව. ඒ වගේම බ්‍රහ්මයා ලෞකික සතර බ්‍රහ්ම විහරණවලින් යුක්තයි. එතකොට මේ ලක්ෂණ බ්‍රහ්මයටත් එක්තරා මට්ටමකින් පිහිටනවා. ඒ කියන්නෙ ලෞකිකත්වය තුළ ඉන්න අයගෙන් මේ අෂ්ඨ බ්‍රහ්ම ස්වරය උපරිමයට තියෙන්නෙ බ්‍රහ්මයට. නමුත් ඒක 100% ක්ම පූර්ණව පිහිටන්නෙ ලොවුතුරා බුදුන් වහන්සේ නමකට විතරයි. බ්‍රහ්මයා ඇතුළු අනෙක් අයට ඊට අඩුවෙන් තමයි පිහිටන්නෙ. එතකොට නියම විදියට මහා බ්‍රහ්ම කියන්නෙ ලොවුතුරා බුදුන් වහන්සේට. බ්‍රහ්ම ලෝකෙ ඉන්න අය නිකං බ්‍රහ්ම. ඒ වගේම ඒ ලෞකික බ්‍රහ්ම. ලෝකෝත්තර පැත්ත ගත්තම නියම විදියට බ්‍රහ්ම වෙන්නෙ රහතන් වහන්සේ, මහා බ්‍රහ්ම වෙන්නෙ බුදුන් වහන්සේ. ඊළඟට උන් වහන්සේට බ්‍රහ්මාතිබ්‍රහ්ම කියලත් කියනවා. අති කියන්නෙ ඉහළ කියන එක. නැත්නම් ඉක්මවා ගියා කියන එක. ඒ කියන්නෙ බ්‍රහ්මත්වය ඉක්මවා ගිය, බ්‍රහ්මයන්ගෙනුත් බ්‍රහ්ම කියන එක. වෙනත් විදියකින් කියනව නම් ලෝකෝත්තර බ්‍රහ්ම ගුණයෙ උපරිමය. ඒ වගේම බුදුන් වහන්සේට දේවාතිදේව කියලත් කියනවා. ඒ කියන්නෙ දෙවියන් ඉක්මවා ගිය තත්ත්වය. කොටින්ම කියනව නම් දෙවු බඹුන් ඉක්මවා ගිය දේවත්වයක් සහ බ්‍රහ්මත්වයක් තමයි බුදුන් වහන්සේට තියෙන්නෙ. එතකොට මේ අෂ්ඨ බ්‍රහ්ම ස්වර කියල කියන්නෙ ඒ බ්‍රහ්මත්වයට පිහිටන ලක්ෂණ 8 ක්.

විස්සට්ඨී, මඤ්ජු, විඤ්ඤෙය්‍යය, ස්වණීය, අවිසාරි, බිංදු, ගම්භීර සහ නින්නාද කියන්නෙ මේ අෂ්ඨ මධුර ස්වර. දැන් මේ එකින් එක අරගෙන පොදුවේ කෙටියෙන් විග්‍රහ කරල බැලුවොත්, **විස්සට්ඨී කියන්නෙ නිකුත් කොට උසුරුවන ලද හඬ ඇති කියන අර්ථය.** ඒ කියන්නෙ අක්ෂර, ගණ, මාත්‍රා හරියටම 100% ක්ම ශබ්ද විද්‍යානුකූලවම ගැලපිලා එන හඬක් තමයි උන් වහන්සේට තියෙන්නෙ. ඒ නිසා මාත්‍රා පනින්නෙ නෑ. දීර්ඝාක්ෂරයකට මාත්‍රා 2 ක්, කෙටි අක්ෂරයකට මාත්‍රා 1 ක්, අල් අක්ෂරයකට මාත්‍රා 1/2 ක් ලෙසත් ඒ ඒ අක්ෂරවලට අවශ්‍ය මාත්‍රා ගණන හරියටම ගැලපිලා එනවා. එතකොට ඒ අවශ්‍ය ගාණට අක්ෂර, ගණ වෙන් වෙනවා, පද වෙන් වෙනවා.



කොතැනකවත් අපැහැදිලි ස්වභාවයක් නෑ.

ඊළඟට **මඤ්ජු කියන්නෙ දහම් මිහිර.** ඒ කට හඬ කොච්චර අහගෙන හිටියත් රළු නෑ, ගොරෝසු නෑ. ඒ වගේම **මේ මිහිරි බව ගැන කියන කොට ගූතභානි, පුෂ්පභානි, මධුභානි කියල ක්‍රම 3 ක් තියෙනවා.** කෙනෙක් කතා කරන කොට දුර්ගන්ධ කතා කියනව නම් ඒවා අසූචි වගෙයි. කෙනෙකුට පහර ගහන්න, නින්දා අපහාස කරන්න, බනින්න ගන්න ඒ වගේ කතා විලාසය තමයි ගූතභානි කියන්නෙ. ඒ ස්වභාවය බුදුන් වහන්සේගෙ අහලකවත් නෑ. **උන් වහන්සේට තියෙන්නෙ පුෂ්පභානි, මධුභානි කියන ස්වභාවයේ කතා විලාසයක්.** ඒ කියන්නෙ ඒ කතාව බොහොම ළයාන්විතයි. හදවතට දැනෙනවා. කෙනෙකුගේ හිත ඇදෙන හඬක්. සැඩ පරුෂ බවක් ඇත්තෙම නෑ. මධුභානි කිච්චම, දහම් රසය දෙන මිහිරි හඬ අහගෙන ඉන්න අයට ඇති කරනවා. ඒ කියන්නෙ කතා කරන කොට කෙනෙකුට පහර ගහන්නෙ නෑ, හිත නොරිදෙන විදියට, නිවෙන විදියට තමයි කතා කරන්නෙ. මේ තමයි පොදුවේ මඤ්ජු කියන ලක්ෂණයේ ස්වභාවය.

**විඤ්ඤෙය්‍යය කියන්නෙ අර්ථාවබෝධය ලැබෙන පරිදි හේතු ඵල දහම ක්‍රමානුකූලව විග්‍රහ කරල දීම.** මේකයි හේතුව, මේකයි ඵලය කියල මුල, මැද, අග ගලපල එකින් එකට විග්‍රහ කරල දෙන දහම් ක්‍රමයක්. ඒ කියන්නෙ ඉධමේව සච්චං මෝඝ මඤ්ඤං කියන, මේකයි ඇත්ත අනික්වා බොරුයි කියන ක්‍රමයක් බුදුන් වහන්සේට නෑ. නමුත් සාමාන්‍ය ලෝකයාගේ සිරිතක් තමයි, මම කියන දේ ඇත්ත, අනික් අය කියන දේ බොරුයි කියන ක්‍රමවේදය. බුදුන් වහන්සේ කොතැනක දහම් දේශනා කළත් එහෙම ක්‍රමයක් නෑ. මෙන්න මේ හේතුව උඩ ඇත්ත කියන්නෙ, මේක බොරු කියන්නෙ මේ හේතුව උඩ, මේක මෙහෙමයි වෙන්නෙ කියල නුවණින් හිතල බලන්න .... ආදී වශයෙන් දහම් දේශනා කිරීම තමයි උන් වහන්සේගෙ ක්‍රමවේදය. උන් වහන්සේට ආසය අනුසය ඥානයත්, ඉන්ද්‍රිය පරෝපරියන්ත ඥානයත් තියෙන නිසා ඒ ඒ පුද්ගලයට ගැලපෙන විදියට එල්ල කරලම අදාල දේශනාව කරනවා. යම්කිසි පිරිසක් නම් ඒ පිරිසටම අවශ්‍ය කොටස එල්ල කරලම දෙනවා. එතකොට තමයි අහගෙන ඉන්න අයට අර්ථාවබෝධය ලැබෙන්න හේතු වෙන්නෙ.

ඊළඟට **ස්වණීය කියන්නෙ ඇසීමට පහසු ස්වභාවය.** ඒ කියන්නෙ ඒ හඬේ රැල් බුරුල් නෑ. මොකද පෙළක් අය කතා කරන කොට සෙම හිර වෙලා උගුර පැටලෙනවා. එතකොට කතාවට ජර බර ශබ්ද එනවා. සමහර අයගෙ ශබ්දය ගොරෝසුයි, හැඩි දැඩියි. හරියට දෙල් කොළ උඩින් කබරු යනව කියල කතාවට කියනව වගෙයි. එතකොට ඒ කතාව තේරෙන්නෙ නෑ. අහන කෙනෙකුට ☞

පැහැදිලි නෑ. පැහැදිලි හඬක් එන්න නම් දිව, කට, තොල්, ස්වර තන්ත්‍ර ආදී මේ සියල්ලම ක්‍රමානුකූලව පිහිටල නැමෙන්න, චලනය වෙන්න ඕන. ශබ්ද කරන කොට අවශ්‍ය තැනට නියම අක්ෂරය ශබ්ද වෙන්න නම් මේ ඉන්ද්‍රියන් සියල්ලක්ම ඊට අනුකූලව චලනය වෙන්න ඕන. බුදුන් වහන්සේගෙ ඒ ගති ලක්ෂණය 100% ක්ම පිහිටනවා. ඒ නිසා හැම වචනයකම අකුරක් අකුරක් ගානෙ ස්වර පැහැදිලියි. ඒ ස්වරවල ලෙළදෙන ස්වභාවයක් තියෙනවා. ඒකට ස්වර හඤ්ඤය කියලත් කියනවා.

**අවිසාරි කියන්නෙ කතා කරන කොට අවම හඬ පැතිරෙන ලෙස කතා කිරීම.** හැබැයි ඒ කාරණය මේ විදියට තේරුම් ගන්න ඕන. සමහර අය කතා කරනකොට හිමින් කියන දේවල් අහගෙන ඉන්න නම් කන් ඒ පැත්තට යොමා ගෙනම ඉන්න ඕන. සමහර අය කන් බීරි වෙන්න එක පාරටම හයියෙන් කතා කරනවා. අනික් සැරේ කනට ඇහෙන්නෙත් නැති ගානට හිමින් මුමුණනවා. එතකොට අහගෙන ඉන්න අයට හරි අපහසුයි. නමුත් බුදුන් වහන්සේට එහෙම ස්වභාවයක් නෑ. අවම හඬ කිව්වම ඒ අවමයත් හොඳට පැහැදිලියි, තේරෙනවා. අඩු හඬ අඩු විදියටත්, වැඩි හඬ වැඩි විදියටත් දූනෙනව මිසක් අර වගේ නොතේරෙන, කංකරච්චල ස්වභාවයක් නෑ. අපහසුවෙන් අහගෙන ඉන්න දෙයක් නෑ. ගඟ ගලනව වගේ ක්‍රමානුකූල උස් පහත්වීම් තමයි උන් වහන්සේගෙ කථාවට තියෙන්නෙ. ඒක ලතාවකට ගලාගෙන යනවා. නමුත් ඇලක් දොලක් ගලන කොට එහෙම නෑ. ඒවායෙ විසාල උස් පහත්වීම් බොහොම අක්‍රමවත්ව තැනින් තැන තියෙනවා. වෙලාවකට ජලය උඩ විසි වෙනවා, වෙලාවකට පහළට විසි වෙනවා, තවත් වෙලාවකට පැත්තකට විසි වෙනවා, පෙණ බුබුළු දානවා, ඝෝෂාකාරී ශබ්ද එනවා. එහෙම ගලන ස්වභාවයක් තමයි ඇලකට, දොළකට තියෙන්නෙ. සමහර දේශකයන්ගෙ කතාවත් එහෙමයි. නිකං රඟ පාන්න යනවා. රහසක් එහෙම කියන්න ගියොත් බොහොම හිමින් කියල, ඊට පස්සෙ එක පාරටම හයියෙන් කතා කරනවා.

නමුත් බුදුන් වහන්සේ දහම් දේශනා කරන කොට මේ උස් පහත් වීම් අවශ්‍ය මට්ටමට ක්‍රමානුකූල රටාවකටමයි ගෙනෙන්නෙ. ඒක සාමාන්‍ය අයගෙ වගේ පහතටම යන්නෙත් නෑ, උඩටම යන්නෙත් නෑ. ඒ වගේම මහප්‍රාණ කරන්නෙත් නෑ. නමුත් බමුණො නම් තමන්ගෙ මාන්නක්කාරකම, අහංකාරකම පෙන්වන්න සංස්කෘත භාෂාවෙන් මහප්‍රාණ කරල කියනවා. මොකද සංස්කෘත භාෂාව කියන්නෙ හැම වෙලේම මහප්‍රාණ කරල කතා කරන භාෂාවක්. නමුත් ඒක ගැලපෙන්නෙ නෑ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ දේශනා කළේ, මේ දහම සංස්කෘත භාෂාවට නගන්න එපා කියල. ඒ වගේම බොහොම හීන වෙලා කතා කරන ස්වභාවයක් සමහරුන්ට තියෙනවා. ඒ කියන්නෙ හුගක්ම බැගෑපත් වෙලා කතා කරන කොට ඒ කටහඬ හරියට ඇහෙන්නෙ නෑ, ඒකෙ විශ්වාසනීය භාවය අඩු වෙනවා. එහෙම කතා ස්වභාවයක් බුදුන් වහන්සේට නෑ. ඒ නිසා **අහංකාර කතාවත්, බැගෑපත් කතාවත් උන් වහන්සේට නෑ.** අවශ්‍ය ප්‍රමාණයට ඒ කතාව සකස් වෙලා ගලාගෙන එනවා.

ඒ වගේම **සීමාව ඉක්මවා හඬ පැතිරෙන්නෙ නෑ.** ඒකත් අවිසාරී කියන ලක්ෂණයේ ස්වභාවයක්. ඒක අධිෂ්ඨානයකින් කරන දෙයක්. බණ අහන පිරිස කොච්චර ඈතකින් හිටියත් ඒ සීමාවට හඬ යන්න අධිෂ්ඨාන කරල දෙනවා. හැබැයි සීමාව ඉක්මවා යන්නෙත් නෑ. ඒ කියන්නෙ **බණ අහන පිරිසට මිසක් අහන්නෙ නැති පිරිසට නිකරුණේ අහන්න සලස්වන්නෙ නෑ.** මොකද අකමැති අයට ඒ බණ ඇහුනොත්, ඒක මහ කන්දොස්කිරියාවක්, අපට වැඩක් නැති ඒව කියනව.... ආදී වශයෙන් කියල මිනිස්සු අපවාද කරගන්න පුළුවන්. **උන්වහන්සේ යම්කිසි සීමාවකට අධිෂ්ඨාන කළාම එතනින් එහාට අඟලක්වත් ඒ හඬ යන්නෙ නෑ. එතනින් ඉරක් ගැහුවොත් ඒ ඉරෙන් එහාට පොඩ්ඩක්වත් හඬ යන්නෙ නෑ. ඉර මැද හිටියොත් එක කනකට ඇහෙනවා, අනෙක් කනට ඇහෙන්නෙ නෑ. ඒ වගේම එක කනක් ඒ සීමාවට ළං කළොත්, ඒ කනට විතරක් ඇහෙනවා, අනෙක් කනට ඇහෙන්නෙ නෑ. උන්වහන්සේගෙ අධිෂ්ඨාන බලය නිසා ඒ තරම් කෙස් ගහටම ඒ මිම්ම පිහිටනවා.**

එතකොට බණ අහගෙන ඉන්න පිරිස බුදුන් වහන්සේ ළඟින් හිටියත්, කොච්චර ඈතක ඉඳන් අහගෙන හිටියත් ඒ සියළු දෙනාටම උන් වහන්සේ ළඟ ඉන්නව වගේ තමයි හැඟීම එන්නෙ, ඇහෙන්නෙ. පුද්ගලය ඈතින් හිටියත් බණ අහන කොට දුරස් බවක් හැඟෙන්නෙ නෑ. ළඟින් හිටියත් එකයි, ඈතින් හිටියත් එකයි. කියන බණ ඒ හැමෝටම ඇහෙනවා. ඒක උන් වහන්සේගෙ අධිෂ්ඨානයේ හැටි. ඒ කියන්නෙ අනෙක් අය හඬ පිට කරන විදියට නෙවෙයි උන් වහන්සේ හඬ පිට කරන්නෙ. එතනදි උන් වහන්සේ අධිෂ්ඨාන කරල යම්කිසි හැඟීමක් යවනවා. වාතය කම්පනය වෙන්නෙ ඒ අධිෂ්ඨානය හා හැඟීම අනුව. එතකොට ළඟ ඉන්න කෙනෙකුට යම් ඇහෙන මට්ටමක් තියෙනවද, ඒ මට්ටමට අධිෂ්ඨාන කළාම වාතය ඒ සීමාවට යනකල් අනුකූලව කම්පනය වෙනවා. කොච්චර ඈතට ගියත් උන් වහන්සේ අධිෂ්ඨාන කරපු ප්‍රමාණයටම තමයි වායු කම්පනය වෙන්නෙ. ඒක අඩු වැඩි වෙන්නෙ නෑ. මොකද ඒක අධිෂ්ඨානයෙන් කරන වායු කම්පනයක්. ඒ කියන්නෙ වායුවේ කම්පනය උන් වහන්සේගෙ පාලනයට, ශක්තියට නතු වෙනවා. සාමාන්‍ය අය කතා කරන කොට වගේ වායුවට ඕන විදියට ඉබාගාතේ කම්පනය වෙන්නෙ නෑ. එතකොට අධිෂ්ඨාන කළාම ඒ කම්පන තරංග ගමන් කරන්නෙ ඊට අනුකූලවමයි. ඈතට ගියයි කියල ඒ කම්පන තරංගවල ප්‍රබලත්වය අඩු වෙන්නෙ නෑ. නමුත් සාමාන්‍යයෙන් කෙනෙක් කතා කරන කොට ඒ ශබ්දය ඈතට යන්න යන්න අඩු වෙනවා. ඒ නිසා ළඟ ඉන්න අයට විතරයි ඒක පැහැදිලිව ඇහෙන්නෙ. නමුත් එහෙම ස්වභාවයක් බුදුන් වහන්සේට නෑ. ඊළඟට **චිත්ත කිරණ තරංගාකාරයෙන් යවල කෙනෙකුගෙ හදවතට හැඟීම් යවන්නත් උන් වහන්සේට පුළුවන්.**


ඒ වගේම සමහර අභිඤ්ඤා-ලාභීන්ටත් මේ අෂ්ට බ්‍රහ්ම ස්වරවලින් එක්තරා මට්ටමක් පිහිටන්න පුළුවන්. මොකද විශේෂයෙන් ඒ කාලෙ හිටපු අභිඤ්ඤාලාභී මහරහතන් වහන්සේලා ලක්ෂ ගණන් පිරිසකට ධර්ම දේශනා කරන කොට ළඟ ඉන්න අයට විතරක් නෙවෙයි, ඈත ඉන්න පිරිස්වලටත් ඇහෙන්න ඕන. එතකොට ඒ කාලෙ අද වගේ ශබ්ද විකාශන යන්ත්‍ර තිබුණෙ නෑ. කටින්මයි කතා කළේ. එහෙනම් එක්කෙනෙක් කොහොමද දස දහස් ගාණකට, ලක්ෂ ගාණකට එකවර ඇහෙන්න කථා කළේ? නමුත් එච්චර පිරිසක් බණ අහල තියෙන බව ඉතිහාසයේ සඳහන් වෙනවා. සමහර වෙලාවට ඉඩ මදි වෙලා ඇත් ගාල, අස්ව ගාල ආදියත් ඉවත් කරල ඉඩ හදාගත්තයි කියනවා. එතකොට ඒ තරම් විශාල ප්‍රදේශයක ඉඩක් ගත්ත නම් කොච්චර පිරිසක් බණ අහන්න ඉඳල තියෙන්න ඕනද? ඒ සියල්ලන්ටම ඇහෙන්න කතා කළේ කොහොමද? නමුත් ඒ වෙලාවෙදි උන් වහන්සේලාගේ අභිඤ්ඤා ශක්තිය නිසා, ඒ හැම දෙනාටම ඇහෙන්න බණ කියන්න පුළුවන්. මොකද එහෙම දෙයක් දහමෙත් සඳහන් වෙනවා.

මීට පෙර වැඩ හිටපු ☞

ලොවුතුරා බුදුන් වහන්සේ නමකගෙ කාලෙ එක්තරා අභිඥාලාභී රහතන් වහන්සේ නමක් වැඩ හිටියා. අගසවු නමක් වෙච්ච උන් වහන්සේ බුදුන් වහන්සෙත් එක්ක බඹ ලොවට වැඩල ඒ බඹ ලොවේ ඉඳන් දස දහසක් සක්වලට ඇහෙන්න නාදයක් කළැයි කියනවා. **ආරහත නික්ඛමත - යුඤ්ජත බුද්ධ සාසනේ - දුනාථ මච්චුනෝ සේනං - නලා ගාරඤ්ව කුඤ්ජරෝ** කියන ගාථාව තමයි ඒ විදියට නාද කළැයි කියන්නෙ. කාමයන්ගෙන් නික්මිලා නෙක්ඛම්මයට පත්වෙන්න වීර්ය කිරීම ආරම්භ කරන්න, ඒ සඳහා බුද්ධ සාසනයේ යෙදෙන්න, ඇතෙකුට බට ලීවලින් හදපු ගෙයක් පොඩි පට්ටම් කරල දාන එක සුළු දෙයක් වගේ, ඒ ශක්තියෙන් මාර සේනාවෙ බලයත් සුණු විසුණු කරල දාන්න. මේ තමයි ගාථාවෙ සිංහල තේරුම. ඊළඟට නැවතත් මනුස්ස ලෝකෙට වැඩල, බුදුන් වහන්සේ ශ්‍රාවකයන්ගෙන් අහනවා, ඔබලට හඬ ඇහුනද කියල. සියලු දෙනාම, අපිට ඇහුනයි කිව්වා. මොකක්ද ඇහුනෙ කියල ඇහුවම, ඔය ගාථාව කියනව ඇහුනයි කිව්වා.

එතකොට එච්චර ඈතකට ඇහෙන්න කතා කරන්න පුළුවන් හැකියාවක් බුද්ධ ශ්‍රාවකයන්ටත් තියෙන බවට මේ කාරණය හොඳ සාධකයක් වෙනවා. ඒ සාධකයට අනුව ඒ වගේ අභිඥාලාභීන් කතා කරන කොට, අවශ්‍ය නම් ඒ හඬ යම් දිහාවකට සීමා කරල යවන්නත් පුළුවන්. මෙතනදි දස දහසක් සක්වලට ඒ හඬ යවපු බව කියවෙනවා. එතකොට අපිට ඒ කාරණය පිළිගන්න පුළුවන්. මොකද එහෙම නැත්නම් දහස් ගණනක්, ලක්‍ෂ ගණනක් එකතු වුනාම බණ දේශනා කළේ මොන හැකියාවකින්ද කියන ගැටළුව මතු වෙනවා. ඒක අද කාලෙට ගලපන්න බෑ. අද නම් ශබ්ද විකාශන යන්ත්‍ර දාල ඈත ඉන්න අයටත් එහෙම ඇහෙන්න සැලැස්සුවොත්, ළඟ ඉන්න අයගෙ කන් බීරි වෙන්නත් පුළුවන්. නමුත් අර අභිඥා ශක්තිය, අෂ්ඨ බ්‍රහ්ම ස්වරය උපයෝගී කරගෙන බණ කියන කොට එහෙම ගැටළුවක් නෑ. අධිෂ්ඨාන කරල දේශනා කරන කොට ළඟ ඉන්න අයට ඇහෙන ශබ්දයම ඈත ඉන්න අයටත් ඇහෙනවා.

ඊළඟට මේ අෂ්ඨ මධුර ස්වරවලින් **බිංදු කියන්නෙ මුක්ඛන් නැති හඬ.** ඒ කියන්නෙ කතාවට අවශ්‍ය කරන්නා වූ හඬ එන්න ඉන්ද්‍රියන් නිසියාකාරව පිහිටල තියෙනවා. බුදුන් වහන්සේගෙ ශ්‍රී මුඛය පිහිටල තියෙන්නෙ නියම විදියට කිසිම අඩුවක් නැතිව ක්‍රමානුකූලව ශබ්දය පිටවෙන විදියට. දත්, දිව, තොල්, හකු, ස්වර තන්ත්‍ර ආදී සියල්ලම ඊට ගැලපෙන්න වෙනත් කිසිම කෙනෙකුට නොපිහිටන විදියට විශේෂයෙන් පිහිටල තියෙනවා. මොකද පෙළක් අය කතා කරන කොට විවිධාකාරයෙන් මුක්ඛන් ශබ්ද එනවා. නාහෙන් කතා කරන මුක්ඛන් ගතිය කියන්නෙත් ඒකට. ඒකෙ අසාමාන්‍ය විකෘති ස්වභාවයක් කෙනෙකුට පිහිටනව නම් ඒකත් ඉතින් කර්ම විපාකයක්ම තමයි. නමුත් සාමාන්‍ය අයගෙ ඒ විදියට විකෘති වෙලා නොපිහිටියත්, බුදුන් වහන්සේගෙ වගේ 100% ක්ම පරිපූර්ණ ආකාරයෙන් පිහිටන්නෙ නෑ. ඊට අඩුවෙන් තමයි පිහිටන්නෙ.





ඊළඟට **ගම්භීර කියන්නෙ ගැඹුරු හඬ. ඒ කියන්නෙ හද පත්ලෙන්ම නැගෙන හඬ.** ඒක හක් ගෙඩියෙ හඬට තමයි උපමා කරන්නෙ. ඒ හඬ ඇහෙන කොට හිත ඇදිල යනවා. හක් ගෙඩියක් පිඹින කොට මුලින්ම එක්තරා හඬක් සියුම්ව ක්‍රමානුකූලව නැගිල, එක පාරටම හක් ගෙඩියෙ සිදුරෙන් රැල්ලෙන් රැල්ලට ගිහින් දෝංකාර දීල පිට වෙනවා. මේ විදියට බුදුන් වහන්සේගෙ ග්‍රීවා ධාතුවෙන් නැගෙන ශාන්ත හඬ ඒ ග්‍රීවා ධාතුවේ පිහිටල තියෙන රැලි නිසා දෝංකාර දීගෙන තමයි පිට වෙන්නෙ. ඒක හරිම පැහැදිලි ගාම්භීර හඬක්. සක් හඬ හෙවත් සුද්ධ හඬ කියන්නෙත් ඒකයි. ඒක අනිත් අයට ඒ විදිහට කරන්න බෑ.

මෙතනදි දැනට පොත් පත්වල දකින්න නැති සමාධියට ගෝචර වෙන කාරණයක් තියෙනවා. ඒ කියන්නෙ කෙනෙක්ගෙ හඬේ කම්පන තරංග උත්පාදනය වෙන ක්‍රමයක්. **යම් කිසි කෙනෙක්ගෙ ස්වාස නාලයත් එක්ක උගුරෙ ග්‍රීවය සීමාවෙ කම්පන ඇති කරන රැලි 108 ක් උපරිම වශයෙන් පිහිටල තියෙනවා.** සාමාන්‍යයෙන් ස්ත්‍රියකගෙ පිහිටල තියෙන්නෙ ඒ වගේ රැලි 2-3 යි. එතකොට ඒකෙන් ඇති වෙන්නෙ බොහොම ළාමක හඬක්. සාමාන්‍යයෙන් පිරිමි කෙනෙකුට ඒ වගේ රැලි 4-5 ක් වගේ ප්‍රමාණයක් පිහිටල තියෙනවා. ඒ නිසා තමයි ඊට වඩා ටිකක් ගැඹුරු හඬක් පිරිමි අයට තියෙන්නෙ. ඒ වගේම ඒ පිහිටල තියෙන රැලි ගණනින් කොටසක් විතරක් කම්පනය කරන්න පුළුවන් අයත් ඉන්නවා. ඒ නිසා තමයි සමහර පිරිමින්ට ගැහැණු හඬින් කථා කරන්න පුළුවන් වෙන්නෙ. ඒ වගේම සැරියුත් මහ රහතන් වහන්සේගෙ මේ රැලි 20 ක විතර ප්‍රමාණයක් පිහිටල තිබිල තියෙනවා. **ලොවුතුරා බුදුන් වහන්සේගෙ මේ රැලි 108 ම පූර්ණව පිහිටල තියෙනවා. ඒ විදියට 108 ම පිහිටල තියෙන්නෙ ලොවුතුරා බුදුන් වහන්සේ නමකට විතරයි.** ඒක තමයි උන් වහන්සේගෙ කට හඬේ තියෙන සුවිශේෂත්වය. ඒ රැලි 108 ම කම්පනය වෙලා තමයි අර ගම්භීර කියන සක් හඬ එන්නෙ. ඒ වගේම මෑත කාලීනව මේ හඬින් මාත්‍රයක් හරි තිබ්බෙච්ච කෙනෙක් තමයි පානදුරේ අරිය ධම්ම හාමුදුරුවො. සමාධියට ගෝචර වෙන විදියට උන් වහන්සේට ඒ වගේ රැලි 7 ක් විතර පිහිටල තිබිල තියෙනවා. ඒ නිසා තමයි උන් වහන්සේගෙ හඬෙත් එක්තරා ගැඹුරු දෝංකාර ගතියක් ආවෙ. ඒ නිසා ඒ ක්‍රමය අනික් අයට අනුකරණය කරලවත් අල්ල ගන්න බැරි වුණා. ඒක හරි විශේෂයි. හැබැයි මේ කාරණය සමාධියට ගෝචර වෙන එකක් මිසක් වෙන විදියකට හොයාගන්න පුළුවන් දෙයක් නෙවෙයි.

ඊළඟට **නින්නාදය කියන්නෙ දෝංකාර දෙන, පැතිරී යන මිහිරි සුසිනිඳු ස්වභාවය.** තවත් විදියකින් කියනව නම් ලෙලදෙන, රැව්දෙන ස්වභාවය. අද ඉංග්‍රීසියෙන් Eco (එකෝ) කියල කියන්නෙත් ඒ වගේ දෙයක්. ඒ නින්නාදය ඈතට විහිදෙනවා. එබඳු ශබ්ද ක්‍රමයක් තමයි මේ කියන්නෙ. හැබැයි ඒකත් සීමාව ඉක්මවා යන්නෙ නෑ. ඒ වගේම හඬ

පැහැදිලියි. උදාහරණ විදියට ඇහුනද කියල ඇහුවොත්, ඇහුනද?... ඇහුනද?... ඇහුනද?... ආදී වශයෙන් කිහිප වතාවක් නින්නාද වෙනවා. ඒ කියන්නෙ **එක වතාවකින් තේරුම් ගන්න බැරි අයට ඒක දෙතුන් වතාවක් ඇහෙන්න සලස්වනවා.** යමක් එක පාරටම කිව්වම අවධානය යොමු වුනත්, ඒ කිව්ව කාරණය තේරුම් ගන්න බැරි වෙන්න පුළුවන්. එතකොට ඒකම නැවතත් ඇහෙන්න සලස්වනවා. ඒ වගේ දෙයක් තමයි මේ කියන්නෙ. ඒක කතා කරන හඬත් එක්කම අභ්‍යන්තරයෙන් හිතෙන් නැගෙන හඬක්. එතකොට අධිෂ්ඨාන කරල කිව්වම ඒක පුද්ගලයගෙ හිතට වදිනවා. ඒ පුද්ගලයට ගැලපෙන විදියට ඒක හිතට ගෝචර වෙනවා. කිව්ව දේ අවබෝධ කරගන්න ඒක හරි විශේෂයි.

ඒ වගේම **කතා වේගය ගත්තොත් ආනන්ද හාමුදුරුවන්ට සාමාන්‍ය පුද්ගලයෙක් කතා කරන වේගය වගේ 8 ගුණයක වේගයකින් දේශනා කරන්න පුළුවන් බව සඳහන් වෙනවා. ආනන්ද හාමුදුරුවො කතා කරන වේගය වගේ 8 ගුණයක වේගයක් (සාමාන්‍ය කෙනෙක්ගෙ වගේ 64 ගුණයක්) සැරියුත් මහ රහතන් වහන්සේට තිබුණා. සැරියුත් මහ රහතන් වහන්සේ කතා කරන වේගය වගේ 8 ගුණයක් (සාමාන්‍ය කෙනෙක් කතා කරන වේගය වගේ 512 ගුණයක වේගයක්) ලොවුතුරා බුදුන් වහන්සේට තිබුණා.** අද කාලෙ නම් මනසට හිතාගන්නත් බැරි තරම් වේගයක්. නමුත් එච්චර වේගයකින් කතා කළත් අහන් ඉන්න හැම කෙනාටම හොඳට පැහැදිලිව තේරෙනවා. ඒක තමයි විශේෂත්වය. හැබැයි උන් වහන්සේ ඉදිරියේ ඉඳගත්තම හේතු වාසනා තියෙන අයටමයි ඒ විදියෙ වේගයෙන් කියලත් වැටහෙන්නෙ. මොකද ඒ වගේ වෙලාවකදි පුද්ගලය සමාධියට පත් වෙනවා. ඒ වගේ අවස්ථාවක තමයි සාමුක්කංසික දේශනාවක් කරන්නෙ. හැම දේශනාවක්ම එහෙම කරන්නෙ නෑ. ඒ කියන්නෙ පුද්ගලයගෙ හිත සමාධිගත වෙලා, පිරිසිදු වෙලා, හරියට අවබෝධය ලබන්න සුදුසු මට්ටමට ආව කියල දැනගත්තම ඒ වගේ දේශනාවක් කරනවා. එතකොට ඒ දේශනා වේගය සාමාන්‍ය කෙනෙක්ගෙ වගේ 512 ගුණයක්. ඒත් අහන් ඉන්න කෙනාට අඩුවක් නැතිව තේරෙනවා.

මේ කාරණය නවීන විද්‍යාවෙ එන පරීක්ෂණයකින් පවා ඇත්ත කියල ඔප්පු වෙනවා. ඒ කියන්නෙ කෙනෙක් හීනයක් දකින කොට ඒ පුද්ගලයගෙ හීන කම්පන, මොළයට සම්බන්ධ කරපු උපකරණයකින් පරීක්ෂා කරනවා. එතකොට ඒ පුද්ගලයට තත්පර 8 ක කාලයක් තමයි ඒ හීනය දකින්න ගිහින් තියෙන්නෙ. නමුත් පුද්ගලය දැකපු ඒ හීනය විස්තර කරන කොට දවස් ගණනක සිද්ධි තියෙන හීනයක් තමයි මේ තත්පර 8 න් දැකල තියෙන්නෙ. ඒකෙන් පෙනී යනවා, මනස සමතුලිත වෙලා තියෙන කොට එක මොහොතකත් පුද්ගලයෙකුට කොච්චර නම් සිතිවිලි ප්‍රමාණයක් දෙන්න පුළුවන්ද කියල. ඒ තරම් විශාල ශක්තියක් මේ මනසට උකහා ගන්න පුළුවන්, ගබඩා කරන්න පුළුවන්. ඒ වගේ බුදුන් වහන්සේ, සාමාන්‍ය කෙනෙක් කතා කරන වේගයට වඩා 512 ගුණයකින් කතා කළත්, අහගෙන ඉන්න පුද්ගලයින්ගෙ හිත ඒ මට්ටමට සමාධි ගත වුනාම ඒ කියපු කාරණා වැටහෙනවා. හැබැයි ඒක නිකං කෙනෙකුට තේරෙන්නෙ නෑ.

ඒ වගේම උන්වහන්සේ **අධිෂ්ඨානයක් කළාම ඒ බණ අහගෙන ඉන්න අයට බාහිර අරමුණු එන්නෙ නැතිව යනවා.** ඕන නම් මාර ගර්ජනා ඇති කරන වෙලාවක ඒ ශබ්ද, බණ කියන සීමාවට එන්නෙ නැති වෙන්න අධිෂ්ඨාන කරන්නත් පුළුවන්. එතකොට මාර විකෘති කිරීම්, මාර කිරණ ඒ සීමාවට එන්නෙ නැතිව යනවා. එහෙම නැත්නම් ඒ බණ අහන පිරිසට ඒ වගේ කිරණ එවල වික්ෂිප්ත කරන්න මාර සේනාවට පුළුවන්. නමුත් බුදුන් වහන්සේගෙ අධිෂ්ඨානය ඉදිරියේ ඒ වගේ දේවල් කරන්න බැරිව යනවා. ඒකෙන් තමයි බණ අහගෙන ඉන්න පිරිස සමාධිගත කරන්නෙ. එතකොට බාහිරින් වික්ෂිප්ත සිතිවිලි එන්නෙ නැතිව යනවා. ඒ වගේ වෙලාවක අහන බණ වැටහිලා මගඵල ලබන්න හේතු වෙනවා. ඒ විදිහට බාහිර ශබ්ද, අරමුණු එන්නෙ නැතිවෙන්න වගේම, **ඕනම ලෝකයක තියෙන ඕනම ස්වභාවයක් ඒ ස්ථානයේ ඇති හඬ සහ රූපත් ඒක්කම සජීවීව දර්ශනය කරන්න, ඇහෙන්න සලස්වන්නත් උන්වහන්සේට පුළුවන්.** වතාවක් විශාකා උපාසිකාවගෙ දාසියන් 500 ක් ධර්මයට උසුළු විසුළු කරන බව, කොලොප්පම් කරන බව දැනගත්තම, විශාඛා උපාසිකාව ඒ අයව බුදුන් වහන්සේ වෙතට රැගෙන ගියා. උන් වහන්සේ මහා ඝන අන්ධකාරයක් මවල, නුඹලා ධර්මයට විහිළු තහළු කළොත් මරණින් මතු මෙන්න මේ වගේ නරකයකට යන්න සිද්ධ වෙනව කියල හේතුඵල ඇතිව පහදල, එතැනට යන්න කැමතිද කියල අහන කොට, ඒ මහා අන්ධකාරය දැකල, බයවෙලා ඒ අය වෙව්ලන්න පටන් ගත්තා. ඊට පස්සෙ ධර්මයට ගරු කරල දහම වැළඳගත්තා. එතකොට උන්වහන්සේ ඒ වගේ දේවල් කරන්නෙත් හේතු වාසනා තියෙන අය දැකල ඒ අය කෙරෙහි අනුකම්පාවෙන්මයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වෑහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අනිසි ලකුණ

බලු වෙත අත් වූ මස් කටු — වැන්නේ
රස ලෙස හැපුවත් නොම රස — වන්නේ
මුව කඩ වී ලේ වහනය — වන්නේ
කිම නම් ඵලයක් ඉන් ලැබ — ගන්නේ

සාරය සොයමින් වෙහෙසයි — වන්නේ
සැප බිඳුවයි දුක් ගොන්නකි — වන්නේ
කිම නම් හරයක් ඒය ගෙන — දෙන්නේ
සරු නැතිවම ඒය වැනසී — යන්නේ

මළ මූ ගොඩකින් සැකසී — ඒන්නේ
මන බැඳ සිවියෙන් වැසිලා — ඉන්නේ
ඔපයට පෙනුනද වැනසී — යන්නේ
දුකමය අවසානෙදි ගෙන — දෙන්නේ

අනිසියි යන ලකුණයි ඒහි — වන්නේ
ඇට කටු මෙනි සරු බව නොම — වන්නේ
හරයක් නැති බව වටහා — ගන්නේ
ඒවිටයි නිවනට මග — පෑදෙන්නේ

පබැඳුම : **මනුජය කරුණාරත්න - ගම්පහ**

**අභයරතනාලංකාරය - 31**

# මනුස්ස වේසයෙන් පෙනී සිටින අමනුස්සයින්



*(පසුගිය කලාපයෙන් - අපට නොපෙනෙන ගුප්ත ලෝකයේ බලපෑම්...........)*

**- වහරක අභයරතනාලංකාර හිමි**

කොනෙක් මියයාමේදී සිදුවන සංකීර්ණ ක්‍රියාදාමය ගැනත්, එසේ මියගිහින් නොපෙනෙන ගන්ධබ්බ ලෝකවල ජීවත් වෙන විවිධ සත්වයින්ගෙ කාය සකස්වීම ගැනත් වෙනම ලිපි පෙළක් මේ සඟරාවෙ කොටස් වශයෙන් පළවෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් මම මහණ වෙන්න පෙර අත් දැකපු සිද්ධි කිහිපයක් තමයි මේ විස්තර කරන්නෙ.

බොහොම දැන උගත්, විධායක ශ්‍රේණියේ තනතුරක් දරන එක්තරා මහත්තයෙක් ඒ කාලෙ මාව හමුවෙන්න නිතර නිතර ආවා. ඔහු රජයේ විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාගෙන මුල් ගුරුවරයෙක් විදියට සේවය කරල, එතනින් ඉවත් වෙලා තවත් ඉහළ තැනක රස්සාවක් කරමින් හිටියෙ. ඔහුගේ විනෝදාංශය තමයි නොපෙනෙන ලෝකවල විවිධ අමනුස්ස ආදීන් ගැන පර්යේෂණ කිරීම. ඉතින් ලංකාව වගේ රටක ඒ වගේ සිද්ධි මිනිස්සු අතර බොහොම ප්‍රසිද්ධ නිසාත්, ඒ සම්බන්ධයෙන් මිනිස්සු අතර හොඳ විශ්වාසයක් තියෙන නිසාත් මේ මහත්තය ඔය වගේ ආරංචි ලැබිච්ච ගමන් ඒ ඒ තැන්වලට ගිහින් පර්යේෂණ කරනවා. හැබැයි ඔහු ඒ වගේ පර්යේෂණ කළාට, පිටින් බැලුවම නිකං භෞතිකවාදියෙක් විදියට තමයි හැසිරුණේ. ඒවායේ තියෙන ඇත්ත නැත්ත විමර්ශනශීලීව හරියටම හොයා ගන්න තදබල උනන්දුවක් තිබිච්ච නිසා තමයි ඔහු ඒ විදියට හැසිරුණේ.

මේ මහත්තය දවසක් අවිස්සාවේල්ල ප්‍රදේශයේ ගෙදරකට ඔය වගේ පර්යේෂණයක් කරන්න ගියා. මොකද ඒ ස්ථානයේ එක්තරා අමනුස්සයෙක් ඉන්න බවට බොහොම ප්‍රසිද්ධ වෙලා තිබුණා. හැබැයි ඒ අමනුස්සය එක්තරා විශේෂ ශක්තියක් තියෙන චාතුර් මහා රාජිකයෙන් පාලනය වන කෙනෙක්. මේ පුද්ගලය ඒ ගෙදර ජීවත් වෙලා මොනව හරි හදිසි අනතුරකින් මියගිය කෙනෙක්. දැන් ඒ පුද්ගලයගෙ නෝනයි, දරුවො දෙන්නයි ඒ ගෙදර ජීවත් වෙනවා. මේ අය ජීවත් වුනේ ඒ ගෙදර ඉස්සරහ තිබිච්ච ඒ අයට අයිති නිවසක් නවාතැන්පළක් (බෝඩිමක්) විදියට කුලියට දීල ලැබිච්ච මුදලින්. ඒකෙ කවුරු හරි පිරිමි අය ඇවිත් නැවතිලා හිටියා. ඉතින් මේ මියගිය කෙනාගෙ ගෙදර හිටපු ඒ නෝනට කවුරු හරි විහිළු කොලොප්පම් එහෙම කළොත්, අර මියගිය කෙනා කොහේ හරි ඉඳල ඇවිත් ඒ පුද්ගලයගෙ බෙල්ල මිරිකනවා. විහිළු කොලොප්පම් කරන්න ගියපු ඒ වගේ කිහිප දෙනෙකුටම අකරතැබ්බවලට මුහුණ දෙන්නත් සිද්ධ වෙලා තිබුණා. හැබැයි ඒ මියගිය කෙනා කොහේ ඉඳන් එනවද කියල පේන්නෙ නෑ. එන්නෙ සුදු ඇඳගෙන. කොයි වෙලේ හරි ඇවිත් පේන්නම බෙල්ල මිරිකල බය ගන්වනවා.

සමහර විට ඒ මියගිය ස්වාමි පුරුෂයට ඒ වෙන කොටත් තමන්ගෙ භාර්යාව එක්ක සම්බන්ධතා තිබුණද කියල දන්නෙත් නෑ. ගුප්ත ලෝකයේ සිද්ධි එහෙම ලේසියෙන් හොයා ගන්න බැරි නිසා කවුරුවත් ඒ ගැන හොයන්න ගියෙත් නෑ. මොකද මියගියාට පසුවත් ජීවත් වෙලා ඉඳෙද්දි වගේම, එහෙම සම්බන්ධ වෙන අවස්ථා තියෙනවා. **චුති පටිසන්ධියක් නැතිව මැරිල තිබුනොත් අර ජීවත්වෙලා ඉඳෙද්දි හිටපු විදියටම චිත්තජ රූපයෙන් පේන්න ඇවිත් එහෙම සම්බන්ධ වෙන්න පුළුවන්.** ඒ වගේම සමහර ප්‍රබල අමනුස්ස කොටස් චාතුර් මහා රාජිකයට අයත් දේව කොටස්වලටත් සම්බන්ධයි. කළු කුමාර කියල කියන්නෙත් ඒ වගේ කෙනෙක්. ඒත් අර වගේම මනුස්සයින්ගෙ ශරීරවලට සම්බන්ධ වෙනවා. **සමහරවිට පෙර මනුස්ස වෙලා හිටපු අය දැන් දේවත්වයක ඉඳගෙනත්, පෙර හිටපු මනුස්ස වෙස් මවාගෙන නැවතත් මනුස්ස ඇසුරට එන්න පුළුවන්.** අංගුත්තර නිකායේ 4 වන කාණ්ඩයේ එන නන්දමාතු සූත්‍රයේ ඒ වගේ අවස්ථාවක් ගැන සඳහන් වෙනවා.

නන්දමාතා කියන්නෙ දහම් ගුණයේ පිහිටල හිටපු මගඵල ලාභියෙක්. ඇය එක්තරා පිරිත් සූත්‍රයක් සජ්ඣායනා කරමින් හිටියා. ඒ සජ්ඣායනාව ඉවර වෙනකොට කවුරුහරි නොපෙනෙන කෙනෙක් පැත්තක ඉඳගෙන සාදුකාරයක් දුන්නා. ඒ කවුද කියල ඇහුවම, මම වෛශ්‍රවණ, ඔබේ බෑයා වෙන කෙනෙක් කියල කිව්වා. ඒ කියන්නෙ සතර වරම් දෙවිවරුන්ගෙන් කෙනෙක්. බෑයා කිව්වෙ සහෝදරයෙක් කියන එක. ඇයි ආවෙ කියල ඇහුවම, කාලෙකට පස්සෙ හරියට ක්‍රමානුකූලව ශබ්ද කරන පිරිතක් ඇහුණා, මම අනුමෝදන් වුනා කියල කිව්වා. එතකොට නන්දමාතා ඒ තරම් හොඳට ඒ පිරිත සජ්ඣායනා කරල තිබුණා. ඊළඟට මේ වෛශ්‍රවණ දෙවියො ඇයට මෙහෙම කිව්වා. ''හෙට සැරියුත් මහ රහතන් වහන්සේ භික්ෂූන් වහන්සේලාත් එක්ක මේ ගමට වඩිනවා. තවම කවුරුවත් දානෙට ආරාධනා කරල නෑ. ඒ නිසා උදෙන්ම ගිහින් දානෙට ආරාධනා කරල මටත් පින් අනුමෝදන් කරන්න'' ඉතින් ඒ අනුව ඇය ඊට පහුවදා යනකොට උන්වහන්සේ භික්ෂූන් වහන්සේලාත් එක්ක වැඩම කරල හිටියා. ඒ නිසා ඉස්සෙල්ලම ගිහින් දානෙට ආරාධනා කළා. ආරාධනා කරන්න, කොහොමද දැනගත්තෙ කියල සැරියුත් හාමුදුරුවො ඇගෙන් ඇහුවම, අර විස්තරය කියල දැනගත්තු හැටි කිව්වා. ඒක හරි විශේෂ දෙයක්නෙ කියල උන්වහන්සේ ඒ ගැන ඇයට ප්‍රශංසා කළා. ඒ කියන්නෙ ඇගේ දැනීම ගැන. ස්වාමීනි, එච්චර විතරක් නෙවෙයි, තවත් ආශ්චර්යමත් කරුණු මං ළඟ තියෙනවා කියල, ඇය එකින් එක තවත් විස්තර කියන්න පටන් ගත්තා. ඒ සිද්ධිය මුල් කරගෙන තමයි ඇය

කිව්වෙ, තමන්ගෙ මියගිය ස්වාමියා චාතුර්මහා රාජිකයෙ දෙවියෙක් වෙලා ඉපදිලා, පැරණි මිනිස් වෙසින් ඇවිත් ඇගේ ඇසුරට එනව කියල. ඒ වගේම ඒ අවස්ථාවෙදි ඇයට කිසිම බයක් දැනෙන්නෙ නැති බවත් ඇය කිව්වා. මේ වගේ සිද්ධියක් තමයි මෙතනදිත් සිද්ධ වුනේ.

දැන් අර කලින් කියපු මහත්තයත් මේ කාරණය දැනගෙන පරීක්ෂණයක් කරන්න එතනට ගිහින් මේ සිද්ධිය අත් දැක්කා. රස්සාව කරන්නත් එක්ක ඔහු ඒ නවාතැන් පළේම නතර වුණා. මේ මහත්තය සාමාන්‍යයෙන් මිනිස්සු දෙතුන් දෙනෙක් එක්ක වුනත් සටනක් කරල ජයගන්න පුළුවන් හොඳ උස මහත ශරීරයක් තියෙන අඩි 6 ක් විතර උස කෙනෙක්. ඉතින් පළවෙනි දවසෙ පරීක්ෂණ කරන්න ඇවිත් අහල පහලින් විමසුම් කරල බැලුවා. මේක කොහොමද වෙන්නෙ, කවුද දකින්නෙ, ඇයි ඒ මියගිය කෙනාගෙන් එහෙම ප්‍රශ්න එන්නෙ ආදී වශයෙන් ඔහු ඒ අයගෙන් අහන කොට, ඒ නවාතැන්පලේම හිටපු කෙනෙක් මෙහෙම උත්තර දීල තිබුණා. ''එයාගෙ නෝනත් ඔය ඉන්නෙ, ඇයට කවුරු හරි විහිළු තහළු කළොත් මැරිච්ච කෙනා ඒ මනුස්ස රූපයෙන්ම ඇවිත් පේන්නම බෙල්ල මිරිකනවා. ඒ නිසා මෙතන ඉන්න කවුරුවත් ඇයට කොලොප්පම් කරන්න යන්නෙ නෑ. බයයි.....'' මේ ආදී වශයෙන් ඒ අය පැවසුවා. හැබැයි මේ නවාතැන්පලේ ඉන්න මේ විස්තර දීපු කෙනාට නම් ඒ මියගිය කෙනාගෙන් කිසිම කරදරයක් නෑ. ඔහු කාලයක ඉඳන් මේ නවාතැන්පලේ නැවතිලා ඉන්න කෙනෙක්. ඔහුට අර මියගිය කෙනා ඇවිත් මෙහෙම කියල තියෙනවා. ''මෙතනට ආපු අයගෙන් ඔබ විතරයි අවංක කෙනෙකුට ඉන්නෙ. ඔබ ගැන මට විශ්වාසයි. මගේ නෝනයි දරු දෙන්නයි හොඳින් බලාගන්න. ඔබට මොනව හරි කරදරයක් වුනොත් මාව සිහිකරන්න. මගෙන් ඔබට කිසිම කරදරයක් නෑ.'' මේ කාරණයත් මේ මහත්තයා ඒ පුද්ගලයගෙන්ම දැනගත්තා. ඒ වගේම කොලොප්පම් කරන්න ගිහින් කීප දෙනෙක්ම මාරාන්තික වෙලා බොහොම අමාරුවෙන් නොමැරී බේරිලා ගිහින් තියෙන බවත් ඔහුට දැන ගන්න ලැබුණා. දැන් ඉතින් මේ මහත්තයත් ඒ කාරණය අහල ඒකෙ ඇත්ත නැත්ත දැනගන්න අර කාන්තාවට කොලොප්පමක් කළා.

ඊළඟ දවසෙ ඔහු වැඩට ගිහින් තමන්ගෙ වැඩ රාජකාරි කරගෙන යන කොට, උණ ගැනෙන්න වගේ දැනිල නැවතත් තමන් නැවතිලා ඉන්න අර නවාතැන්පලට ආවා. එහෙම ඇවිත් නවාතැනේ නිදාගෙන හිටියා. එතකොට තවත් කෙනෙක් නවාතැන්පලට ඇතුල් වුණා. ආපු අලුත නිසා නැවතිච්ච තවත් කවුරු කවුරු ඉන්නවද කියල ඔහු දන්නෙත් නැති නිසා, ඒ වගේම තවමත් හරියට ඒ අය අඳුන ගෙනත් නැති නිසා, මේ නවාතැන්පලේම කෙනෙක් කියලයි ඔහු හිතල තියෙන්නෙ. ඉතින් ඒ ආපු පුද්ගලයා, මොකද මහත්තය නිදි කියල ඇහුවලු. නවාතැන් පළේම ඉන්න කෙනෙක් කියල හිතල, ඔළුවෙ කැක්කුමයි කියල ඔහුත් වැඩි ගානක් නැතිව උත්තර දුන්නලු. දැන් අර පුද්ගලය ඔහුගෙ ඔළුවට



අත තියල, ඔළුවෙ කැක්කුම නේන්නම් උණ තියෙනව වගේ කියලත් කිව්වලු. එහෙම කියල එක පාරටම මේ මහත්තයගෙ බෙල්ලෙන් අල්ල ගත්තලු. එතකොට තමයි අර මියගිය කෙනා බව දැනගත්තෙ. ඉතින් මේ මහත්තයත් ඒ පුද්ගලයගෙ අතින් තදට අල්ල ගෙන බොහොම අමාරුවෙන් දඟලල අත බෙල්ලෙන් ඇදල ගත්තලු. දැන් ඔහු ඒ මියගිය කෙනාගෙ අත් දෙක තදින් අල්ලගෙනම, මෙන්න භූතය අල්ල ගත්තෝ කියල කෑ ගැහුවලු. අත හරියට දඬුඅඬුව ඇල්ලුව වගේ දරදඬුයිලු. දැන් ඉතින් මෙහෙම අතින් අල්ලගෙන කෑ ගහන කොට, වටේ හිටපු අයත් එහෙන් මෙහෙන් කෑ ගහගෙන ආවලු. ඇවිත් බලන කොට මේ මහත්තයගෙ අත් දෙක යමක් අල්ල ගත්ත වගේ තියෙනවලු. ඒත් කවුරුවත් අහු වෙච්ච කෙනෙක් පේන්න නැතිලු. දැන් මේක මහ පුදුම සිද්ධියක්නෙ, කිසිම අඩුවක් නැතිව භෞතික අතක් මට අහුවුනේ කියල මේ මහත්තය කියනවලු. ඒ කියන්නෙ සම්පූර්ණ මනුස්සයෙක්මයි ඇවිත් තියෙන්නෙ. අල්ල ගත්තු අත තදට මිරිකගෙනමයි අනිත් අයටත් කෑ ගහල තියෙන්නෙ. නමුත් අල්ල ගත්තු කෙනාට වෙච්ච දෙයක් නෑ. දැන් අත් දෙකත් නෑ, පුද්ගලයත් අතුරුදන්.

දැන් ඉතින් මේ මහත්තය ඒ පර්යේෂණයෙන් පස්සෙ එතන ඉන්න බය වුණා. ඒත් ඔහුට හරි ප්‍රශ්නෙ, කොහොමද මේ සිද්ධිය වෙන්නෙ කියල. ඔහු මේ ගැන කල්පනා කර කර දෙවනි දවසෙත් වැඩට ගිහින් ඇවිත් ඒ නවාතැනේ බුදිය ගත්තා. දැන් ඉතින් ඔහුට හරි වෙහෙසයි. එදත් නිදාගෙන ඉන්න කොට අර අමනුස්සය අර විදියටම ආවලු. දැක්ක ගමන්ම, මෙන්න අර භූතය එනවෝ කියල කල් තියා බයටම කෑ ගැහුනලු. ඒ පාර අවට අය දුවගෙන එනකොට ඒ අමනුස්සය පෙනි පෙනීම අතුරුදන් වුණාලු. ඉතින් මේ සිද්ධියෙන් පස්සෙ මේ මහත්තය අත් දැකීමකුත් ලැබුව නිසා එතනින් යන්න ගියා. ඒත් ඔහුට ඕන වුනේ අර භූත බලවේගය කොහොම හරි මෙල්ල කර ගන්න. ඉතින් ඔහුට මෙල්ල කරගන්න බැරි වෙච්ච නිසා මේකව අල්ල ගන්න ක්‍රමයක් නැද්ද කියල කල්පනා කළා.

ඊට පස්සෙ ඔහු එතනින් හැතැප්ම 12 ක් ඈත ගෙදරකට ගිහින් නැවතුණා. නැවතිලා අර අමනුස්සය අල්ලල හිර කරන්න බලවත් කට්ටඩියෙක් හෙව්වා. දැන් මෙහෙම ඉන්න කොට හමුවෙච්ච කට්ටඩියෙකුගෙන් ඔහු ඇහුව, මෙන්න මෙහෙම අමනුස්සයෙක් ඉන්නව, මටත් මෙහෙම කරදර කරල තියෙනව, මෙල්ල කරන්න පුළුවන්ද කියල. එහෙම අහල සම්පූර්ණ විස්තරේම කිව්වලු. ඒ කට්ටඩිය ලොකුවට පණ්ඩිතකමට කිව්වලු, මට ඕව ලොකු දේවල් නෙවෙයි, මම ඔහොම ඒව නෙවෙයි අල්ලල තියෙන්නෙ කියල. එහෙම කියල ඒකට අවශ්‍ය බඩු මුට්ටු ටික ගේන්න කිව්වලු. හැබැයි අල්ලන්න එහේ යන්න නම් බෑ කියල මේ මහත්තය කිව්වලු. එහෙනම් කොහොමද කරන්නෙ කියල ඇහුවම, දැන් මම ඉන්න තැනට ගෙනත් අල්ලල හිර කරන්න කියල කිව්වලු. ඊට පස්සෙ ඉතින් හා කියල ඒ අමනුස්සය ගැන විස්තර අහල මේ කට්ටඩිය මොනව හරි මතුරන්න පටන් ගත්තලු. දැන් මේ මතුරන ගමනුත් මේ කට්ටඩිය, කලින් මේ වගේ අල්ලපුව කරපුව පණ්ඩිතකමට කියනවලු. ☞

ඔහොම කර කර ඉඳල එක පාරටම, බෑ බෑ මහත්තයො ඒක නම් කරන්න බෑ කියල දුවගෙන ගියාලු. ඉතින් මේ මහත්තය මොකද කියල ඇහුවම, වෙච්ච දේ කිව්වලු. ඒ අමනුස්සය මගෙ බෙල්ලෙන් අල්ලගෙන බෙල්ල හොල්ලල ඇහුව තෝ මොකක්ද යකෝ කරන්න හදන්නෙ, තොට පුළුවන් දෙයක්ද කරන්නෙ, මරන්න ඉස්සෙල්ල පලයන් යන්න කියල මෙහෙම කිව්වලු. අර අමනුස්සය දැන් මෙතනටත් ඇවිත් කට්ටඩියත් බය ගන්වල තමයි ගියේ. ඒ තරම් ප්‍රබලයි. දැන් ඉතින් මේ කට්ටඩියගෙ මුළු ඇඟම වෙව්ලනවලු. මට කවදාවත් මෙහෙම දෙයක් වුනේ නෑ කියල වැඩේ දාල යන්න ගියාලු.

ඉතින් මේ මහත්තය මාව හමුවෙන්න ඇවිත්, මේ සිද්ධිය මාත් එක්ක කියල ඒකට හේතු ඇහුවා. මොකද මටත් ඔය ගැන බොහොම අත්දැකීම් තිබුණා. ඉතින් මුලින්ම මම ඔය භූතයො ගැන විස්තර කරල කියන කොට ඔහු ඒවා නෑ කියනවා. හැබැයි එහෙම නෑ කියන්නෙ, මාත් මේ නිකං අනුමානෙට කතා කරනවද නැද්ද කියල බලා ගෙන, ඇත්ත කරුණු හොයා ගන්න මිසක් නිකං මෝඩ විදියට නෙවෙයි. ඉතින් ඔය වගේ සිද්ධි මගෙන් මාස ගණනක් තිස්සෙ අහගෙන අන්තිමට තමයි ඔහු කිව්වෙ, ඒවා සම්පූර්ණ ඇත්ත, මටත් ඕව වෙලා තියෙනව කියල. බලාගෙන යන කොට ඔහු හය මාසයක් යන කල් ඔහුට වෙච්ච දේවල් මට කියල තිබුණෙ නෑ. භෞතිකවාදියෙක් වගේමයි ඒ කාලෙ ඔහු කතා කළේ. භෞතිකවාදීන් අහන ප්‍රශ්නමයි මගෙන් ඇහුවෙත්. අන්තිමට ඔහු කිව්වා, මම මේ අහන ප්‍රශ්නවලට කිසි කෙනෙක්ගෙන් ඔය වගේ හේතුඵල සහිත උත්තර ලැබුනෙ නෑ කියල. ඉතින් අර මුල් හය මාසයම ඔහු මං ළඟට ආවෙත් කිසිම ගරු සරුවක්, ගණන් ගැනීමක් නැතිව සපත්තුත් දාගෙන. නමුත් ඉතින් ඒක මට කොහොමත් ගැටළුවක් වුනේ නෑ. මේ සිද්ධියෙන් පස්සෙ අන්තිමට ඔහුම කිව්වා, ගරු සරු නැතිව නෙවෙයි මම එහෙම කළේ, ඔබේ අදහස දැනගන්නයි කියල. ඒ කියන්නෙ මාව ගණන් නොගෙන කතා කළාම ඒ පිළිබඳ මගේ අදහස දැන ගන්න ඔහුට අවශ්‍ය වෙලා තිබුණා.

ඉතින් ඔය විදියට මේ මහත්තය මාත් එක්ක  හය මාසයක් තර්ක කළා. එහෙම තර්ක කරල දවසක් සරමක් ඇඳගෙන සපත්තු දෙකක්වත් නැතිව ඇවිත් මට දණ ගහල වැන්දා. එතකොට මම මහණ වෙලත් නෑ. වැඳල කිව්වා, මම මෙච්චර කාලෙකුත් වැන්දා, හැබැයි මහත්තය දන්නෙ නැති වුනාට මම හිතින් වැඳලයි ගියේ කියල. මොකද සමහරු මාන්නක්කාරකමට මෙහෙම හැසිරෙද්දි ඒ පුද්ගලයො ගණන් ගන්නෙ නෑ, අත හරිනවා. නමුත් මම එහෙම කළේ නෑ, මොකද මට ගරුත්වය ගන්න ඕන කමක් තිබුන නම්, ඒ මහත්තය හැසිරිච්ච විදියට මට ඔහුව පිළි නොගෙන ඉන්න තිබුණා. නමුත් එහෙම ගරුත්වයක් ගන්න මට කිසිම අවශ්‍යතාවයක් එදත් තිබුනෙ නෑ. ඒ මහත්තය එනකල්මයි මමත් බලාගෙන ඉන්නෙ. මොකද මමත් බොහොම කැමතියි එහෙම අයත් එක්ක කතා කරන්න. ඒ කියන්නෙ ඔහු ඇහුවෙ බොහොම තර්කානුකූල වැදගත් ප්‍රශ්න මිසක් නිකං මන්ද බුද්ධික ප්‍රශ්න නෙවෙයි. ඉතින් ඒ මහත්තය කොහොම ආවත්, කොයි විදියට කතා කළත් මම බොහොම කැමතියි. මේ නිසා මමත් ඉතින්, ආ එන්න එන්න මහත්තය කියල දැක්ක ගමන්ම කල් තියා කතා කරනවා. හැබැයි ඉතින් ඔහු ඇවිත් මහේශාක්‍ය ලීලාවෙන් තමයි ඉන්නෙ. එහෙම හිටිය කියල මම ඒව මුකුත් හොයන්න යන්නෙ නෑ. ඔහු යන්න පිටත් වෙලා, මම යනව මහත්තය කියනවා. මමත් ඉතින් හා හොඳයි මහත්තය කියල කියනවා. ඔහොම ඉඳල තමයි කිව්වෙ, මං එදත් වැන්දා, අදත් වඳිනවා මෙන්න මේකයි හේතුව කියල. එහෙම කියල ඔහුට මේව හොඳ අත්දැකීම් බවත් ප්‍රකාශ කරල, ඊළඟට ඔහුට තවත් නොදන්න අත්දැකීමක් තියෙනවයි කිව්වා.

ඔහු නිවාඩු දවස්වලට දෙහි ඇඹුල් ටිකක් මිරිකල වතුර ටිකක්, සීනි ටිකක් දාල පිපාසයට පානය කරන සිරිතක් තිබුණා. එහෙම දෙහි ඇඹුල් එකක් හදාගෙන විවේක තැනක පොඩි මේසයක්, පුටුවක් තියල මොනව හරි පොතක් බල බලා අරක පානය කරනවා. දවසක්  ඔහු ඒක බීල වීදුරුව පැත්තකින් තිව්වලු. එහෙම තියල පොත බලන කොට එක පාරටම ඩෝං ගාල අර වීදුරුව පුපුරල කුඩු වීසි වුණාලු. හේතුවක් හොයා ගන්නත් බෑ. රසායන විද්‍යාව ගැන දන්න අයගෙන් ඇහුවම කිව්වලු, රසායනික සංයෝගයක ප්‍රශ්නයක් නිසා එහෙම වුනාද දන්නෙ නෑ කියල. නමුත් එහෙම දෙයක් නෙවෙයි. මොකද ඔහුත් ඒ වගේ විද්‍යාත්මක දේවල් දන්නවා. ඒ නිසා ඒ වගේ රසායන විද්‍යා සම්බන්ධයක් නෑ කියල ඔහු දැනගෙන හිටියා. ඉතින් මේ වීදුරුව හිටිගමන් ඉබේටම කුඩු වුනේ මොන හේතුවකින්ද කියල හොයා ගන්න ඔහු දන්නෙ නෑ කියල, මගෙන් ඒ ගැන ඇහුවා. මොකද ඔය සමහර අවස්ථාවල අමනුස්ස ආදී කොටස්වලටත් ඔහොම දේවල් කරන්න පුළුවන්. යම්කිසි විදියක වේගයක් එවල අර වගේ කුඩු කරල දාන්න පුළුවන් අමනුස්සයො ඉන්නවා. එහෙම දේවල් වෙලා තියෙනවා. ඒ කාරණය මම ඔහුට පැහැදිලි කරල දුන්නා.

දැන් මේ කියන්න යන්නෙ තවත් ඒ වගේ සිද්ධියක්. මම මහණ වෙන්න කලින් පූජා සෙත් ශාන්ති ආදී කටයුතු කරගෙන දිවයිනේ කිහිප ස්ථානයකම හිටියා. ඒ වගේම ඒ ස්ථානවලට භික්ෂූන් වහන්සේලාත් සම්බන්ධ වුණා. ඒ අතර යම් කිසි ඓතිහාසික වැදගත්කමක් තිබ්ච්ච පැරණි ස්ථානත් තිබුණා. ඉතින් ඒ වගේ තැනක මේ වගේ කටයුතු කරගෙන ඉන්න කොට, අවටින් ටිකක් කැළෑබදව තිබ්ච්ච ඒ ප්‍රදේශයේ එක්තරා යක්ෂණියකුත් හිටියා. හැබැයි ඒ යක්ෂණිය කවදාවත් යක්ෂ වේශයෙන් ඇවිත් නෑ. ලස්සන ගැහැණු ළමයෙක්ගෙ වෙස් අරගෙන තමයි බොහෝ කොටම පෙනී ඉඳල තියෙන්නෙ. නමුත් මම නම් දැක්කෙ වයසක ගැහැණු කෙනෙක්ගෙ ස්වරූපයෙන්. එහෙම ඇවිත් සමහර වෙලාවට මිනිස් කනට ඇහෙන්නම කතා කරපු අවස්ථාත් තියෙනවා.

ඒ වගේම මේ කියන ස්ථානයේ තවත් ගන්ධබ්බයො කිහිප දෙනෙක්ම, පෙර අත්බවයේ ඒ අය හිටපු විදියට චිත්තජ රූපයෙන්ම සරම් ඇඳගෙන කරේ උදලු, නගුල් තියාගෙන ඒ ප්‍රදේශයේ තියෙන කුඹුරු වැඩ කරන්න යන හැටි මම කිහිප වතාවක්ම දැකල තියෙනවා. එහෙම යන්නෙත් අර භෞතික කුඹුරුවලටමයි. ඒ ගන්ධබ්බයො ඒ අයගෙ ගන්ධබ්බ ලෝකෙ ඉඳගෙන පැරණි පුරුද්දට කුඹුරු වැඩ කරනවා. මොකද ඉස්සර ඒ අය මනුස්ස වෙලා ඉඳෙද්දි ගොවිතැන් බත් කරන කොට, කුඹුරු කපල පළමු කොටසින් කිරිබත් දානයක් හදල ඒ පැත්තෙ දෙවියන් මුල් කරල පූජා කරන සිරිතක් තිබුණා. ඒ පූජාව කරන්නෙත් කමතෙ තියාගෙනමයි. එතනදි පොල් ගෙඩියක් එහෙම එල්ලල තමන්ගෙ කුඹුරු රැක දෙන්න කියල දෙවියන්ට භාරයක් වෙනවා. දැන් මේ ගන්ධබ්බයො පැරණි පුරුද්දට ඒව කරනවා. තමන් එදා කරපු කුඹුරු රැක ගන්න ඒ වැඩ කටයුතුවලට සහයෝගය දෙන්න තමයි ගන්ධබ්බ ලෝකෙ ඉඳගෙනත් අර විදියට සම්බන්ධ වෙන්නෙ. නමුත් ඒ ගන්ධබ්බ ලෝකෙ අයට දැන් මේ ලෝකෙ වැඩ කටයුතුවලට කෙලින්ම සම්බන්ධ වෙන්න විදියක් නෑ. නමුත් ගුප්ත පැත්තෙන් මොනව හරි රැකවරණයක් දෙනවා. ඒ අයත් කුඹුරු කියන හැඟීමෙන් ඒ ලෝකෙ ඉඳන් ඒව කරනවා. දැන් ඉන්න පරම්පරාවෙ අය දෙන දානය නිසා ඒ අයටත් යම්කිසි හිමිකමක් ලැබෙනවා. එතකොට මිනිස්සුන්ගෙ අස්වැන්න මිනිස්සුන්ට ලැබෙනවා. ඒ අයට ගුප්ත ලෝකෙට ගැලපෙන විදියට මොනව හරි අස්වැන්නක් මනෝමය වශයෙන් ලැබෙනවා.

☞

හැබැයි මේ කාරණය අර තිරෝකුඩ්ඩ සූත්‍රයේ එන ඥාති ප්‍රේතයින් කියන කොටසත් එක්ක පටලවා නොගත යුතුයි. මොකද ඒ කියන අයට එහෙම කුඹුරු සීසාල ගොවිතැන් බත් කරල ජීවත් වෙන්න පුළුවන්කමක් නෑ. දන් ජීවත් වෙලා ඉන්න තමන්ගෙ ඥාතීන් දෙන දේකින් තමයි ඒ අය යැපෙන්නෙ. ඒ විදියට අනුන්ගෙන් යැපෙන නිසා තමයි ඒ අයට පරදත්තුපජීවීන් කියල කියන්නෙ. ඒ අය වෙනයි, මේ කියන අය වෙනයි. මේ කියන්නෙ ගුප්ත ලෝකයේ ඉන්න ගන්ධබ්බ කියන වෙනම ජාතියක් ගැන. ඒ අය චාතුර් මහා රාජිකයෙන් පාලනය වෙන පොඩි පොඩි භූමාටු කොටස් වෙන්නත් පුළුවන්. ඒ අය ගන්ධබ්බ පවුල් පිටින්මයි ඉන්නෙ. ආටානාටිය සූත්‍රයේ ගන්ධබ්බෝවා, ගන්ධබ්බීවා, ගන්ධබ්බ පෝතකෝවා... ආදී වශයෙන් කියන්නෙත් ඒ අය ගැන. ඒ අයට යම් යම් පුණ්‍ය ඍද්ධීන් තියෙනවා. ඒ වගේම අර විදියට ඒ ලෝකෙ මැව්ච්ච උදළු නගුල් ආදියෙන් සී සාන්නත් පුළුවන්. එතකොට ඒ අයටත් ඒ ලෝකෙ හැටියට මැවෙනවා. එහෙම ඉඳගෙන ඒ ලෝකෙ බත් උයාගෙන කන අයත් ඉන්නවා.

මේ වගේ හිතාගන්නත් බැරි මහ පුදුමාකාර දේවල් මේ මනුස්ස ලෝකෙ මනුස්සයො සහ අමනුස්සයො අතරත් සිද්ධ වෙනවා. දන් අමනුස්සයො වුනාට, ඊට කලින් මේ මනුස්ස ලෝකෙ හිටපු මනුස්සයොම තමයි මේ විදියට එන්නෙ. ඉතින් මැරිල ගිහිල්ලත් ඒ ඒ ස්ථානවල, ඒ ඒ පුද්ගලයන් සමග තිබ්ච්ච විවිධ සම්බන්ධතා, ගනුදෙනු නිසා ඒවා නැවතත් බලාපොරොත්තුවෙන් මනුස්ස ඇසුරට එනවා. ඇවිත් විවිධාකාරයෙන් සම්බන්ධ වෙනවා. එහෙම සම්බන්ධ වෙලා තමන්ගෙ හිතවත් කෙනෙක් නම් සමහර වෙලාවට උදව් කරනවා. ඒ වගේම තමන්ට අසාධාරණකම් කරපු කෙනෙක් නම් නොයෙක් අඩත්තේට්ටම් කරල පළි ගන්න බලනවා.

අනන්ත අප්‍රමාණයේ පටන් ආපු සංසාරයේ තවත් එක් අත්බැවක, එක් අවස්ථාවක සිදු වෙච්ච සිදුවීම් කිහිපයක් විතරයි මේ. මේ වගේ සිදුවීම්වලට කොච්චර නම් මේ සියලු සත්වයින්ටම මීට පෙර මුහුණ දෙන්න සිද්ධ වෙලා ඇත්ද ? නිවන් දක්නා ජාති දක්වා තවත් කොච්චර නම් මුහුණ දෙන්න සිද්ධ වෙයිද ? ඒ සිදුවීම් මොන වගේ මුහුණුවරක් ගනියිද ? සාමාන්‍ය සරල සිද්ධි වගේම අති භයංකාර සිදුවීම්වලට පවා ඒ අතර තුර මේ හැම සත්වයෙක්ම මුහුණ දීල ඇති. ඒ වගේ ඉදිරියටත් මුහුණ දෙන්න සිද්ධ වෙන්න පුළුවන්. ඒවට ඉතින් කාටවත් දොස් කියල වැඩක් නෑ. තමන් විසින් කවද හරි ගොඩ නගපු හේතුවල ඵල තමයි ඒ විදියට එන්නෙ. ඉතින් මේ වගේ කරුණු කාරණා නිකං රස විඳින්න කිව්ව නෙවෙයි. සරලව කිව්වත්, මේ භයංකාර සංසාරයේ තියෙන තවත් එක් සංකීර්ණ ක්‍රියාවලියක් තමයි මේ විදියට කෙටියෙන් හෙළිදරව් කළේ. ඒ නිසා කවුරු කවුරුත් මේ සසර බය දැකල නිවන් අවබෝධයට අධිෂ්ඨාන කරගන්නව නම් ඥානාන්විතයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මා හිමි සමිඳු සම්බුදු පදවිය ලැබුවයි...

දකිනා පෙර නිමිති සතරක් සිවු දිනක
රුවිනා වැහැරී ගොස් නැසෙනා හැටි කයක
රකිනා බැරි කයක ඇති පැවතුම කුමක
දැනුනා ගිහි ගෙයින් නික්මිය යුතු හනික

දැක නළඟනන්ගේ නෙක නෙක බහු භූත
එක එක තැන වැටී නිදනා හැටි ප්‍රේත
අකමැති ගිහි ගෙයින් හිත යන්නට ඈත
දුක නැති කරන මගමය සසරෙහි නාථ

දකිනට රිසිව දේව්‍ය හා සිඟිති පුතු
කුමකට බැඳෙනවද බැම්මක් නිසා මතු
සැප ලෙස පෙනෙන සසරෙහි තතු දැකිය යුතු
සත හට ලැබෙන සහනය නිවනමයි මතු

නේරංජන නදිය වෙත කුමරුන් පැමිණි
කැපුවා කෙස් වැටිය අත රැඳි අසිපතිනි
ගලවා අභරණද ඇමතිගෙ අතට දුනි
ලැබුණා කසාවත හිමි තපසට නැමුනි

රකිනා තපස් දම් හිමි හුදෙකලා වේ
යැපෙනා ගෙයින් ගෙට ගොස් පිඬු සිඟා වේ
තිදෙනා ගුරුන් දුන් දම් කඳ බොහෝ වේ
උගනා දහම මතු නිවනට පමා වේ

සැප දුන්නත් ගතට නැහැ සිතු දේ ලැබුනේ
දුක දුන් සය වසකි බඩ පිටටම ඇලුනේ
සැප දුක අතර මැද මාවත යන ගමනේ
දුක නැති කරන පිවිසුම එය බව දැනුනේ

බාරය ලෙසට කිරි පිඬු තැටියද රැගෙන
දේව්‍ය සුජාතා පිදු දන හද බැතින
සොත්තිය බමුණු දුන් කුස තණ අට මිටින
සක්තිය ලැබුණි අරමුණ වෙත යන ගමන

වෙසගේ සඳ රැසින් මුළු උයනම නෑවෙයි
කුස තණ මතින් වජිරාසන පැන නැගුනයි
කෙලෙසුන් නසා සිවු සස් මග පහළ වුනයි
මා හිමි සමිඳු සම්බුදු පදවිය ලැබුවයි

පබැඳුම : **අයිරාංගනී රත්නායක - අත්තිඩිය, දෙහිවල**

# ද්‍රව්‍ය පදාර්ථ ඥානයට හසුවන විවිධ ශාකවල සැඟව ගිය ඖෂධ ශක්තීන්

**6 වන කොටස**

මේ මාතෘකාව යටතේ අද විග්‍රහ කරන්නෙ තවත් සුවිශේෂී ශාක වර්ග කිහිපයක සැඟවුණු ශක්තීන් ගැන. සුවිශේෂී කියල කිව්වෙ, මේ ශාක බොහෝ අවස්ථාවල ලොවුතුරා බුදුපියාණන් වහන්සේලා පිටදුන් බෝධි රුක්ෂ විදියට සකස් වෙච්ච නිසා. එතකොට බුදුන් වහන්සේලා බෝධි රුක්ෂ විදියට පිට දෙන්නෙත්, මෙච්චර කලක් විස්තර කරපු විදියට මිනිස්සු ළඟ මුල් කාලෙ තිබ්බ්ච්ච ගති ගුණ දුරස් වෙලා ගිහින් ඒවාට අදාල ශක්ති විශේෂයන් තැන්පත් වෙලා හටගත්තු ශාක විශේෂවලටමයි. ඒ වගේම විවිධ බුදුවරයන් වහන්සේලා පිටදුන්න බෝධි රුක්ෂත් විවිධ වෙනවා. මොකද ඒ ඒ බුදුවරයන් වහන්සේලාට ඒ ඒ කාල සීමාවලදි අවශ්‍ය කරන්නා වූ රස ධාතූන් වෙනස්. සතර මහා භූතයන්ගෙ රස ධාතුවත් කලින් කලට වෙනස් වෙනවා. එහෙම වෙනස් වෙන කොට ඒ ඒ කාලවලට තියෙන රස ධාතුවලින් තමයි ශරීර පෝෂණය වෙන්නෙ. එතකොට ඒ කාලෙට පෝෂණය සඳහා ප්‍රත්‍ය වෙන ඖෂධ ශක්ති තියෙන යම් යම් ගස් කොළං තියෙනවා. බෝසතාණන් වහන්සේ නමක් යම්කිසි කාලයකදි ලොවුතුරා බුද්ධත්වයට පත් වෙන්න කාල නිර්ණය වෙන්නෙ පෙරුම් පුරන්න පටන් ගන්න කොටමයි. ඉදිරියේදි මෙන්න මෙහෙම කාලයක මේ නමින් අහවල් රුක්ෂය බෝධිය විදියට නිර්ණය වෙලා, අහවල් නමින් බුදු වෙනව කියල පෙරුම් පුරන කාලයේම තීරණය වෙලා ඉවරයි. එතකොට ඒ කාලෙදි සතර මහා භූතයන්ගෙ රස ධාතුව පිහිටල තියෙන්නෙ මෙහෙමයි කියන කාරණයත් ඒ අනුව තීරණය වෙලා ඉවරයි. ඒ අවස්ථාවෙදි බුද්ධත්වයට ප්‍රත්‍ය වන බලය ලබා දෙන බාහිර ආයතනයක් විදියට පහළ වෙන්න තියෙන බෝධි රුක්ෂය තීරණය වෙන්නෙ ඒ අනුව. ඒ විදියට තමයි බුද්ධත්වයට අවශ්‍ය කරන්නා වූ පදාර්ථ ගෙන දෙන බෝධි රුක්ෂය හට ගන්නෙ. ඒ කාල සීමාවෙදි ඒ රුක්ෂයෙන් තමයි වැඩිම ඥාන ශක්තියකට ප්‍රත්‍ය ලැබෙන්නෙ.

දැන් අද කාලෙ ගත්තොත් ඇසතු රුක්ෂයේ මහා ඥාන ශක්තියක් වර්ධනය කරන ඖෂධ ශක්තියක් තියෙනවා. අනිත් බෝධි රුක්ෂවලත් ඒ වගේ විශේෂ ශක්ති පිහිටල තියෙනවා. විශේෂයෙන් හිස ගැල්වීමට භාවිතා කරන ඖෂධවලටත්, හිස තෙල් ගාන කොට හිසට තියන්නත් ඇසතු බෝ ගහේ බෝ පොතු, බෝ කොළ ඒ වගේම නුග, නා ආදී ශාකවල කොළ, පොතු ආදියත් ගන්නෙ ඒ ශාකවල ගැබ්වෙලා තියෙන විශේෂ ඖෂධ ශක්ති නිසා. එතකොට ගෞතම බුද්ධ සාසනය පවතින මේ කාලෙ, සතර මහා භූතයන්ගෙන් හටගත්තු භෞතික රස ධාතුව, අවශ්‍ය ඥාන ශක්තියට බලපාන විදියට ගැබ් වෙලා තියෙන ප්‍රධාන ශාකය තමයි ඇසතු රුක්ෂය. **ඇසක් සෘතු කිරීම තමයි ඇසතු කියන්නෙ. ඒ කියන්නෙ දහම් දකින්න දහම් ඇසක් උපද්දවල දෙනවා.** එතකොට මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ කෙනෙකුට යහපත් ගුණ ධර්ම කියල දීල ඒව ආරක්ෂා කරල දෙන ගති ලක්ෂණයක් තිබුණා. ඒක තමයි ඒ කාලෙ තිබ්බ්ච්ච දහම් ඇස. නමුත් පසුකාලීනව ඒ ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තියෙන් ඇසතු කියන ශාකය හට ගත්තා.



නමුත් මේ ඇසතු රුක්ෂ අතරින් **ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ හට ගත්තෙ බෝසතාණන් වහන්සේගෙ පාරමිතා ශක්තියෙන් සහජාතවමයි. ඒ කියන්නෙ සිදුහත් කුමාරයා ඉපදෙන කොටම ඒ බෝධිය කුඩාවට පැන නැගිල උන් වහන්සේගෙ බුද්ධත්වය දක්වාම ක්‍රමානුකූලව එක්තරා මට්ටමකට වැඩිල, ඒ මට්ටමින් වැඩීම නතර වෙලා එතැන් පටන් සෙල නවීකරණය වෙමින් ක්‍රියාත්මක වෙනවා.** එතකොට සහජාතයි කිව්වෙ උන් වහන්සේගෙ උප්පත්තියත් එක්කම ඒ පාරමිතා ශක්තියෙන් පැන නැගිච්ච නිසා. පොදුවේ මනුස්සයින්ගෙ ඇසක් සෘතු කරන ගති ලක්ෂණය ගිලිහිලා ගිය නිසා පොදුවේ මේ ඇසතු බෝධිය හට ගත්තත් වෙනත් ඇසතු ශාක වගේ නිකං ඇටවලින්, අතු කැබලිවලින් පහළ වුනේ නෑ. ඒ නිසා මේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙ, වෙනත් ඇසතු ශාකවලවත් දකින්න නැති විශේෂ ලක්ෂණයක් තියෙනවා. සාමාන්‍ය-යෙන් ශාකයක එක්තරා කාලයකට එනකල් සෙල මැරීමට සාපේක්ෂව වැඩීමේ වේගය වැඩි වෙලා, ඊළඟට නැවතත් සෙල වැඩීමේ වේගය ක්‍රමයෙන් අඩුවෙන කාලයක් එනවා. එතකොට ශාකයක් ක්‍රමානුකූලව උස මහත් වෙලා වැහැරීමේ වේගය, වැඩීමේ වේගය අභිබවා ගිහින් අවසානයේ මැරිල යනවා. නමුත් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙ සෙල එකදිගටම එකම වේගයකින් නවීකරණය වීමත්, කඳ උස මහත් නොවීමත් විශේෂ ලක්ෂණයක්. ඒ කියන්නෙ සෙල වැහැරීමේ වේගයයි වැඩීමෙ වේගයයි සමානයි. ඒ කාරණය අදත් දකින්න පුළුවන්. ඒ නිසා තමයි උද්භිත විද්‍යාඥයො පවා, එකාකා-රයෙන් සෙල නවීකරණය වන එකම රුක්ෂය විදියට මේ ජය ශ්‍රී මහා බෝධිය හඳුනාගෙන තියෙන්නෙ. (ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිබඳ සැබෑ තොරතුරු රැගත් ලිපියක් ඉදිරියේදී බලාපොරොත්තු වන්න.)

ඒ වගේම යම් කිසි විදියකට යහපත් දේවල්වලට නායකත්වය දීල ඒවා සමාජයේ යහපතට ක්‍රියාත්මක කරන ගති ලක්ෂණයක් මුල් කාලෙ මිනිස්සු ළඟ තිබුණා. ඒක නිකම්ම නායකත්වය දීමක් නෙවෙයි. ඥානය මුල් කරගෙන දෙන නායකත්වයක්. පසු කාලීනව ඒ ගති ලක්ෂණයත් දුරස් වෙලා ගිහින් නායකත්වයට අදාල ශක්තිය නා ශාකයේ පිහිටියා. පෙරුම් පුරන බෝසත්වරු අතරත් නායකත්වය කියන එක බොහෝ කොටම විශේෂ නිසා නා බෝධිය බුදුවරයන් වහන්සේලා කිහිප නමකටම සම්බන්ධයි. ඒ නිසා නා ගහත් ☞

ඥානයට සහ නායකත්වයට සම්බන්ධයි.

බත් කියන්නෙ යම්කිසි විදියකින් බිහි වෙන, පිබිදෙන අර්ථය දෙන වචනයක්. බත් මාසය කියන්නෙත් ඒ වගේ පිබිදෙන මාසයක්. මුල් කාලෙ මිනිස්සු ළඟ මිහිරියාව බිහි කරන ගති ලක්ෂණයක් තිබුණා. මිහිරියාව කියන්නෙ සමාජයේ යහපතට හේතු වෙන දෙයක්. පසු කාලීනව ඒ ගති ලක්ෂණය ගිලිහිලා ගිහින් ඒකට හිමි ශක්තියෙන් බත් මී කියන ශාකය හට ගත්තා. කටහඬ දුර්වල අයට, ඒ වගේම ශරීරයේ තියෙන යම්කිසි අම්හිරිතාවයන්ට බත් මී ගහේ පොතු බේත් විදියට ප්‍රත්‍ය වෙනවා.

ඒ වගේම පහට ලොල් වෙන ගති ලක්ෂණය කිව්වම පංච කාමයේ පහත්ම තත්ත්වයක් නෙවෙයි මුල් කාලෙ තිබුණෙ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ 5 සාධාරණ විදියට යහපත් අන්දමින් භුක්ති විඳපු ගති ලක්ෂණයක් තමයි මුල් කාලෙ තිබුණෙ. මේ 5 රස ධාතුවෙන් පූර්ණ වෙලා තිබ්බ මුල් කාලෙ මිනිස්සු ඒවට තණ්හාවෙන් පොර කෑවෙ නෑ, ගොඩ ගහගත්තෙ නෑ. නමුත් පසු කාලයක ඒ රස ධාතුව හීන වෙන්න පටන් ගත්තම ලෝක සත්වයා ඒවා තණ්හාවෙන් ගොඩ ගහගන්න, බදාගන්න කටයුතු කළා. එතකොට ඒ පහ ලෝලීත්වයෙන් ගත්තු කාලෙ තිබ්බ ශක්තිය පිටවෙලා ගිහින් ඒක පලොල් විදියට පිහිටියා.

කිණි කියල කියන්නෙ යම්කිසි විදියක කතා හඬ. කින් කියන කතා හඬ දුරු කරපු නිසා තමයි කින් + දුරු - කිඳුරු කියන්නෙ. කිඳුරට මනුස්සය වගේ පෙනුම තිබුණට මිනිස් භාෂාව කතා කරන්න බෑ. එතකොට කින් කියන කතාව නෑ කියන එකයි කිඳුරු කියන්නෙ. මේ කිඳුරො කියන්නෙ තිරිසන් සත්ව කොටසක්. එතකොට කිඳුරො වෙලා උපදින්න හේතුවෙන සංඛාරයක් තියෙනවා. ඒ කියන්නෙ මිනිස්සු හොඳ නෑ කියල අනිත් මනුස්සයොත් එක්ක අමනාපයෙන්, තරහෙන්, කතා නොකරන සමහර උදවිය ඉන්නවා. නමුත් මිනිස්සු ස්වභාවයෙන්ම හොඳ නෑ කිව්වට ඒක ගැලපෙන්නෙ නෑ. තමන් එක්ක ඇති වෙච්ච මොකක් හරි පලහිලව්වකට කෙනෙක් එක්ක තරහ වෙලා, ඒ හේතුවෙන් මුළු මිනිස් සමාජයටම සාප කරල, මිනිස්සු හොඳ නෑ කියල කාත් එක්කවත් කතා නොකර ඉන්නවා. නමුත් සමහර විට ඇත්තටම ඒ පුද්ගලයගෙම මොනව හරි අඩුපාඩුවක් නිසා ඒක සිද්ධ වුනා වෙන්නත් පුළුවන්. නමුත් ඒක පිලිගන්නෙ නෑ. මේක මෝහයෙන් සහ ද්වේශයෙන් ගන්න අදහසක්. ඒ විදියට දෘෂ්ටි ගත වෙලා අමනාප වෙලා කතා නොකර ඉඳල කින් දුරු කරපු නිසා තමයි, මියගිහින් මිනිස් ඇසුරින් ඈත ප්‍රදේශයක ඒ ගතිය අනුව කිඳුරො වෙලා උපදින්න හේතු වෙන්නෙ.

එතකොට මේ කාලෙත් මේ කිඳුරො නැහැයි කියන්න බෑ. මුහුදෙ ඉන්න දිය කිඳුරොත් ඒ වගේ ජාතියක්. ඉතින් ඒ වගේ ගොඩ බිමත් ඉන්න පුළුවන්. සමහර විට මනුස්සයින්ට වාසය කරන්න බැරි තරම් සීතල තියෙන හිම ප්‍රදේශවල අදත් ඉන්න පුළුවන්. මේ සතුන්ගෙ පෙනුම ගත්තොත් ස්වරූපයෙන් මනුස්සයො වගෙයි. පිටින් බැලුවම වෙනසකට තියෙන්නෙ දිය කිඳුරන්ගෙ දෙපැත්තෙන් වරලක් තියෙනවා. වරලින් උඩ කොටස මනුස්සයෙක් වගෙයි. ගොඩබිම ඉන්න කිඳුරන්ට අතපය කකුල් ආදියත් තියෙනවා. තටුත් තියෙනවා. උන්ට මිනිස්සුන්ට වගේ කතා කරන්න බැරි වුනාට බාහිර පෙනුමින් මිනිස්සු වගෙයි. උදාහරණ විදියට ගෝරිල්ලා මිනිස් වගේ පෙනුනට මනුස්සයො වගේ භාෂාවක් කතා කරන්න බෑ. හැබැයි මෙතනදි කිඳුරන්ට මනුස්ස බස කතා කරන්න බැරි වුනාට, උන්ගෙ අදහස්



හුවමාරු කරගන්න මොනව හරි ක්‍රමයක් තියෙන්න පුළුවන්. එතකොට මිනිස් කටහඬක්, භාෂාවක් නෑ කියන එකයි මේ කියන්නෙ. දැන් මේ කින් කියන වචනයේ තේරුම පෙන්වල දෙන්න තමයි මෙතනදි කිඳුරා උදාහරණයක් විදිහට ගත්තෙ.

එතකොට ඉස්සර හිටපු මිනිස්සු ළඟත් වැඩකට නැති වල් පල් කතා නොකර ඉන්න නිහඬතාවය කියන ගති ලක්ෂණයක් තිබුණා. හිරි කියන්නෙ ඒ කතා හඬ නවත්තල තිබුණයි කියන එක. හිරිඔතප් කියන්නෙත් ඒ වගේ දෙයක්. ඒ කියන්නෙ වැඩකට නැති දේවල් කතා කරන්න ලැජ්ජයි, බයයි. ඒකත් එක්තරා ගුණයක්. ඒ කියන්නෙ වැඩකට නැති කයිවාරු කතා නෑ, බොහොම නිහඬයි. ආර්ය තුෂ්ණිම්භූතභාවය කියන්නෙත් ඒ වගේ දෙයක්. නමුත් පසු කාලීනව ඒ නිහඬතාවය හිර කරල තිබ්බ ගති ලක්ෂණය හෙවත් කින් හිරි කරපු ගති ලක්ෂණය ගිලිහිලා ගිහින් විවිධ කයිවාරු කතාවලට බහින්න ගත්තම ඒ ශක්තිය පිටවෙලා කිණිහිරි කියන ශාකයේ පිහිටියා.

ඒ වගේම ස්ථාන හා අස්ථාන කියල වචන දෙකක් තියෙනවා. රුක් කියල කියන්නෙ කෙලින් නැගී හිටීමේ ගති ලක්ෂණය. රුකක් වගේ කියන්නෙත් ඒකයි. මුල් කාලෙ ඒ රුක් කියන ගති ලක්ෂණයට ස්ථානයක් තිබුණා. එතකොට රුක් අස්ථාන වෙනව කියන්නෙ මුල් කාලෙ තිබ්බ රුක් ගතියට තැනක් නැති වුණා කියන එක. එතකොට රුක් ස්ථාන කියන ගති ලක්ෂණයට හිමි ශක්තිය පිටවෙලා ගිහින් රුක්අත්තන විදියට පිහිටියා.

හැබැයි මෙතනදි ව්‍යවහාරයේ පහසුවට රුක්ෂ කියල කිව්වට හරි වචනය තමයි සෘක්ෂ. ඒ කියන්නෙ සෘණ ගතිය හෙවත් වැහැරෙන ගතිය ක්ෂය කරන අර්ථයෙන්. සෘණ ගතිය හෙවත් වැහැරෙන ගතිය තියෙන්නෙ වැල්වලට. ඒ සෘණ ගතිය ක්ෂය කළාම එන්නෙ ධන ගතියක්. ඒක තමයි සෘක්ෂ (ගස්) වෙන්නෙ. රුක්ෂ කිව්වොත් ඒකෙන් නියම විදිහට අදහස් වෙන්නෙ රුක් කියන කෙලින් සිටීමේ ගතිය ක්ෂය වුණා කියන එක. රුක් ක්ෂය කළාම නැවතත් වැල් බවට පත් වෙනවා. නමුත් ව්‍යවහාරයේ පහසුවට තමයි සෘක්ෂ - රුක්ෂ වෙලා තියෙන්නෙ.

ග්‍රාම්‍ය කියන්නෙ පහත් ගතිවලට. මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ ඒ ග්‍රාම්‍ය ස්වභාවය හලන ගති ලක්ෂණයක් තිබුණා. ගම්මා හලු කියන්නෙ ඒ වගේ පහත් දේවල් හලා දමන ගති ලක්ෂණය. ඒ ගති ලක්ෂණය පිටවෙලා ගියාම ඒකට හිමි ශක්තිය ගම්මාලු විදියට පිහිටියා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ ලෝකය තණ්හාවෙන් අල්ල ගෙන බදාගන්න ගති ලක්ෂණයක් තිබුණෙ නෑ. අතහැරීම හෙවත් නොගන්න ස්වභාවය තමයි බොහෝ කොටම තිබුණෙ. අන්න ඒ නොගන්න ගති ලක්ෂණය පසු කාලෙක දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය නුග විදියට පිහිටියා. නොගන්නවා කියන අර්ථය කෙටි වෙලා තමයි නුග වුණේ.

කළණ කියන වචනය හිතවත්කම කියන අර්ථයෙන් ලෝක

සම්මතයේ කතා කළාට ඊට එහා ගිය ගැඹුරු අර්ථයක් ඒකෙ තියෙනවා. **කලු කියන්නෙ කෙලෙස්වලට. කලු කියන කෙලෙස් නසන අර්ථයෙන් කළණ කියනවා.** සල් කියන්නෙ සහයට අල්ලනවා කියන අරුත. සහායට අල්ල ගෙන කලු (කෙලෙස්) නසන ගති ලක්ෂණයක් මුල් කාලෙ තිබුණා. ඒ කියන්නෙ යහපත් පිරිස් එකතු වෙලා කෙනෙකුගෙ තියෙන නරක ගති නසල යහපත් පුද්ගලයෙක් බවට පත් කරනවා. ඒ ගති ලක්ෂණය දුරස් වුනාම ඒකට අදාල ශක්තිය පිටවෙලා ගිහින් සල් කළණ කියන ශාකයේ පිහිටියා.

කු කියන්නෙ පහත් දේවල්. අඹ කියන්නෙ හිතවත්කම. උක් කියන්නෙ උදුරා දමනවා. වෙනත් විදියකින් කියනව නම් නරක දේවල් උදුරා දමල හොඳ දේවල් උකහා ගන්නවා. එතකොට මුල් කාලෙ කු කියන පහත් නින්දිත කාමයන්ට තිබ්බ්ච හිතවත්කම උදුරා දමන ගති ලක්ෂණයක් තිබුණෙ. ඒ ගති ලක්ෂණය ඉවත් වුනාම ඒකට හිමි ශක්තිය කු + අඹ + උක් - කුඹුක් විදියට පිහිටියා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ලෝකයට හිතවත්ව යහපත් පැත්තට කටයුතු කළා. දිය කියන්නෙ ලෝකය. අඹ කියන්නෙ හිතවත්කම. දියට බැඳීමෙන් වූ ළය කියන්නෙ ලෝකයට හිතවත්ව කටයුතු කරන ගති ලක්ෂණය. ඒ ගති ලක්ෂණය දුරස් වුනාම ඒකට හිමි ශක්තිය පිටවෙලා ගිහින් දිය + අඹ + වූ ළය - දිඹුල කියල ශාකයක පිහිටියා. දිඹුල් කියල කතාවට කිව්වට දිඹුල තමයි මුල් වචනය.

පත කියන්නෙ ආහාරය. බත් පත, වතුර පත, බෙහෙත් පත ආදී වශයෙන් කියන්නෙත් ඒකයි. ආහාරය නිසා ඇති කරගන්නා හිතවත්කමක් මුල් කාලෙ මිනිස්සු ළඟ තිබුණා. ඒ කියන්නෙ තමන්ට කන්න බොන්න දුන්නු අයට හිතවත්ව සලකන ගති ලක්ෂණය. නමුත් පසු කාලෙක, කාපු පතට ආලය කරන ඒ ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය පත් + කැ + ආල - පත්කැල විදියට ශාකයක පිහිටියා.

ඒ වගේම මේ පත්කැල ගහෙත් මොනව හරි විශේෂ ශක්තියක් තියෙනවා. ඒ කියන්නෙ තරුණ බවට පත් කරන ඖෂධ ශක්තියක්. නමුත් ඒ කාරණයට අදාල මූලික තොරතුරු මේ වෙන කොට ගිලිහිලා ගිහින් තියෙන නිසා ඒක සටහන් කරන්න විදියක් නෑ. නමුත් පැරණි වෙද මහත්වරු කියන විදියට ඒක මෙහෙම දෙයක්. මේ පත්කැල ගහ සිදුරු කරල ඒක ඇතුලට එක්තරා බේත් වර්ගයක් දාල දවස් ගණනක් තියල, ඒක නැවත එළියට ගත්තම ඒ ගහේ තිබ්බ්ච යම්කිසි රසායන ශක්තියක් අර බේතට ඇදල ගන්නවා. ඊට පස්සෙ වයසට ගිය කෙනෙක් ඉර එළිය වදින්නෙ නැති වෙන්න කාමරයකට අරගෙන කොටු කරල ඒක බේතක් විදියට දෙනවා. එහෙම දුන්නට පස්සෙ ඒ මනුස්සයගෙ ඉදිච්ච කෙස් ගස්, දත්, නියපොතු ආදී සියල්ලම හැලිල මාසයක් ඇතුළතදි නැවතත් තරුණ වෙලා අර හැලිච්ච කෙස්, දත්, නියපොතු ආදිය නැවතත් එනව කියනවා.

හැබැයි මේ කාරණය බටහිර වෛද්‍ය විද්‍යාවෙන් පිළිගන්න එකක් නෑ. මොකද එහෙම දෙයක් බටහිර වෛද්‍ය විද්‍යා සිද්ධාන්තවලට ගැළපෙන්නෙ නැති නිසා. ඒ වගේම ඒකෙ සත්‍යතාවය දැන් හොයන්න විදියක් නෑ. මොකද සම්පූර්ණ තොරතුරු නැති නිසා. නමුත් ඒ කාරණය පැරණි ඍෂිවරු පෙන්වල දීපු බේතක් විදියට ඒ අයගෙ මුතුන් මිත්තන්ගෙන් පැවතිලා ඇවිත්, ඒ



පරම්පරාවෙ වයසට ගියපු කෙනෙක් ඒ බේත පාවිච්චි කරල නැවතත් තරුණ වෙලා සැහෙන කාලයක් ජීවත් වුණා කියල කියනවා. එතකොට මේ කාරණය සටහන් කළේ, මේ වයසට යන එකත් වළක්වල හොඳට ලස්සනට කාල බීල ලෝකෙ ජීවත් වෙන්න ක්‍රමයක් තියෙනවයි කියන්න නෙවෙයි, මේ ශාකවල මේ වගේ අපිට හිතාගන්නත් බැරි ඖෂධ ශක්තීන් ගැබ්වෙලා තියෙන බව පෙන්වන්න. ඉතින් මේ වගේ මනුස්සයින්ගෙ යහපතට යොදාගන්න තිබ්බ්ච ඖෂධ ක්‍රම අද වෙන කොට බොහෝ දුරට ගුරු මුෂ්ටි වශයෙන් තියාගෙන යටපත්වීම නිසා ඒව දැනගන්න ක්‍රම නැති වෙලා තියෙනවා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ අරුත් බර දේවල් මුහු කරගන්න ගති ලක්ෂණයක් තිබුණා. ඒ විදියට අරුත් මුහු කරගෙන වැඩ කටයුතු කරල මෙලොව පරලොව අභිවෘද්ධිය සලස ගත්තා. පසු කාලෙක ඒ ගති ලක්ෂණය දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය මුහු + අරුත - මුරුත විදියට ශාකයක පිහිටියා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ මහ ආර්ය ගුණ තිබුණා. ඒ කියන්නෙ බුදුන් වහන්සේ ප්‍රමුඛ ආර්ය පරම්පරාවෙන් ආපු උතුම් ගුණධර්ම. ඒ තිබ්බ්ච මහ ආර්ය ගුණත් පසු කාලෙක දුරස් වෙලා ගියාම ඒකට හිමි ශක්තිය මහ + අරිය - මහරිය කියල ශාකයක පිහිටියා.

ඒ වගේම මුල් කාලෙ හිටපු මිනිස්සු ළඟ මහ හරය කියල දෙයක් තිබුණා. ඒ කියන්නෙ බුදුවරු, ඍෂිවරු වගේ සත් පුරුෂයන් හඳුන්වා දීපු ගුණ ධර්ම. ඒ මහ හරයත් සමාජයෙන් දුරස් වෙලා ගියාම ඒකට හිමි ශක්තිය මහ + හර - මාර කියල ශාකයක පිහිටියා. ඒකත් මහරිය වගේම ශාකයක්. සමාන ගති ලක්ෂණ ගිලිහිලා තමයි ඒ ශාක හට ගත්තෙ.

කරවු කියන්නෙ ක්‍රියා-කාරීත්වයට ආපු ගතිය කියන අර්ථය. රත් වෙනවයි කිව්වම මිනිස්සු හොඳ නරක දෙකටම රත් වෙනවා. මුල් කාලෙ මිනිස්සු යම්කිසි විදියකට ක්‍රියාකාරීව වැඩක් පළක් කරන කොට රත් වෙන ගතියක් තිබුණයි කියන්නෙ, ඒ වැඩේ ප්‍රබෝධමත්ව උනන්දුවෙන් උද්යෝගයෙන් කරන්න පුළුවන් ගති ලක්ෂණයක්. ඒ වගේම සමාජයේ යහපතට වැඩ කටයුතු කරන කොටත් අනුකම්පාව නිසා රත් වෙනවා. මේ ගති ලක්ෂණය පසු කාලෙක දුරස් වෙලා ගිහින් ඒකට හිමි ශක්තිය රත් කරව්වල පිහිටියා.

ඊළඟට මුල් කාලෙ මිනිස්සු ළඟ රෞද්‍ර ගතිය, රළු ගතිය නැති ස්වභාවයක් තිබුණා. නමුත් පසු කාලෙක මිනිස්සු රළු වෙන්න පටන් ගත්තා. එතකොට රළු නැති ගති ලක්ෂණයට අදාල ශක්තිය පිට වෙලා ගිහින් නෑ රළු - නෙරළු කියන ශාකයක පිහිටියා.

පූ කියන වචනයෙන් විවිධ අර්ථ පෙන්වනවා. ආහාරයට පූ කියනවා. පුහු දේවල්වලටත් පු කියනවා. මුල් කාලෙ මිනිස්සු ළඟ පුහු දේවල් හලන ගති ලක්ෂණයක් තිබුණා. ඒ කියන්නෙ වැඩකට නැති කතා, ක්‍රියා ඉවත් කරපු ගති ස්වභාවයක්. නමුත් පසු කාලෙක පුහු හලන ගති ලක්ෂණයත් දුරස් වෙලා ගියාම ඒකට හිමි ශක්තිය හපු කියන ශාකයක පිහිටියා. හපු කියන එක තමයි ව්‍යවහාරයෙන් සපු වුණේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන


**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ජීවයේ සම්භවය සහ පරිණාමය ගැන තවදුරටත්...

ජීවීන්ගේ ආරම්භය සහ මේ දක්වා විකාශනය වූ පරිණාමය සම්බන්ධයෙන් දහමට අනුව යම් විග්‍රහයක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. ඒ වගේම වසර කෝටි 100 කට වරක් මහද්වීප උඩ යට ගිහින් සිද්ධ වෙන විනාසය ගැනත් යම් පැහැදිලි කිරීමක් කළා. දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, එතකොට ලෝක විනාසය, කල්ප විනාසය ආදී වශයෙන් මීට පෙරත් සඳහන් කළේ මොනවද, මනුස්සයින්ගෙ ආයුස අඩු වෙලා ගිහින් මුරුගසන් වරුසාවක් වැහැල ඇති වන ලෝක විනාසය මොකක්ද ආදී වශයෙන්. මහා කල්පයක් අවසානයේදි ලෝකාන්තරික නරකයත්, ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් ඉහළ පිහිටි බඹ තලත් හැර සතර අපාය ඇතුළු ඉතිරි සියලුම ලෝක සුන්නද්ධූලි වෙලා විනාස වෙන බව මීට පෙර මේ සඟරාවෙම පළවූ ලිපියකින් හෙළි කළා. ඒ තමයි මේ සියලුම විනාශයන්ගෙන් මහා විශාලම ලෝක විනාසය. ඒ විනාසයට සතර අපායේ දුක් විඳින කුරා කුඹියෙක්වත් ඉතුරු වෙන්නෙ නෑ. ඒ වගේම මනුස්සයින්ගෙ පරමායුස අසංඛයේ ඉඳන් අවුරුදු 10 දක්වා අඩු වෙලා සිද්ධ වෙන විනාසයක් ගැනත් සඳහන් කළා. ඒක කල්ප විනාසයක්. ඊළඟට මේ අතරතුරේදි මහද්වීප උඩු යටිකුරු වෙලා සිද්ධ වෙන විනාසයත් මහා කල්පයක් තුළ සිද්ධ වෙන තවත් අතරමැදි විනාසයක්. ඒකත් සාමාන්‍යයෙන් සිද්ධ වෙන ලෝක ධර්මතාවයක්. හැබැයි ඒක විශේෂයෙන් විග්‍රහ කරල නෑ. මේ අවසානයට සඳහන් කරපු අවස්ථා දෙකේදිම මනුස්ස ලෝකය සුන්නද්ධූලි වෙලා යන්නෙ නෑ. මනුස්සයින් සුළු ප්‍රමාණයක් හරි ඉතුරු වෙනවා.

එතකොට මහා කල්ප විනාසය එකක්. ඒක අන්තඃ කල්ප 20 ක් තිස්සෙ සිද්ධ වෙන දෙයක්. ඒකෙන් තමයි අර ලෝකාන්තරික නරකය සහ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් ඉහළ හැර පහළ සියලුම ලෝක විනාස වෙනවයි කිව්වෙ. එහෙම විනාස වෙලා පවතින තවත් අන්තඃ කල්ප 20 ක් තියෙනවා. ඊළඟට ඒ විනාසයෙන් පස්සෙ නැවතත් ලෝකය හැදෙන්න තවත් අන්තඃ කල්ප 20 ක කාලයක් ගත වෙනවා. ඊට පස්සෙ එහෙම හැදිල පවතින තවත් අන්තඃ කල්ප 20 ක කාලයක් එනවා. දැන් අපි මේ ඉන්නෙ ඒ විදියට හැදිල පවතින අන්තඃ කල්ප 20 කාල සීමාව ඇතුළත. මේක අවසානයේදි නැවතත් විනාස වෙන්න පටන් ගන්නවා. ඒ විනාසය මෛත්‍රී බුදුන් වහන්සේ පහළ වුනාටත් පස්සෙ සිද්ධ වෙන දෙයක්. එතනදි අන්තඃ කල්ප 20 කම කාලයක් ඒ විනාසය සිද්ධ වෙනවා. ඒක අති දීර්ඝ කාලයක්. මේ විදියට අන්තඃ කල්ප 80 ත් අන්තඃ කල්ප 20 ක් ඇතුලත තමයි මේ මනුස්සයො මනුස්ස ලෝකෙ ජීවත් වෙන්නෙ. සතර අපාගත වෙලා දුක් විඳින්නෙත් ඒ කාලය තුළමයි. ඉතිරි අන්තඃ කල්ප 60 ම ආභස්සර බඹ ලොවේ හෝ ඉන් ඉහළ බ්‍රහ්ම ලෝකයක





තමයි ඉන්නෙ. ඒ වගේම අන්තඃ කල්ප 20 ක හැදෙන කාලය තුළ ප්‍රථම ධ්‍යාන තලයටත් එනවා (ලෝකාන්තරික නරකයේ ඉන්න සත්වයින් හැර) එතකොට මේ පවතින අන්තඃ කල්ප 20 ඇතුලත සිද්ධ වෙන පොඩි විනාසයක් තමයි මහද්වීප උඩු යටිකුරු වීමෙන් සිද්ධ වෙන්නෙ. හැබැයි පොඩි විනාසයක් කියල කිව්වෙ මහා ලෝක විනාසයට සාපේක්ෂව මිසක් නැත්නම් පොඩි නෙවෙයි. එතකොට කල්ප විනාසයක් කියන්නෙ ලෝක විනාසයකට පෙර යම් කිසි කාලයක් තුළ ඇතිවන්නා වූ විනාසයක්. කාල ප්‍රදේශ කියන එක තමයි කල්ප කියන්නෙ. ඒ අතර තුර සිද්ධ වෙන තවත් විනාසයක් තමයි මහද්වීප උඩු යටිකුරු වීමෙන් සිදුවන විනාසය. මේ අතර කාලය තුළත් තව තව විනාසයන් සිද්ධ වෙනවා. ඒව නම් අපිට අදත් දකින්න තියෙනවා. සුනාමි, කඳු කඩා වැටීම් ආදී වශයෙන් එන්නෙ ඒව තමයි. ඒ වගේ අතර මැදි විනාසයන් මනුස්සයින්ගෙ දස අකුසල් නිසාමයි බොහෝ කොටම සිද්ධ වෙන්නෙ.

ඒ වගේම මෛත්‍රී බුදුන් වහන්සේ පහළ වෙන්න තවත් අවුරුදු 57 කෝටියකට අධික කාලයක් ගත වෙන බව මීට පෙරත් සඳහන් කළා. උන් වහන්සේ පහළ වෙලා ඒ ශාසනයත් විනාස වෙලා ඊළඟට එන අබුද්ධෝත්පාද කාලයක තමයි ඊළඟ මහාද්වීප උඩු යටිකුරු වීමෙන් එන විනාසයක් සිද්ධ වෙන්නෙ. මොකද අවුරුදු කෝටි 100 කට සැරයක් තමයි ඒක වෙන්නෙ.

එතකොට ජීවීන්ගේ ආරම්භය ඒක සෛලික ජීවීන්ගෙන් සිද්ධ වුනයි කියල නවීන විද්‍යාවෙන් කිව්වට දැන් ඔය අවුරුදු ලක්ෂ ගණන් පැරණි පොසිල, මිනිස් පා සටහන් ආදියත් හමුවෙලා තියෙනවා. එතකොට ඒ කාලෙ ඒක සෛලික ජීවීන් විතරක් නෙවෙයි, මිනිස්සුත් ඉඳල තියෙන බව තහවුරු වෙන බවත් පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. ඒ විදියට මිනිස් පා සටහන් හමු වෙන්නත් හේතුවක් තියෙනවා. මේ එක මහාද්වීපයක් යට ගිහින් විනාස වෙන කොට අති විශාල කම්පනයක් සිද්ධ වෙනවා. මහාද්වීපයක් මුහුදට ගිලා බැසීමේදී මුහුදෙන් පිටාර ගලන මහා ජල කඳත් එක්ක එන කම්පනයෙන් විවිධ වායු, තෙල් ආදිය ගිනි ගෙන විශාල ගිනි ජාලාවක් ඉහළ ආකාසෙට නැගෙනවා. නමුත් ගින්නට වඩා පැතිරෙන්නෙ මහා ජල කඳ. ඒක අනෙක් මහාද්වීපවලටත් පැතිරෙනවා. ඒ කම්පනය ඒ තරම් විසාලයි. ඉතින් අනිත් මහාද්වීපත් මුහුදට ගිලා නොබැස්සට ඒ මහා ජල කඳට හොඳා පාළුවට ලක් වෙලා කඩා බිඳගෙන මුහුදට යනවා. ඒ විනාසය නිසා මේ මහාද්වීපවල ඉන්න මිනිස්සුන්ගෙන් කෝටියකට 10 ක්වත් ඉතුරු වෙයිද කියන්න බෑ. ඒ තරම් විසාල විනාසයක්. හරියට මහා සුනාමියක් වගෙයි. දැන් සිද්ධ වෙන පොඩි කම්පනයකින් පවා එන විනාසය අද අපිට ඇස් දෙකටම දැක ගන්න ලැබිල තියෙනවා. එතකොට අර වගේ මුළු මහාද්වීපයක්ම ගිලා බහින කොට සිද්ධ වෙන ☞

විනාසය කොච්චර නම් විශාල එකක්ද? ඒ විදිහට මහාද්වීපයක් යට ගිහින් තවත් මහාද්වීපයක් විදියට උඩට එන්නෙ, මුහුදෙ පතුලෙ යට වෙලා තිබිච්ච තවත් මහාද්වීපයක්මයි. ඒ මහාද්වීපය තනිකරම රොන් බොර ගොඩක් එක්ක තමයි මුහුද යට තිබිල මතු වෙන්නෙ. එතකොට ඒවායේ තිබිච්ච කැල්සියම් මිශ්‍ර ද්‍රාවණ, ගල් ගැසීමෙන් හට ගත් පොසිල ආදියත් උඩට මතු වෙනවා. ඒ කියන්නෙ ඒ මහාද්වීපය මුහුද යට තියෙද්දි ජීවත් වෙච්ච සත්ත්වයින්ගෙ සහ ශාකවල කොටස් සනීභවනයෙන් සකස් වෙච්ච ඒවා.

එතකොට කොහොමද මිනිස් පා සටහන් ඒවට ආවෙ. ඔය මහාද්වීපයක් උඩ යට ගිහින් සිද්ධ වෙන විනාසයෙන් පස්සෙ එතනට ළං වෙන්න තරම් මිනිස්සු මේ ලෝකෙ නෑ. ඒ වගේම සාමාන්‍ය මනුස්සයෙකුට ඒ වගේ තැනකට ගිහින් අඩිය ගහන්නත් බෑ. මොකද ඉස්සෙල්ලම තියෙන්නෙ මහා රොන් බොර ගොඩක්. ඒ වගේ තැනකට සාමාන්‍ය මනුස්සයෙක් අඩිය තිබ්බොත් ඔළුවත් එක්කම මඩ යට යනවා. ඒ නිසා යම්කිසි කාලයක් යන කල් සාමාන්‍ය මනුස්සයෙකුට යන්න එන්න පුළුවන් තැනක් නෙවෙයි මේ කියන්නෙ. ඒ වගේම ඒ කාලෙට අනෙක් මහද්වීපවල ඉතිරි වෙච්ච මිනිස්සු ටිකත් නිකං වැදි ගෝත්‍රිකයො වගෙයි. එහෙම තමයි සෑහෙන කාලයක් යනකල් ජීවත් වෙන්නෙ. ඒ ගොඩට ආපු මඩ මිදිල සාමාන්‍ය පස් තට්ටුවක් බවට පත්වෙන්නත් යම්කිසි කාලයක් යනවා. ඒ කාලෙ බැලුවම හැම තැනම මඩ සහිත රොන් බොර වළවල් තමයි තියෙන්නෙ. ඒ කියන්නෙ කැල්සියම් සහිත හුණු ගල්, මුහුද යට තිබිච්ච මඩ තට්ටු ආදී සියල්ල එකතු වෙලා හැම තැනම ආවාට වගේ හැදිල තියෙන්නෙ. ඒව හයි වුණාට පස්සෙ තමයි ඉහළ පස් තට්ටුවක් ඇති වෙන්නෙ. ඒකට තවත් කාලයක් ගත වෙනවා.

ඉතින් ඔය මුල් කාලෙ ඒ වගේ තැනකට අඩියක් තිව්වොත් තමයි ඒ පා සටහන ගලේ කෙටුව වගේ හිටින්නෙ. නමුත් ඒ අවස්ථාවෙදි එතනට යන්න පුළුවන් වෙන්නෙ යම්කිසි අභිඥා ලාභියෙකුට විතරයි. ඒ කියන්නෙ අබුද්ධෝත්පාද කාලයක් නිසා පසේ බුදුවරයන් වහන්සේ නමක් හෝ වෙනත් ලෞකික අභිඥාලාභීන් හිටියොත් උන් වහන්සේලා ඒ විනාසයට අහු වෙන්නෙ නෑ. උතුරු කුරු දිවයිනට හෝ වෙනත් දෙවු ලොවකට හෝ වඩිනවා. මොකද මේ **අපි ඉන්න මනුස්ස ලෝකයට තමයි ඔය මහද්වීප උඩ යට ගිහින් සිද්ධ වෙන විනාසය බලපාන්නෙ. සංඛාර මූලික වෙච්ච මේ ජම්බුද්වීපයේම තමයි ඔය පරිවර්තන සිද්ධ වෙන්නෙ. උතුරු කුරු දිවයින, දිව්‍ය බ්‍රහ්ම ලෝක ආදිය පුණ්‍ය විපාකයට පහළ වෙච්ච ලෝක නිසා ඒවා ඔය විනාසයට අහුවෙන්නෙ නෑ.**

එතකොට අර වගේ ඍද්ධි බල තියෙන කෙනෙක් හිටියොත්, මේ වෙච්ච විනාසය දැක බලා ගන්න එතනට ඍද්ධි බලෙන් එන්න පුළුවන්. මොකද ලෝකයට වෙලා තියෙන විනාසය දැක්කම උන් වහන්සේලාත් අනුකම්පාවෙන් ඇවිත් මිය පරලොව ගිය ලෝක සත්වයින්ට අප්‍රමාණ මෙත් සිත් පතුරුවල යම්කිසි ආශිර්වාදයක් කරන්න පුළුවන්. ඒ වගේම ඒ විනාසයෙන් මිය පරලොව ගිහින් ගන්ධබ්බයො වෙච්ච සත්ත්ව කොටස් අප්‍රමාණව ඔය හැම තැනම සැරි සරනවා. ඒ වෙද්දි ලෝකයේ ඉන්නෙ වැඩිහරියක් ගන්ධබ්බයො. ඉතින් උන් වහන්සේලා ඒ ශක්තිය පතුරුවල යම්කිසි චිත්ත ප්‍රසාදයක් ඇති කරල පුණ්‍යානුමෝදනාවක් කරන්න පුළුවන්. උදාහරණ විදියට අද අනිච්චාවත සංඛාරා කියන ගාථාව මළ ගෙවල්වලදි කියනව වගේ. එතකොට ඒ අභිඥාලාභීන් ඇවිත් ඍද්ධි බලයෙන් පය ගහපු තැන්වල ඔය විදියට පා සටහන් හිටින්නත් පුළුවන්. මොකද පසේ බුදුවරයන් වහන්සේ නමක් හෝ වෙනත් අභිඥාලාභියෙක් එහෙම පා සටහනක් තිව්වයි කියල ලොවුතුරා බුදුන් වහන්සේ නමකගෙ වගේ මංගල ලකුණු හිටින්නෙ නෑ. එහෙම විශේෂ ලකුණු පිහිටන්නෙ ලොවුතුරා බුදුන් වහන්සේ නමකගෙ විතරයි. ඒ නිසා ඔය වගේ පා සටහන් සාමාන්‍ය කෙනෙකුට අඳුන ගන්න පුළුවන් කමක් නෑ. ඒ වගේම දූනට හමු වෙලා තියෙන මිනිස් පා සටහන් ගත්තමත් ඒව හරි විසාලයි. මොකද ඔය කියන කාලෙ මිනිස්සුන්ගෙ ශරීරත් විසාල නිසා ඒ වගේ විසාල පා සටහන් තියෙන්න පුළුවන්. ඒ වගේම ළමා වයසෙ අය අභිඥාලාභීන් වෙලා හිටියනම් කුඩා පා සටහන් තියෙන්නත් පුළුවන්.

ඔය වගේ සිද්ධියක් මීට අවුරුදු ලක්ෂ ගණනාවකට පෙර සිද්ධ වෙලා තියෙන්න ඕන. ඒ කියන්නෙ අර කෝටි 100 කට වරක් සිද්ධ වෙන ක්‍රියාවලියක්. ඒකෙන් තමයි අත්ලාන්තික් සාගරය හැදිල ඕස්ට්‍රේලියා මහද්වීපය උඩට ආවෙ. එතනින් පස්සෙ නැවතත් ආපු ක්‍රම විකාශයක් තමයි අද මේ තියෙන්නෙ. ඒ කියන්නෙ ඒ විනාසයෙන් පස්සෙ ඉතිරි වෙච්ච මිනිස්සු ටික දෙනා ගල් යුගය, වැදි යුගය, ගොවි යුගය ආදී වශයෙන් පරිණාමය වෙලා ආපු ගමනක්. එතකොට ඒ විදියට විනාස වෙන කාලෙ වෙන කොටත් මේ ලෝකෙ ලෞකික අතින් සෑහෙන දියුණු පරිගණක, යන්ත්‍ර සූත්‍ර වගේ දේවල් තිබිල තියෙන්න ඕන. නැවතත් ඒ විනාසයෙන් පස්සෙ ක්‍රමයෙන් ඒ විදියට ලෞකික වශයෙන් දියුණු යුගයක් තමයි දූන් මේ උදා වෙන්නෙ. මොකද ඒකත් චක්‍රයක් වගේ සිද්ධ වෙන දෙයක්. කාලයකට ලෞකික දියුණුවේ උපරිමයටම ඇවිත් අර වගේ විනාසයක් සිද්ධ වුනාම නැවතත් මුල ඉඳන්ම පටන් ගන්නවා. ඊට පස්සෙ අර දියුණු තත්ත්වය නැවතත් කාලයකදි උදා වෙනවා. එහෙම ගිහින් නැවතත් විනාස වුනාම ඒ දියුණු තත්ත්වය නැවතත් බිංදුවටම බහිනවා. නැවත වතාවක් පටන් ගන්නවා. එහෙම චක්‍රයක් තමයි යන්නෙ.

දූන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, එතකොට ඔය හමුවෙන පා සටහන් සාමාන්‍ය මිනිස්සු නිකං පොළවෙ පය ගහපු අඩි වෙන්න බැරිද කියල. නමුත් නිකං පොළවෙ එරිච්ච පා සටහනක් එච්චර කලක් ඒ විදියට හිටින්නෙ නෑ. ඒක වෙනස් වෙලා යනවා. අද වුනත් වැහි කාලෙට මඩ ගොහොරුවක තියෙන අඩි දවසින් දෙකින් ගෙවිල යනවා. නමුත් මේ පැරණි අඩි සටහන් හමු වෙන්නෙ ඒ වගේ සාමාන්‍ය මඩවල තිබිල නෙවෙයි. සනීභවනය වෙච්ච කැල්සියම් ආදී කොටස් එක්ක තියෙන ශක්තිමත් මිශ්‍රණයක. ඒකෙ තියෙන සටහන් දිගටම රැඳෙනවා. අර වගේ ගෙවෙන්නෙ නෑ. එතකොට මහද්වීපයක් යට ගිහින් තව එකක් උඩට ආවම ඒ වගේ අවස්ථාවකදි එතනට අඩියක් තියන්න සාමාන්‍ය මනුස්සයෙකුට ළඟා වෙන්න බෑ. එහෙම ළඟා වෙන්න තරම් මිනිස්සුත් ඒ කාලෙට නෑ. ඒ නිසා අර කියපු ඍද්ධි බල, අභිඥාලාභියෙක් වගේ කෙනෙක් තමයි ඇවිල්ල පා සටහනක් තියන්න ඕන. එහෙම නැත්නම් ඔය වගේ විනාශයක් වෙලා තවත් කාලයක් ගිහින්, අතරමැදි කාලයක සිද්ධ වෙන ගිනි කඳු පිපිරීම් වගේ ක්‍රියාවන් නිසා ඇති වන ලාවාවල, ඒ කාලෙ ජීවත් වෙච්ච මනුස්සයින්ගෙ සහ සතුන්ගෙ පා සටහන් හිටින්නත් පුළුවන්. නමුත් ඒවා අර කියපු මුල් කාලීන පා සටහන් තරම් පැරණි නෑ. මේ මොන ක්‍රමයට හරි මිනිස් පා සටහන්, මිනිස් පොසිල හමු වීමෙන් කියන්නෙ මුල් කාලෙ ක්ෂුද්‍ර ජීවීන් විතරක් නෙවෙයි, මිනිස්සුත් හිටිය කියල. ඒ කාරණය ඔප්පු වෙන තැනක් තමයි වසර ලක්ෂ ගණන් පැරණි මිනිස් පා සටහන් සහ පොසිල.

ඒ වගේම මහද්වීපයක් යට ගිහින් උඩට ආවට පස්සෙ ඒකෙ යට තනිකර තියෙන්නෙ වතුර. ඒ වතුර පාර, යටින් හැම තැනම එක්තරා රටාවකට හැදිල පොළව යටින් ගලාගෙන යනවා. ඒ විදියට පොළොව යටින් ගලාගෙන යන දිය පාරවල් තමයි පසු කාලෙක උල්පත් බවට පත් වෙන්නෙ. ඒ උල්පතක් ගත්තමත් ඒක වටේට හැම වෙලේම සනීභවනය වෙච්ච ආවරණයක් තියෙනවා. ඒක ඇතුලෙන් තමයි වතුර පාර ගලාගෙන යන්නෙ. ☞

ඒ ආවරණයත් මහාද්වීප උඩ යට යෑමෙන් ඇති වෙච්ච එක්තරා රටාවක්. ඒ විදියට එකතු වෙච්ච වතුර ගලා ගෙන යන කොට තමයි පොළව යට උල්පත් ඇති වෙන්නෙ. එහෙම හැදිච්ච උල්පත් රටා තමයි කඳු මුදුන්වල ඉඳන් පහළට ගලාගෙන එන්නෙ. **අර මහාද්වීපය ඇතුලෙ තිබ්ච්ච වතුර පීප්ප වගේ ගලාගෙන යන ක්‍රමයක් හැදිල ඒකෙන් තමයි දැන් තියෙන උල්පත් පවා හැදිල තියෙන්නෙ.**

ඊළඟට මේ පරිණාමවාදය ගැන කතා කරන කොට මිහිමත හිටපු විසාල ඩයිනෝසරයින් වඳ වුනේ විසාල උල්කාපාතයක් වැටීමෙන් කියල නවීන විද්‍යාවෙන් මතයක් ඉදිරිපත් කරනවා. නමුත් එහෙම උල්කාපාතයක් වැටුන නම් ඩයිනෝසරයින් විතරක් නෙවෙයි මොකෙක්වත් ඉතුරු වෙන්නෙ නෑ. ඒක එහෙම වුනානම් දැන් මේ ඉන්න අලි ඇත්තු කොටි වලස්සු ආදිය විතරක් නෙවෙයි, මිනිස්සුත් ඉන්න විදියක් නෑ. නමුත් එහෙම උල්කාපාතයක් හරි වැටිල විනාස වුනා නම් ඩයිනෝසරයින් හිටියෙ ලෝකෙ එක තැනක විතරද? එතකොට තවත් කොච්චර නම් වනාන්තර ලෝකෙ තිබුණද? ඒ හැම තැනම හිටපු ඩයිනෝසරයින් එක සැරේම විනාස වුනේ කොහොමද? එතකොට ඒ හැම තැනකටම උල්කාපාත වැටුනද? ලෝකයේ කලින් කල හට ගන්නා පාරිසරික, දේශගුණික රටාවන් අනුව සමහර සතුන්ට ඉන්න සුදුසු අවස්ථාත්, සමහර සතුන්ට ඉන්න බැරි අවස්ථාත් උදා වෙනවා. ඒ වගේ **උන්ට අවශ්‍ය පරිසරය නැති වෙච්ච නිසා ඩයිනෝසරයින් විනාස වෙලා වඳ වුනා මිසක් උල්කාපාත වැටිල විනාස වුනා නෙවෙයි.** ඒ විවිධ පාරිසරික රටාවන් අනුව කාලෙන් කාලෙට විවිධ සත්තු එනව යනවා. යම්කිසි ප්‍රදේශයක් විනාස වුනාම කාලයක් යන කොට නැවත වරක් ගස් කොළං හැදිල පිටස්තර සත්තු සංක්‍රමණය වෙන්න පටන් ගන්නවා.

**මෙතනදි මොන සතෙක් වුනත් පටිච්ච සමුප්පාදයට අනුව හැදෙන ක්‍රමයක් තියෙනවා. මනුස්සයො වෙලා ඉඳෙද්දි වඩන සංඛාර අනුව තමයි ඊළඟ සත්ව ජාතිය හට ගන්නෙ. වචනෙ මොන භාෂාවෙන් ආවත් පද නිරුක්තිය අනුව, දූවුනෝ සිරස් කියන අදහස තමයි ඩයිනෝසිරස් කියන්නෙ. ඒ කියන්නෙ ඔළුව ගිනි ගත්තු අය.** මොකද කාලෙකදි රජවරුන්ගෙ, රාජ්‍ය නිලධාරීන්ගෙ අණ මත තහනමට ලක් වෙච්ච අය හිටියා. ඒ කියන්නෙ දුටු තැන මරන්න, එහෙම නැත්නම් යම් කිසි විදියකින් අල්ල ගෙන හිර කරන්න, දේපල තහනම් කරන්න ආදි වශයෙන් කෙනෙකුගෙ හිස ගිනි ගන්න ස්වභාවයේ නියෝග දීල ඒව ක්‍රියාත්මක කරපු උදවිය. එහෙම අණ කළාට පස්සෙ ඊට අදාල නිලධාරීන් ගිහින් පාරවල් ගානෙ කඩු කිණිසි වගේ ආයුධ තියාගෙන සෙනග බය ගන්වල හිස ගිනි ගන්න විදියට කටයුතු කළා. එහෙම කරල ඒ අයගෙ දේපල අරගෙන පනිනවා. එහෙම නැත්නම් පළිගන්නවා, මරනවා. ඉතින් ඒ කාලෙ බොහොම ශක්තිමත්, දරදඬු අය තමයි ඒ වගේ දේවල් කළේ. ඊට පස්සෙ ඒ කරපු විපාකයට ඒ අයටත් වන්දි ගෙවන්න සිද්ධ වෙන අවස්ථාවක් කවද හරි උදා වෙනවා. එතකොට හේතුවට අනුකූල ඵලය විදියට ඒ අය මැරිල ගිහින් ඒ ගති ලක්ෂණයෙන් ඩයිනෝසිරස් විදියට කය සකස් වෙලා උප්පත්තිය ලබනවා.

එදා තමන්ගෙ බලපුළුවන්කාරකම් පෙන්වල බලහත්කාරයෙන් තමයි කෑවෙ. ඊළඟට ඩයිනෝසිරස් වෙලා හුඟක් කන්න ඕන වුනත් අර විපාකය නිසා කඩාගෙන කන්න ඇතෙකුට වගේ හොඬවැලක් නෑ. නමුත් බඩගින්නත් වැඩියි, කන්නත් ඕන. ඒ වුනාට ඕන දේවල් කන්න විදියක් නෑ. අර කරුමෙට දුක් විඳින්න ඉපදිච්ච හැටි. ඒ නිසා තමයි කන්න නැතිව මැරිල වඳ වුණේ. බිම් මට්ටමේ විසාල ගස් කොළං නැත්නම් උන්ට කන්න විදියක් නෑ. මොකද උඩ තියෙන මහ ගස්වල අතු කඩාගෙන කන්න බෑ. අත් දෙකෙනුත්, කකුල් දෙකෙනුත් එහෙම කඩාගෙන කන්න බෑ. ඔළුවෙන් ඒක කරන්නත් බෑ. ඒ වගේම තවත් සතෙක් අල්ල ගෙන කන්න පුළුවන්කමකුත් නෑ. මොකද උගේ දේහය විසාල නිසා ඒකට ලෑස්ති වෙන කොටම සත්තු පැනල යනවා. ඉතින් මැරිච්ච සතෙක් හිටියොත්, එහෙම නැත්නම් පහළ තියෙන පොඩි පොඩි ගස් කොළං තිබුනොත් තමයි පෙරල ගෙන කන්න වෙන්නෙ. ඒකත් ටික කලක් යද්දි හිඟ වෙනවා. උන්ගෙ විනාසෙටමයි ඒකත් වෙන්නෙ.

මිනිස්සුන්ගෙ හිස ගිනි ගන්වල බලෙන් ආපු එකේ විපාකය ඒ විදියට විඳින්න සිද්ධ වුණා. හැබැයි උන් වැනසිලා ගියාට ඒ විපාකය ඉවර නැත්නම් තවමත් ගන්ධබ්බ ලෝකෙ ඩයිනෝසිරස් ගන්ධබ්බයින් විදියට ඉන්න පුළුවන්. නමුත් පරිසර තත්ත්වයන් නැති නිසා ඒ ගන්ධබ්බයින්ට උප්පත්තියකට එන්න බෑ. කර්ම ශක්තියෙන් ඒ ගන්ධබ්බ ලෝකෙ ඉඳගෙනම විපාකය විඳවනවා. නමුත් කවද හරි නැවතත් අර කලින් තිබ්ච්ච පරිසර තත්ත්වයක් ඇති වුනොත් උන් නැවතත් ඇති වෙන්න පුළුවන්.

ඒ වගේම පිටසක්වලින් ආපු විශාල උල්කාපාත වැටීමෙන් විශාල ආගාධ හැදුනයි කියල තවත් මතයක් තියෙනවා. නමුත් පිටසක්වලකින් මේ පෘථිවියට කිසිම උල්කාපාතයක් එන්න බැරි බව ''අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්'' ලිපි පෙළින් පැහැදිලි කළා. නමුත් යට තියෙන අවීචි මහා නරකාදියෙන් මහා විසාල සාපයක් නැගුනොත් ඒකෙන් විසාල ගින්නක් නැගිල බර්මියුඩා ත්‍රිකෝණය හෙවත් මකර කට හරහා එළියට පිට කරනවා. එහෙම පිට කළාම විශාල ගිනි බෝලයක් වගේ එකක් හට ගන්නවා. ඒ වගේ ගිනි බෝලයකින් එන විදුලි ප්‍රමාණය කියන්න බැරි තරම් විසාලයි. අධික තාපය නිසා වතුර ඔක්කොම උණු කරගෙන මහා විසාල කම්පනයකින් තමයි ඒක පිටවෙන්නෙ. ඒ මහා ගින්න උඩට එන්න පෙර නතර කරන්න වතුරටවත් බෑ. ඒක උඩ ගිහින් මහා බෝම්බයක් වගේ, අකුණක් වගේ කොහේ හරි ප්‍රදේශයකට පාත් වෙනවා. ඉතින් වැදිච්ච තැන මුළු පොළොවම හැරෙනවා. එහෙම ඒවාට තමයි ඔය ආවාට කියන්නෙ.

ලෝකයට උහුලන්න බැරි මහ විසාල අපරාධයක් සිද්ධ වුනොත් තමයි ඒ වගේ අවස්ථාවකදි අවීචි මහා නරකාදියෙන් මහා විසාල ගින්නක් සාපයක් විදියට නැගෙන්නෙ. උදාහරණ විදියට පසේ බුදුවරයන් වහන්සේ නමක් වගේ උත්තමයෙක් ඝාතනය කළොත් ඒ වගේ දෙයක් සිද්ධ වෙන්න පුළුවන්. අවීචි මහා නරකාදියට යන්න මහා අපරාධ කරන කොට ඒ වෙලාවට දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් මහ බලවත් විපාකයක් ඇඳෙන්න පුළුවන්. එතකොට ඒකට සම්බන්ධ වෙච්ච මුළු රාජ්‍යයම විනාස වෙලා යන්න ඒ සාපයම ඇති. ඒ වගේ ඇති වෙච්ච සාපවලින් තමයි විසාල ආගාධ, කාන්තාර වගේ දේවල් ඇති වෙන්නෙ. බුද්ධ සාසනයක් පැවතිච්ච ප්‍රදේශ පවා මහා පස් වැහි වැහැල විනාස වෙලා තියෙන්නෙ ඒ වගේ ආර්ය උතුමන්ට කරපු බලවත් අපරාධවලට සාපයක් වශයෙන්. අදත් පොළව යට කැනීම් කරන කොට පස්වලින් වැහිල තිබ්ච්ච මහ විසාල රාජධානි අහුවෙනවා. ඒවා බලාගෙන යන කොට මුල් කාලෙ බුදු දහම හොඳින් බැබලිච්ච ප්‍රදේශ. ඉතින් අර වගේ ලොකු සාපයක් වැදුනොත් ඒ මුළු පැත්ත පළාතම පිච්චිලා විනාස වෙන්න පුළුවන්. උදාහරණ විදිහට මොහෙන්දෝජාරෝ හරප්පා ශිෂ්ටාචාර මහා විශාල පස් වැස්සක් නිසා යටවූ බවත්, ඒකට හේතුව රහතන් වහන්සේ නමක් ඝාතනය කිරීමේ සාපයක් බවත් දිව්‍යාවදානයේ සඳහන් වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සත්ත්වයින්ට පහළ වන විවිධ කර්ම විපාකජ සෘද්ධි

(පසුගිය කලාපයෙන්: සත්වයින්ට පහළ වන විවිධ කායික අවස්ථා....)

සමහර අමනුස්ස කොටස්වලට ශරීරය ඝනීභවනය කරගෙන මනුස්සයින්ට පේන්න ඉන්න පුළුවන් බවත්, අවශ්‍ය නම් භෞතිකව අතට අහුවෙන්න ඉන්න පුළුවන් බවත් පසුගිය කලාපයෙන් විග්‍රහ කළා. ඒ පිළිබඳව තවදුරටත් කෙරෙන විග්‍රහයක් තමයි මේ.

සමහර අමනුස්සයින්ට, මනුස්සයින්ගෙ මස් ලේ ඇහැට පේන්න හිටින්න පුළුවන් වුනාට, ඒ හැම කොටසකටම සම්පූර්ණ ශරීරයම පෙන්වන්න පුළුවන්කමක් නෑ. සමහරක් කොටස්වලට ඒ ශක්තිය පූර්ණව නැති නිසා ශරීරය ඝනීභවන කළාම අඟපසඟ අඩුවෙන් විකෘති වෙලා තමයි පේන්නෙ. එතකොට තමයි ඔය භූතයො වගේ කියන්නෙ. නමුත් ඒ ශක්තිය හොඳින් තියෙන අයට සම්පූර්ණ අඟ පසඟ සහිත පූර්ණ රූපයෙන්ම පෙනී හිටින්න පුළුවන්. උදාහරණ විදියට මහේශාක්‍ය දෙවියෙක් තමන්ගෙ ශරීරය ඝනීභවනය කරගෙන පේන්න සැලැස්සුවොත් හොඳට හැඩට, පාටට ඉන්න ඉතාමත් ලස්සන රූපයක් තමයි පේන්නෙ.

මෙතනදි යම් කිසි කෙනෙක් ශරීරය පේන්න සලස්වන්නෙ ශරීරයේ තියෙන යම්කිසි ආලෝක කිරණ ශක්තියකින්. ඒ ආලෝකය ගත්තමත් විවිධ අමනුස්ස කොටස්වලට විවිධ මට්ටම්වලින් පිහිටනවා. එතකොට අඩු ශක්තියක් තියෙන අයට අඟපසඟ සහිත සම්පූර්ණ ශරීරයම පෙන්වන්න බෑ. මේ කාරණය උදාහරණයකින් පැහැදිලි කළොත්, හොඳට ලස්සන රූප සම්පත්තියක් තියෙන කෙනෙක් රෑට අඩ අඳුරෙ දැක්කොත් අපිට හරියට අඳුන ගන්න බෑ, භූතයෙක් වගෙයි පේන්නෙ. අපේ ඇස් පෙනීමත් අඩු නම්, කවුද ඒ කියල බලන කොට කොටසින් කොටස, තැනින් තැන තමයි පේන්නෙ. මුළු ශරීරයම අංග සම්පූර්ණව එක පාරටම පේන්නෙ නෑ. ඒ වගේ, **අමනුස්සයින්ටත් ඔප් නැංවිලා පූර්ණව පෙනී හිටින්න බැරි නම් ඒ අයගෙ නියම හැඩය බාහිරට පේන්නෙ නෑ.** තැනින් තැන අඩු පාඩු සහිතව සමහර විට භූතයෙක් වගේ තමයි පේන්නෙ. නමුත් හරියට පෙනුනොත් භූතයෙක් නෙවෙයි, හොඳ ලස්සන කෙනෙක් වෙන්නත් පුළුවන්.

උදාහරණ විදියට සෝටික හාමුදුරුවන්ගෙ දේහය අසල අඳුරු ඡායාවක් වගේ, දුමාරයක් වගේ එහෙ මෙහෙ පැද්දෙන යමක් පේනවද කියල බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් අහනවා. නමුත් ඒ දුමාරයක් නෙවෙයි, හරියට දැක්කොත් මිනිස්සු වසඟ වෙන වසවර්ති මාරයා තමයි ඒ විදියට දේහය වටේ කැරකුණේ. වසවර්ති මාරයා ඒ තරම්



රූපයෙන් ලස්සනයි. හැබැයි ඉතින් ඝනීභවනය කරල කැවුම් ගෙඩියක් වගේ මූණක් දාල විකෘති කරල තමයි සාහිත්‍යකරුවන් ඒක පෙන්වල තියෙන්නෙ. නමුත් තරහ ගිය වෙලාවට තමයි එහෙම ඉන්නෙ. මොකද ලස්සන කෙනෙක් වුනත් තරහ වෙලා බුම්ම ගෙන කේන්තියෙන් ඉන්න වෙලාවට මුහුණ විකෘතියි. නැත්නම් **ලෞකික පුණ්‍ය සම්පත්තියේ උපරිමය ලැබිච්ච බොහොම ලස්සන දේහධාරී කෙනෙක් තමයි වසවර්ති මාරයා කියන්නෙ.** මොකද පරනිම්මිත වසවර්තියේ ඉන්න දෙවියෙක් අනික් සියලු දිව්‍ය ලෝකවල ඉන්න දෙවියන්ට වඩා රූපයෙන් අග්‍රයි. නමුත් අර අවස්ථාවෙදි සෝටික හිමියන්ගෙ දේහය අසල හිටපු භික්ෂූන් වහන්සේලා ඇතුළු මිනිස්සුන්ට පේන්න එන්න අවශ්‍යතාවයක් මාරයාට තිබුනෙ නෑ. එහෙම අවශ්‍යතාවයක් තිබුණා නම් මාරයා එන්නෙ ඊට අනුකූල රූපයක් මවාගෙන. මොකද එහෙම මැවීමේ හැකියාවක් වසවර්ති මාරයාට තියෙනවා.

එතකොට ඒ ලෝකෙ ඉන්න දෙවියොත් මනුස්සයින්ට පෙනිල තියෙන්නෙ අඳුරු සේයාවක්, දුමාරයක් වගේ. අපි දුමාරයක් වගේ කෙනෙක් දැක්කොත් කියන්නෙ භූතයෙක් කියල. අපිට හරි රූපය හොයාගන්න බෑ. පූර්ණව දැක්කෙ නැත්නම් පේන්නෙ එහෙමයි. නමුත් අපිට විකෘති වෙලා පෙනුනට බුදුන් වහන්සේ ඒ අයව පූර්ණ රූපයෙන් දකිනවා. ඒ නිසා රූපය ඔප් නැංවුනාම සියල්ලම පේනවා. ඒ ඔප් නැංවීම ඔවුන්ගෙ හැකියාවක්. නමුත් අර අවස්ථාවෙදි තමන්ගෙ රූපය පෙන්වන්න මාරයා ආවෙ නෑ. සිය දිවි නසාගත් සෝටික හිමියන්ගෙ විඤ්ඤාණය ගියපු තැන හොයන්න තමයි මාරයා ආවෙ. ඒ නිසා එතන හිටපු අනිත් අයගෙ අවධානයක් ගන්න ඕන වුනේ නෑ. වෙන සෝදිසියකින් හිටපු නිසා එහෙම බලාපොරොත්තුවක් තිබුණෙ නෑ. ඇත්ත වශයෙන්ම සෝටික හිමියන්ට මොකද වුනේ, විඤ්ඤාණය කොහෙද ගියේ කියල හොයන්න තමයි මාරයා උන් වහන්සේගෙ දේහය අසල කැරකුණේ. මොකද විඤ්ඤාණය කියන්නෙ නාම ධර්මයක්. ඒ නිසා කවදාවත් රූපයකින් තොරව තනියෙන් යන්නෙ නෑ. ඉතින් රූපයත් එක්ක යනකොට විඤ්ඤාණය යනව වගේ පේනවා. ඒක තමයි මාරයා දකින්නෙ. මොකද මළාට පස්සෙ කෙනෙක් ශරීරයෙන් යනව වගේ අර සම්පිණ්ඩනය (ගන්ධබ්බය) තමයි පිටවෙලා යන්නෙ. ඒකට තමයි ආත්මය කියලත් රැවටෙන්නෙ. ආත්මය පාටයි, කඩුවකින් කපන්න කොටන්න බෑ කියල කියන්නෙත් ඕකට තමයි. නමුත් මාරයාට, විඤ්ඤාණයක් ශරීරයෙන් පිටවෙනව වගේ පෙනුනට, රහතන් වහන්සේ නමක් පිරිනිවන් පෑමේදී ඇති වෙන අවසාන චිත්තය දකින්න බෑ. ඒ නිසා තමයි අර විදියට උන් ☞

වහන්සේගෙ විඤ්ඤාණය හෙව්වෙ.

නමුත් බලපුවම උන් වහන්සේගෙ විඤ්ඤාණය ගිය දිහාවක් නෑ. මොකද උන් වහන්සේ අරිහත් ඵලයට පත් වෙලා හිටියෙ. එතකොට විඤ්ඤාණ නිරෝධ කරල. ඉතින් නොපිහිටි විඤ්ඤාණයෙන් උන් වහන්සේ පිරිනිවන් පෑවා. එතකොට යන්න විඤ්ඤාණයක් නෑ. මාරයා ඕක බලාගන්න සාමාන්‍ය විදියට ආව මිසක්, වේසයක් මවාගෙන එන්න බැරිකමකට නෙවෙයි එහෙම ආවෙ. ඒ නිසයි අනිත් අයට දුමාරයක් වගේ පෙනුනෙ. හැබැයි සාමාන්‍ය අයට දුමාරයක් වගේ පෙනුනට බුදුන් වහන්සේට මාරයා සම්පූර්ණයෙන්ම ඒ හැඩරුවෙන්ම පේනවා. උන් වහන්සේගෙ අනාවරණ ඥානයට ඒ සියල්ලම අහු වෙනවා. නමුත් ශ්‍රාවකයන්ට එහෙම පේන්නෙ නැති නිසා තමයි දුමාරයක් වගේ තියෙන ඡායාව පේනවද කියල භික්ෂූන් වහන්සේලාගෙන් ඇහුවෙ. එතකොට ඒ අනිත් අයට පේන විදිය තමයි උන් වහන්සේ කිව්වෙ. මොකද බුදුන් වහන්සේ දන්නවා, එතන හිටපු භික්ෂූන් වහන්සේලාගෙ මානසිකත්වයට අනුව උන් වහන්සේලාට මාරයා පේන්නෙ දුමාරයක් වගේ කියල.

ඒ වගේම මෙතනදි කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, සෝධික හිමියන් රහත් වෙලා හිටිය නම් ඇයි දිවි නසා ගත්තෙ කියල. සෝධික හිමියන් හුගක් අවස්ථාවල අසාධ්‍යව ඉඳල ධ්‍යානවලින් පිරිහුණා. එක අවස්ථාවකදි උන් වහන්සේ ප්‍රථම ධ්‍යානය ලබාගෙන ඉන්න කොට මෙහෙම කල්පනා වුණා. ''මේ ධ්‍යානය පිරිහෙන්නෙ නැතිව මම මෙතනින් චුත වුනොත් බඹ ලොව උපදිනවා. එහෙම නොවුනොත් මම කොහේ උපදියිද දන්නෙ නෑ. ඒ නිසා ඊට වඩා හොඳයි මට බඹ ලොව උපදින එක. මොකද මට දැන් වයසත් වැඩියි. කර කියා ගන්න දේකුත් නෑ. ඒ තරම් ශක්තියක් මට නෑ. මේ මොහොතෙ මළොත් මට බඹ ලොවට හරි යන්න පුළුවන්.'' මේ ආදී වශයෙන් හිතල ඒ ධ්‍යානය පිරිහෙන්නෙ නැතිව ඉන්න උත්සාහ කළත්, අසනීප වෙච්ච නිසා අවස්ථා ගණනාවකදිම උන් වහන්සේගෙ ධ්‍යාන පිරිහුණා. ඒ නිසා මේ අවස්ථාවෙදි උන් වහන්සේට කල්පනා වුනා, නැවතත් අසනීප වෙලා ධ්‍යාන පිරිහෙන්න පෙර බෙල්ල කපා ගෙන සිය දිවි නසා ගන්න ඕන කියල. මොකද බුදුන් වහන්සේ ප්‍රකාශ කරල තිබුණ, සෝධික හිමියන් අවසන් මොහොත වෙන කොට අරිහත් ඵලය ලබනව කියල. එතකොට උන් වහන්සේගෙ කියමනත් විශ්වාසයි. කවදාවත් අතරමං වෙන්නෙ නෑ කියලත් දන්නවා. එහෙම දැන ගෙන තමයි බෙල්ල කපාගෙන සිය දිවි නසාගන්න තීරණය කළේ. එතකොට ඒ මොහොතෙම වේදනානුපස්සනාවත් සිහි වුණා. එතනින් මේ ලෝකෙ තියෙන අසාරත්වය දැක්කා. එහෙම දැකල බෙල්ල කපා ගන්නවත් එක්කම අරිහත් ඵලයට පත් වෙලා පිරිනිවන් පෑවා.

ඒ වගේම මේ වසවර්ති මාරයා විවිධ වෙස් මවාගෙන මේ විදියට කොච්චර නම් ඇවිල්ල පෙනී ඉඳල තියෙනවද? මනුස්ස වෙසින් ඇවිත් පෙනී ඉඳල මිනිස්සු කාමයට පොළඹවන්න, වයසක මිනිස්සුන්ගෙ වෙස් මවාගෙන ඇවිත් පෙනී ඉඳල භික්ෂූන් වහන්සේලා රවට්ටන්න ගත්තු උත්සාහයන් කොච්චර නම් තියෙනවද? දවසක් කුඩා භික්ෂූන් වහන්සේලා පිරිසක් වඩිනව දැකල, මාරයා රැවුල වැවිච්ච වයසක මනුස්සයෙක්ගෙ



වෙසක් මවාගෙන ඇවිත් මෙහෙම කිව්වලු. ''මේ තාම තරුණ වයසවත් ඇවිත් නෑ, කොච්චර කාම සම්පත් විඳින්න තියෙන අවස්ථාවක්ද? මොකද මේ මෝඩ වැඩ කරන්නෙ? ඔය මහණකම් කරන්න පුළුවන් පස්සෙ, ඔය කාලෙ මහණ වෙන්න නෙවෙයි තියෙන්නෙ, ගිහිව ඉඳගෙන පින් දහම් කරගෙන කාම සම්පත් විඳින්න'' මේ ආදී වශයෙන් කිව්වම, අපි තථාගතයන් වහන්සේගෙ ශ්‍රාවකයො, කාම සම්පත්වලට යන අය නෙවෙයි, ඒව මහ ජරා ගොඩවල් කියල ඒ භික්ෂූන් වහන්සේලා උත්තර දුන්නා. එතකොට මාරයා දිව එළියට දාල නළල රැළි කරගෙන යන්න ගියා. ඒ කාරණය බුදුන් වහන්සේට ගිහින් කිව්වම ස්වාමීනි, අපිට මෙහෙම වයසක කෙනෙක් මගදි මුණ ගැහිල මෙහෙම කිව්ව කියල, උන් වහන්සේ කියනව, මහණෙනි ඔය වයසක මිනිහෙක් නෙවෙයි, මාරයා වෙස් මවාගෙන ආවෙ කියල.

ඒ වගේම නයි වෙසින් ඇවිත් බුදුන් වහන්සේටත් පිඹල උන් වහන්සේත් රවට්ටන්න උත්සාහ කරල තියෙනවා. ඇත් වෙසින් ඇවිත් මහ කළු ගලක් වගේ පෙනී ඉඳල රවට්ටන්න උත්සාහ කරල තියෙනවා. ඒ විදියට අවශ්‍ය වේසයෙන් සම්පූර්ණයෙන්ම පෙනී ඉන්නත් පුළුවන්. ඕන නම් ඒ වෙසින් දිගටම ඉන්නත් පුළුවන්. නමුත් මාරයා තමන්ගෙ පාඩුවේ ඉන්න කොට, දිවැස් නැති සාමාන්‍ය අයට පේන්නෙ අර විදියට දුමාරයක්, ඡායාවක් වගේ යන්තමට. දිවැස් තියේ නම් ඊට වඩා හොඳට බලාගන්න පුළුවන්. එක එක්කෙනාගෙ පේන මට්ටම් අනුව ඒක වෙනස් වෙනවා. සමහර විට උසස් දිවැසක් තිබුණොත් සම්පූර්ණයෙන්ම විනිවිද දකින්නත් පුළුවන්. ඒ නිසා සියල්ලටම එක වගේ බලාගන්න බෑ.

එතකොට අමනුස්සයො ගත්තමත් සම්පූර්ණ කයම පෙන්වන්න පුළුවන් අයත්, බැරි අයත් ඉන්නවා. දිවැස් තියෙන අය ඒ ශක්තියෙන් අර නොපෙනෙන අමනුස්සයින්ගෙ නියම ස්වරූපය දකිනවා. උදාහරණ විදියට භූතයෙක් වගේ ඉන්න කෙනෙක් දිහා සියුම් දිවැසින් බලල, ඒ භූතයෙක් නෙවෙයි මේ විදියෙ හැඩ රුව ඇති කෙනෙක් කියල නියමාකාරයෙන් දකින්න පුළුවන් අය ඉන්නවා. ඒ වගේ අයට ඒක හොඳට පැහැදිලිව පේනවා. **සමහර අවස්ථාවල සමහර ගන්ධබ්බයො, අමනුස්සයො ආදීන් ඡායා රූපවලට වැටුණොත් ඒකට අහුවෙන්නෙ භූතයෙක් වගේ පින්තූර. හැබැයි ඒක දිවැසකින් යොමු කරල බලන්න පුළුවන් කෙනෙක් හිටියොත්, සමහරවිට හොඳ ලස්සන හැඩරුව තියෙන කෙනෙක් වෙන්නත් පුළුවන්.** ගන්ධබ්බයො, අමනුස්සයො හැමෝම එක වගේ ලස්සනයි කියන එක නෙවෙයි මේ කියන්නෙ. විකෘති වෙච්ච කැත අයත් ඕන තරම් ඉන්නවා. නමුත් සාමාන්‍ය අයට පේන්නෙ ඒ සැබෑ ස්වරූපයෙන් නෙවෙයි. එතකොට මේ විදියට පූර්ණ කය නොපෙන්වන්නෙ හිතාමතාම හෝ නොහැකියාව නිසා වෙන්න පුළුවන්.

ඊළඟට සමහර අමනුස්සයින්ට කය ඝනීභවනය කරල අතට අහුවෙන්න ඉන්න පුළුවන් බවත් කිව්වා. ඒකට හේතුව තමයි මේ කිරණ කදම්බම ශක්ති කදම්බ බවට පත් කරන්න පුළුවන් හැකියාව.

☞

එතකොට ඒක කාන්දම් ශක්තියක් වගේ අතට අහුවෙනවා. කාන්දම් කෑල්ලක් අරගෙන කෙනෙකුට දීල, අනිත් අතින් තවත් කාන්දම් කෑල්ලක් ඒකට ළං කළොත් කාන්දමට කාන්දම ප්‍රතික්‍රියා දක්වනවා, එකින් එකට ස්පර්ශයක් පෙන්නුම් කරනවා. මේකට තවත් හොඳ උදාහරණයක් තියෙනවා. කම්බිලි නූල්වලින් හදපු එක්තරා මේස් ජාතියක් තියෙනවා. ඒ මේස් එකක් වියළි යමකින් පිරිමැද්දොත් ඒක ඇතුළෙන් පිම්බිලා කකුළක් වගේ ලොකු වෙනවා. එතකොට ඇතුළෙ කාන්දම්වලින් හැදිච්ච එක්තරා කිරණ වර්ගයක් හට ගන්නවා. ඒ කිරණ එක්තරා ඉඩ ප්‍රමාණයක් ගන්නවා.

ඒ කිරණවල එක්තරා කාන්දම් ශක්තියක් තියෙනවා. එතකොට කාන්දමේ දෙපැත්තක් තියෙනවා. එක පැත්තකින් ඇදල ගන්නවා, අනික් පැත්තෙන් විකර්ශනය කරනවා. එතකොට ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන ගත්තම එක වර්ගයේ කොටස් දෙකක් එකට සම්බන්ධ කරන්න බෑ, විකර්ශනය වෙනවා, එකිනෙක තල්ලු කරනවා. හරියට ස්ත්‍රී පුරුෂ වගේ. ඒ කියන්නෙ ස්ත්‍රීන් පුරුෂයන් ඇදල ගන්නවා, ස්ත්‍රීන් තල්ලු කරනවා. පුරුෂයන් ස්ත්‍රීන් ඇදල ගන්නවා, පුරුෂයන් තල්ලු කරනවා. හැබැයි මේ කියන්නෙ විකෘති පැත්ත නෙවෙයි, ප්‍රකෘති පැත්ත. ඒ වගේ මෙතනදිත් ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන කියන්නෙ ස්ත්‍රී පුරුෂ වගේ. ඒ දෙක එකිනෙකට ළං වෙනවා. නමුත් එක වර්ගයකට ඒ ජාතියෙම එකක් එකතු වෙන්න හැදුවොත් විකර්ශනය වෙනවා. දැන් මේ අවස්ථාවෙදි මේස් එක ඇතුලෙ තියෙන්නෙ ධන ආරෝපිත ප්‍රෝටෝන. ඒකෙ ඇතුලෙ ප්‍රෝටෝන හැදෙන කොට ප්‍රෝටෝන - ප්‍රෝටෝන ඈත් කරල තල්ලු කරනවා. එතකොට ඒ මේස් එක පිම්බෙනවා.

ඒ වගේම සමහර වර්ග ළං වුනාම විසි කරනවා. සමහර ඒව ඇදල ගන්නවා. උදාහරණ විදියට පනාවක් පිරිමැදල ඒකට පුංචි කොළ කෑලි ටිකක් ළං කළොත් ඒක ඇදල ගන්නවා. නමුත් වීදුරු කෑල්ලක් පිරිමැදල ඇල්ලුවට ඇදල ගන්නෙ නෑ. විකර්ශනය වෙනවා. (ස්ථිති විද්‍යුතය තමයි මෙතන ක්‍රියාත්මක වෙන්නෙ.) මෙහෙම දෙයක් තමයි මෙතනදි සිද්ධ වෙන්නෙත්. එතකොට යම්කිසි ආකෘතියක් ඇතුළට ගත්තොත් ඒ ආකෘතියත් ඒ ආකාරයෙන් පිම්බිලා සකස් වෙනවා. හැබැයි නැවතත් අර කිරණ අහක් වුණාම, තිබිච්ච වගේම සාමාන්‍ය තත්ත්වයට පත් වෙනවා. එහෙම වෙන්නෙත් අර කිරණවලින් හැදෙන හැඩරුවින්. ඒ මේස් එක අල්ලල පොඩ් කළොත් තදට දැනෙනවා. හැබැයි ඇතුළෙ මුකුත් නෑ, පිට ආකෘතිය විතරයි.

මේ වගේ, කිරණ කයක් සනීභවනය කරල යම්කිසි විදියකට අල්ලන්න, ස්පර්ශ කරන්න පුළුවන් තත්ත්වයට සකස් කරන්න පුළුවන්. ඒ වගේම කෙනෙක්ගෙ ඇහැට පේන්නෙ නැති වෙන්න අල්ලන්නත් පුළුවන්. ඒ කිරණමය රූපය විඤ්ඤාණයත් එක්ක හැදිල තියෙන නිසා ඒ රූපය නාමයට අනුව පාලනය වෙනවා. ඒ කියන්නෙ අමනුස්සයා හිතන විදියට කිරණමය රූපයේ හැඩරුව වෙනස් කරන්න පුළුවන්. ඒක පවත්වන්නෙත් විඤ්ඤාණයෙන්. එතකොට අවශ්‍ය නම්, ඒ කිරණමය ආකෘතිය භෞතිකව අතට අහුවෙන්න සකස් කරන්නත් පුළුවන්. පේන්න අල්ලන්නත් පුළුවන්. ඒ වගේම නොපෙනෙන්න අල්ලන්නත් පුළුවන්. පේන්න අහු වෙන්න නම්, ඒ කිරණවලින් කොටසක් ආලෝකය බවට පත්වෙන්න සලස්වන්න ඕන. ඒ ආලෝක කිරණ වර්ණවත් කළොත් ඒ වර්ණයන්ට අනුව හැඩයක් පේනවා. රතු, කහ, නිල්, සුදු වගේ ආලෝක කිරණ මාලාවක් ඒ අමනුස්සයට ගන්න පුළුවන් නම්, ඒ ශරීරය ආලෝකමත් කරන්න පුළුවන්.

උදාහරණ විදියට ටියුබ් ලයිට් එකක දෙපැත්තෙන් කිරණක් යවන කොට ඒක ඇතුළෙ තියෙන වායුව දිගේ ගිහින් දීප්තිමත් ආලෝකයක් ඇති කරනවා. මේ වගේ යම්කිසි පරමාණුක ශක්තියක් බවට, ආලෝක ශක්තියක් බවට, එහෙම නැත්නම් ඝන බවට පත් කරල ශරීරය පෙන්වන්නත් පුළුවන්. ඕන නම් ඒ ඒ අයගෙ මට්ටම් අනුව රැස් විහිදවන්නත් පුළුවන්. හැබැයි ඒක භෞතික කයක් නෙවෙයි. ඒ කියන්නෙ මස්, ලේ, ඇට, නහරවලින් හැදිච්ච එකක් නෙවෙයි. නමුත් පිටින් බැලුවම භෞතික කයක් වගේම පේනවා. ඒ වගේම ඇල්ලුවොත් ස්පර්ශත් වෙනවා. ඒ නිසා තමයි සමහර අමනුස්සයො කය සනීභවනය කරගෙන මනුස්සයො එක්ක සම්බන්ධ වෙන්නෙ. සමහර වෙලාවට එහෙම සම්බන්ධ වෙලා කරදර හිරිහැර කරන අවස්ථාත් තියෙනවා. ඒ වගේම එහෙම සනීභවනය කරගෙන මනුස්සයොත් එක්ක ශාරීරිකව එකතු වෙලා ආස්වාද විඳින අවස්ථාත් තියෙනවා. කෙනෙකුට නොපෙනී මනුස්සයොත් එක්ක එහෙම ශාරීරිකව එකතු වෙන්නත් පුළුවන්. ඒ කියන්නෙ වර්ණ කිරණ නිර්මාණය නොකර ඉන්නවා. එතකොට පේන්නෙ නැති වෙන්න ඇවිත් අතින් අල්ලනවා, ඇඟේ ස්පර්ශ වෙනවා. නමුත් ඇහැට පේන්න කෙනෙක් නෑ. හැබැයි කෙනෙක් ඉන්න බව වැටහෙනවා. ඒ වගේම ශරීරය තෙරපන්න, ශරීරයට පහර දෙන්න වගේ දේවල් කරන්නත් පුළුවන්. බුදුන් වහන්සේ අධිෂ්ඨාන කරල ඕනම කළු ගලකට වුණත් ශ්‍රී පතුල තිච්චම ඒ ගල එරාගෙන ගිහින් ශ්‍රී පතුලෙ සටහනක් පිහිටනව වගේ, මේ කිරණමය කය තියෙද්දි අධිෂ්ඨාන කරන්න පුළුවන්නම් එහෙම මස් ලේ කයකට සම්බන්ධ වෙන්නත් පුළුවන්. ඒ වගේම අවශ්‍ය ප්‍රමාණයට ශරීරය බර කරන්නත් පුළුවන්. එතකොට මනුස්ස ශරීරයක් වගේම බරයි. පේන්න ආවොත් හොයන්න බෑ, මනුස්සයෙක් වගේමයි. නමුත් ඇත්ත වශයෙන්ම ගත්තොත් මස්, ලේවලින් හැදිච්ච කයක් නෙවෙයි ඒ අයට තියෙන්නෙ.

ඒ නිසා ඒ වගේ **කය සනීභවනය කරගත්තු අමනුස්සයෙකුට ආයුධයකින් ගහල කපන්න කොටන්න බෑ. මොකද පිටට මස් ලේවලින් හැදිච්ච ආකෘතියක් වගේ පෙනුනට කාන්දම් කිරණ ශක්තියකින්** තමයි ඒ කයේ ආකෘතිය හැදිල තියෙන්නෙ. එතකොට යම්කිසි ආයුධයකින් ගැහුවොත් ඒ කිරණමය කාන්දම් ශක්තිය වහාම ක්‍රියාත්මක වෙලා ඒක අහකට විකර්ශනය කරනවා. මේ විදියට අමනුස්සයො වගේම සමහර මනුස්සයොත් ප්‍රයෝග සම්පත්ති යොදල උපක්‍රමශීලීව හෝ ධ්‍යාන බලයකින් හෝ අභිඥා බලයකින් හෝ ශරීරය වටා කිරණමය කාන්දම් ශක්තියක් නිර්මාණය කරගන්නවා. එහෙම අයටත් ආයුධයකින් ගැහුවට වදින්නෙ නෑ, කැපෙන්නෙ කෙටෙන්නෙ නෑ. ඒ නිසා තමයි අමනුස්සයින්ට හෝ ඒ විදියෙ ශක්තියක් තියෙන මනුස්සයින්ට යකඩ පොල්ලකින් ගැහුවත් ඒක නැමිල යන්නෙ. නමුත් ගහපු අය හිතන්නෙ ඒ පුද්ගලයගෙ මස් පිඬු එච්චරටම තද නිසා එහෙම වුනා කියල. නමුත් එතන තියෙන්නෙ මස් පිඬුවල තද බවක් නෙවෙයි, ශරීරය වටා තියෙන කාන්දම් වළල්ල නිසා ඒක විකර්ශනය කිරීමක්. සමහර විට ඒක අඟල් 1/2 ක් විතර ඝනකමට හැදිල තියෙන්නත් පුළුවන්. එතකොට මොන විදියෙ ආයුධයකින් ගැහුවත් වදින්නෙ නෑ. අහකට විසි කරනවා. මොකද වදින්නෙ කාන්දම් ශක්තියට.


ඒ නිසා අමනුස්සයින්ට, සමහර මනුස්සයින්ට ගැහුවම ඒ ගහපු ආයුධ පවා නැමෙනවා. සමහරු ගහන කොට උරහිස අල්ලනවා. නමුත් ඒ ආයුධය නැමිල යනව මිසක් උරහිසට මුකුත් වෙන්නෙ නෑ. හැබැයි ඒ ආයුධයෙන්ම ගහකට ගැහුවොත් ගහ තැලෙනවා. ඒකෙන් පැහැදිලි වෙනව මස් ලේ කයට නෙවෙයි වදින්නෙ ☞

කියල. මොකද ගහක ලීයකට වඩා හයිය මස් ලේ ශරීරයක් කාටවත් නෑ. ගහක කොවුලකට, ලීයකට ආයුධයකින් ගැහුවම ඒකත් එබිල යනව නම්, මස් ලේ කයකට ගැහුවම මස් පිඩු තැලිල යන එක අමුතු දෙයක් නෙවෙයි. නමුත් මෙතනදි මස් ලේ කයට ගැහුවට වදින්නෙ ඒකට නෙවෙයි, කිරණමය කාන්දම් වළල්ලට. ඒ වගේ කිරණ කයක් ශරීරය වටා තියෙන සමහර මනුස්සයොත් ඉන්නවා. එතකොට ඒ වගේ කෙනෙක් අධිෂ්ඨාන කළාම චිත්තජ කයෙන් ඒක පාලනය කරන්න හැකියාවක් ලැබෙනවා. ඒකෙන් අර වටේට තියෙන කිරණ කය ඝනීභවනය කරල ඒ ආයුධයට ඔරොත්තු දෙන ශක්තියක් නිර්මාණය වෙනවා. ඒ හැදෙන කාන්දම් ශක්තියෙන් තමයි බාහිර උපද්‍රවවලට ඔරොත්තු දෙන්නෙ.

අමනුස්සයොත් මේ වගේ කාන්දම් කිරණ බලයකින් ඉන්නෙ. ඒ නිසා ඒ අයට ගැහුවමත් ඒ ගහපු ආයුධය නැමිල අහකට විසි වෙනව මිසක් වදින්නෙ නෑ. වෙඩි තිව්වත් වදින්නෙ නෑ, වෙඩිල්ල අහකට යනවා. හෙණරාජ යන්ත්‍රය වගේ වෙඩි නොවදින යන්ත්‍ර හදන්නෙත් ඔය ක්‍රමයට. එතනදි මන්ත්‍ර බලෙන් තමයි ඒක සිද්ධි කරන්නෙ. **ඒ වගේ යන්ත්‍රයක් හදල කෙනෙකුට දැම්මට පස්සෙ ඒ පුද්ගලයගෙ ශරීරය වටේ යම් කිසි කාන්දම් වළල්ලක් හට ගන්නවා. ඊට පස්සෙ ඒ යන්ත්‍රය පැළඳගෙන ඉන්න තාක්, ඒකෙ ශක්තිය තියෙන තාක් ඒ පුද්ගලයට ගැහුවට, වෙඩි තිව්වට වදින්නෙ නෑ.** ඒ වගේම විජ්ජාමය සෘද්ධි, ප්‍රයෝග සෘද්ධි, ධ්‍යාන සෘද්ධි කියලත් විවිධ ක්‍රම තියෙනවා. ඒ වගේ සෘද්ධි ක්‍රමයක් තමයි මේ විවිධ ක්‍රමවලින් පුරුදු පුහුණු කරල ගන්නෙ. සෘද්ධි කියන්නෙ යමක වෘද්ධිය හෙවත් වර්ධනය. එතනදි ඇතිවන කාන්දම් ශක්තිය තමයි මේ විදියට ක්‍රියාත්මක වෙන්නෙ. ඒ කාන්දම් ශක්තිය විවිධ ක්‍රමවලින් චිත්ත පාලනයට නතු කරගන්න පුළුවන්. ඒක ප්‍රගුණ කරගත්තට පස්සෙ තම තමන්ගෙ හැකියාව අනුව හිතන හිතන විදියට පාලනය කරන්න පුළුවන්. සමහර වෙලාවට ඒකෙන් ආකාසයට නගින්නත් පුළුවන්. යම් යම් මැවීම් කරන්නත් පුළුවන්.

ඒ වගේම සමහර ප්‍රබල අමනුස්සයො, කෙනෙක්ගෙ ශරීරයට ආවේස වුනාම ඒ අමනුස්සයගෙ ශක්තියත් ඒ පුද්ගලයට එනවා. සමහර විට එහෙම මනුස්සයො ස්වභාවයෙන්ම ඔතැනි වුනත්, අමනුස්සයෙක් ආවේස වුනාම ප්‍රබල විදියට හැසිරෙනවා. උදාහරණ විදියට බෝතල් කටුවලට, උල්වලට කැපෙන්නෙ කෙටෙන්න නෑ. ඕන තැනක දුවල පැනල විවිධ දේවල් කරන්න පුළුවන්. සමහර විට මනුස්සයෙකුට හිතන්න බැරි විදියට හුගක් ඉහළට යන්න උඩ පනිනවා. ඒ වගේම අයිල පදිනවා කියල දෙයක් තියෙනවා. ඒ කියන්නෙ පුවක් රීප්පයක් වගේ දෙයක් ගස් දෙකක් අතර බැඳල මනුස්සය ඒක උඩ දුවනවා. මේ වගේ සර්කස්කරුවෙකුටවත් කරන්න බැරි දේවල් කරනවා. අර ශරීරයට රිංගගත්තු අමනුස්සය තමයි දන් මේ ඔක්කොම කරන්නෙ. ඒ කරන්නෙත් අර විදියට කිරණ ශක්ති අවශ්‍ය විදියට පාලනය කරගෙන. ඒ නිසා මනුස්සයගෙ මස් ලේ කයට මුකුත් අනතුරක් වෙන්නෙ නෑ. සමහර වෙලාවට පොල් මලකින් මුහුණ දෙපැත්ත තලා ගන්නවා. ඒ වුනාට මූණෙ කිසිම තැලීමක් සීරීමක්වත් නෑ. එහෙම වෙන්නෙ අර අමනුස්සයගෙ කාන්දම් බලය නිසා. එතකොට කොච්චර ගැහුවත් මූණට නෙවෙයි වදින්නෙ, වටේ තියෙන කාන්දම් කිරණ වළල්ලට. අන්තිමට පොල් මල පොඩිවෙලා යනව මිසක් මනුස්සයගෙ මූණට කිසිම දෙයක් වෙලා නෑ.

ඒ වගේම මේ මිනිස් ඇහැට පේන්න මනුස්ස ස්වරූපයෙන් එන අමනුස්සයින්ගෙ ශරීරය ඇතුලෙ,



මනුස්සයින්ගෙ වගේ මස් ලේවලින් හැදිච්ච හදවත, බඩවැල් ආදී ඉන්ද්‍රියන් නෑ. නමුත් ඒ හැම ඉන්ද්‍රියකම කිරණමය ආකෘතියක් තියෙනවා. නමුත් මනුස්ස වෙසින් පේන්න ආපු වෙලාවට ඒ ශරීරය පිටින් බැලුවොත් අමනුස්සයෙක් කියල අඳුන ගන්නත් බෑ. මනුස්සයෙක් වගේමයි. ඇල්ලුවොත් අතට ස්පර්ශත් වෙනවා. නමුත් තියෙන්නෙ ආකෘතියක් විතරයි. ඒ ආකෘතිය ඝනීභවනය වෙලා තමයි අර විදියට පේන්නෙ. ඒ වගේම සියලු අඟ පසඟින් යුත් රූපයක් මවන ක්‍රමයකුත් තියෙනවා. ඒක මනෝමය ක්‍රමයක්. මෙතනදි කාය 3 ක් ගැන කියවෙනවා. ඕළාරික කරජ කාය කියන්නෙ අපේ තියෙන මේ මස් ලේ කය. අනිත් 2 තමයි රූපීය මනෝමය ආත්ම භාවය සහ අරූපී සංඥාමය ආත්ම භාවය. **රූපීය මනෝමය ආත්ම භාවයෙන් සියලු අඟ පසඟ සහිත ශරීරයක් මවල මේ මස් ලේ ශරීරයෙන් අහකට ගන්න පුළුවන්.** ඒ ශරීරය ඇතුල බැලුවොත් අඟ පසඟ සියල්ලම තියෙනවා. නමුත් ඒ සියල්ලම මනෝමය ඉන්ද්‍රියන්. එතකොට ඒ මස් ලේ කය හිමි පුද්ගලය වගේම කෙනෙක් තමයි ඒ මනෝමය කයින් පෙන්වන්නෙත්. ඒක පිටින් බැලුවට මස් ලේ කයත් එක්ක වෙනසක් පේන්නෙ නෑ. ඒ වගේ සිය දහස් ගණනක් වුනත් මවන්න පුළුවන්. උදාහරණ විදියට චූල්ල පන්ථක හාමුදුරුවො එක වගේ 1000 ක් මවාගෙන කතා කරල තියෙනවා. කවුද චූල්ල පන්ථක කියල ඇහුවම, මම චූල්ල පන්ථක කියල ඒ 1000 ම කියන්න ගත්තා. එක නමක් මිදුල අතු ගානවා, තවත් නමක් ආසන හදනවා. මේ ආදී වශයෙන් ඒ 1000 ම විවිධ වැඩ කටයුතුවල නිරත වෙලා හිටියෙ. ඒ ඔක්කොම චූල්ල පන්ථක හාමුදුරුවො වගේමයි. පිටින් බැලුවට කවුද ඇත්ත චූල්ල පන්ථක හාමුදුරුවො කියල අඳුන ගන්න බෑ.

ඒ වගේම මේ ශක්ති උපයෝගී කරගනිමින් සමහරුන්ට මහ කළු ගල් කඩන්න, පෙරලන්න වගේ දේවල් කරන්නත් පුළුවන්. ඒ කාරණය පැහැදිලි කළොත්, ලේසර් කිරණ කියන්නෙ අපේ අතට අහුවෙන එකක් නෙවෙයි. ඒක කාන්දම් ශක්තියේම එක්තරා පරිවර්තනයක්. අපි භාවිතා කරන කාන්දම් ආලෝකය බවට, විවිධ ශක්ති විශේෂ බවට පරිවර්තනය කරන්න පුළුවන්. ඒ වගේ දෙයක් තමයි ලේසර් කිරණ කියන්නෙ. ලේසර් කිරණයකට කිසිම දැනීමක් නැතිව ගලක් වුණත් පසාරු කරගෙන ඇතුළට ගිහින් කඩල බිඳල දාන්න පුළුවන්. ඒ වගේ කිරණ ධාරාවක් යම්කිසි කෙනෙක්ගෙ අතකින් නිදහස් කළොත්, දැනුමක් නැතිවම ගලක් වුණත් කුඩු කරල දාන්න පුළුවන්. යම්කිසි තැනකට එල්ල කරල ඒ ස්ථානය පසාරු කරන්නත් පුළුවන්. ඒකත් අර ශක්තියේම පරිවර්තනයක්. ගැමා කිරණ, බීටා කිරණ, ඇල්ෆා කිරණ ආදී වශයෙන් කියන්නෙත් ශරීරය ආශ්‍රිතව තියෙන කිරණ වර්ග තුනක්. අභිඥා ශක්ති තියෙන අයට මේ ලේසර් කිරණ පාලනයෙන් තමන්ට අවශ්‍ය විදියට හසුරුවන්න, පරිවර්තනය කරන්න පුළුවන්. සමහර විට ලේසර් කිරණ යවල යමක් අතුරුදන් කරන්නත්, සුනු විසුනු කරල දාන්නත් පුළුවන්. එහෙම ක්‍රම තියෙනවා. ඒ වගේ සමහර අමනුස්සයින්ටත් කර්ම විපාක සෘද්ධි තියෙන නිසා ඒ වගේ ශක්ති පිහිටනවා. එතකොට ඒ අයට අර කාන්දම් ශක්තියෙන් හැදිච්ච කයෙන් විවිධ කිරණ වර්ග නිකුත් කරන්න පුළුවන්. ඒ විදියට ආලෝක කිරණ නිකුත් කළොත් වටා පිටාව පේන්න ගන්නවා. ඒ ඒ අයගෙ ශක්ති මට්ටම්වල හැටියට ඒක කරන්න

පුළුවන්. ඒ වගේම ඒ කිරණ ශක්තිය විවිධ ශක්ති බවට පත් කරගෙන බර කරන්න, තල්ලු කරන්න, කඩන්න බිඳින්න ආදියත් පුළුවන්.

ඒ වගේම හිත පුරුදු පුහුණු කරගත්තොත් සමහර මනුස්සයින්ටත් ඒ වගේ දේවල් කරන්න පුළුවන්. යම්කිසි ප්‍රයෝග සම්පත්තියක් අරගෙන ඒක හුරු කරගෙන විජ්ජාමය සෘද්ධි පෙන්වන්න පුළුවන් අයත් ඉන්නවා. ඒ විජ්ජා සෘද්ධි පුරුදු පුහුණු කළාමත් ධ්‍යාන සෘද්ධි වගේ ක්‍රමයක් ගන්න පුළුවන්. හැබැයි ඒ ධ්‍යාන නෙවෙයි. විජ්ජා සෘද්ධි කියන්නෙත් චිත්ත බලය ප්‍රගුණ කරල ගන්න විවිධ ක්‍රම. ඒ වගේම මන්ත්‍ර සෘද්ධි කියල දෙයක් තියෙනවා. මන්තර මතුරල තමයි ඒ සෘද්ධි බල ගන්නෙ. එක දිගටම මතුරල යම්කිසි බලයක් එතනදි ලබා ගන්නවා. මේ වගේ විවිධ ක්‍රම තියෙනවා.

මේකට උදාහරණයක් විදියට යූරි ගැලර් කියන එක්තරා පුද්ගලයෙක් ගැන කතාවක් තියෙනවා. ඒ පුද්ගලය ඉස්සෙල්ලම බලාපොරොත්තු වුණේ ඇඟිලි ටික එකතු කරල යම්කිසි කිරණක් යවල කූඹි විසුරුවල හරින්න. යම්කිසි තැනකට පැණි බින්දුවක් වගේ දෙයක් විසුරුවල එතැනට කූඹි වැහුවම අර කිරණ යවනවා. එතකොට උන්ට ඉන්න බැරිව විසිරිලා යනවා. ඒක තමයි ඔහු මුලින්ම කළයි කියන පරීක්ෂණය. මෙහෙම ටික කලක් කරන කොට ඒ හැකියාව වර්ධනය වෙලා ඊට පස්සෙ යකඩ නවන්න පුළුවන් ශක්තිය පවා ආවයි කියනවා. අන්තිමට තවත් ශක්තිය වර්ධනය වුණාම අධි වෝල්ටීය විදුලි රැහැනකින් දෙපැත්තට විදුලිය එන්නෙ නැතිවෙන්න අත දික් කරල නවත්තන්න පුළුවන් වුණාලු. එතකොට ඒ ශක්තිය ගන්නෙත් ඔය වගේ ක්‍රමයකට. ඒ වගේ දෙයක් ප්‍රගුණ කරනකොට ලෞකිකව එක්තරා සමාධියක් ලැබෙනවා. මොකද සමාධිත් විවිධාකාරයි. ඒ සමාධිය ප්‍රගුණ කළාම ඊට අනුකූලව යම්කිසි ශක්තියක්, බලයක් එක තැනකට කේන්ද්‍ර කරන්න පුළුවන් හැකියාව ලැබෙනවා.

(මේ ලිපියේ එන සමහර කරුණු සම්බන්ධයෙන් අත්දැකීම් කිහිපයක් අද අභයරතනාලංකාරය යටතේ විස්තර කර ඇත.)

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## නිවනට වදන්

**දුගතියට ඇද දමන නව විධ අගාධ වස්තු ඉතා භයානකයි.**
**අප්‍රමාදීව තේරුම් ගෙන එම පව් කඳ අතහැර දමා නිදහස් වන්න.**

එනම් තමාට දූනට අවැඩක් කරනවා කියල, අතීතයේ අවැඩක් කළා කියල, මතුවට අවැඩක් කරයි කියල, තමාගේ හිතවතාට දූනට අවැඩක් කරනවා කියල, අතීතයේ අවැඩක් කළා කියල, මතුවට අවැඩක් කරයි කියල තමාගේ සතුරාට දූනට උදව් කරනවා කියල, අතීතයේ උදව් කළා කියල, අනාගතයේදී උදව් කරයි කියල යමෙක් කෙරෙහි දූෂ්‍යතාවයෙන් කටයුතු කිරීම.

**- වහරක අභයරතනාලංකාර හිමි -**

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ 31 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**<u>ශ්‍රම දායකත්වය</u> -** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ ඇල්. අමරසිංහ මහතා - පිළියන්දල ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායකවූ පින්වතුන්

**<u>මූල්‍යමය දායකත්වය</u> -** ♦සමන් සිල්වා මහතා - කළුතර - රු. 19,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම- කුරුණෑගල - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙව්න්යා දුව -ගල්කිස්ස - රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු.5,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 5,000/- ♦ කේ.එච්. සඳුන් රණසිංහ මහතා, ශෂිකා අශානි මහත්මිය සහ රයලි යශස්වි දුව - මොරගල්ල - රු.5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනෙවිය - මහරගම - රු.5,000/- ♦ සුභාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු.5,000/- ♦ උපුල් දිසානායක මහතා, තේජකිත් රොද්‍රිගු මහතා, රංගා හර්ෂණී මහත්මිය, චාමර ජයසිංහ මහතා, අසංක විරාජ් මහතා, රොෂාන් පරණහේවා මහතා, ඩොනල්ඩ් කුලතන්ත්‍රි මහතා - යෝර්ක්, එංගලන්තය - රු. 35,056/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ ඩබ්. චන්ද්‍රරත්න මහතා ඇතුළු පවුලේ සැම - පාදුක්ක - රු.3,000/- ♦ පද්මාවතී ද සිල්වා මහත්මිය - කළුතර - රු. 2,500/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම ද සිල්වා මහතා - මාරවිල - රු. 2,000/- ♦ කේ.එච්. රණසිංහ මහතා සහ එච්.එම්. කුසුමාවතී මහත්මිය - පොල්ගහවෙල - රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනවිය - ගාල්ල - රු. 2,000/- ♦ කමල් විජේතුංග මහතා සහ පී.කේ. රේණුකා මහත්මිය - නියාගම - රු. 2,000/- ♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකන්ඩිය - රු.2,000/- ♦ චමිලා පෙරේරා මහත්මිය - ගෝණපල - රු.2,000/- ♦ සෝමා සෝමදාස මහත්මිය සහ ජගත් දීප්ත පුතා - වටරැක - රු.2,000/- ♦ කපිල වික්‍රමනායක මහතා, වීණා අතුකෝරාල මහත්මිය සහ ජනිඳු බිම්සර පුතා - මීරිගම - රු.2,000/- ♦ මධුභානි කළුවැව මහත්මිය - මාලබේ - රු. 1,500/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා-කුරුණෑගල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ නදීශා හර්ෂනී

ලියනගේ මෙනෙවිය - කළුබෝවිල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ අනුරුද්ධ ඉද්දවෙල මහතා - කඩවත - රු. 1,000/- ♦ එච්.ජේ. තනුජා ලක්මාලි මහත්මිය සහ පී.ඩී. සුගත් සමරතුංග මහතා - මාකඳුර - රු. 1,000/- ♦ සී. එම්. පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ නිලූකා ප්‍රභාෂිනී ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ♦ ඒ.වී.ඩී. ජගත් මහතා - පිළියන්දල - රු. 1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු.1,000/- ♦ පී. ඩී. නයනි නිරෝෂිකා මහත්මිය - මහරගම - රු.1,000/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ - රු.1,000/- ♦ කුසුමලතා තෙන්නකෝන් මහත්මිය - වැල්ලම්පිටිය - රු.1,000/- ♦ ශෂිනි කවීෂා ගුණරත්න දියණිය - මොරකැලේ - රු.1,000/- ♦ ජයනාත් සුබසිංහ මහතා - හෝමාගම - රු.1,000/- ♦ ඊ.ජී. සරත් නිශාන්ත මහතා සහ අමිත හිරුසර පුතා ඇතුළු පවුලේ සැම - නෙළුව - රු.1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, සුභාෂිනී දිසානායක මෙනවිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, ශ්‍රී රංජිත් සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, දීපශිකා වීරසූරිය මහත්මිය - මල්කඩුවාව, යෝශිකා රත්නායක මහත්මිය - මාලබේ, සරිත් හේවාවිතාරණ මහතා - ගාල්ල - රු.6,700/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 150,256/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 21,100/- ♦ සම්පූර්ණ වියදම - රු. 253,600/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල.
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කළේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
13. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (077 7577592)
14. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල)

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***

# පරවෙන මල්







මල් කිව්වම බොහෝ දේවල් හිතට එනා
කල් යන විටදී ඒ හැම මල් පරව යනා
බොල් වෙයි එවිට ලොව අනියත බවම තනා
සිල් ගුණ රැකොත් ගෙන දෙයි මුළු ලොවම දිනා

පිපෙනා මලේ තිබෙනා මුදු සුමුදු ගති
ගෙවෙනා එ විගසම නොපෙනේ ඇසට රති
තැනෙනා හැම දෙයම සුව ගෙන නොදෙති නිති
නැසෙනා මොහොත තෙක් නැත එය සතට සිති

විලේ සිරිය දුන්නේ මලමයි සාදා
මලේ වටිනකම නැති වෙයි පර වූ දා
ඇලේ කයට ලෝ සත හැඩ රුව ආ දා
හැලේ කඳුළු රිසි ලෙස කය නොම වූ දා



මර බිය ගෙන දෙනා අනත වූ සසර මැද
පර වෙන මල් ලෙසින් ඉපදී සැවොම ලද
හර නැති කයක තතු නොම දැන විඳින වද
ජර මරවලින් නිම වෙනු මිස සුවය දෙද

ටික කාලෙකට ඉඳුරන් පස පිනවන්නේ
නෙක නෙක ජාති ගොඩ ගහගෙන රැක ගන්නේ
දැක දැක නැසෙන විට කෙලෙසක ඉවසන්නේ
දුක එන විටදී මොනවද සුව ගෙන දෙන්නේ



සුන්දර සුවඳ ඇති විට සත වසඟ වෙනා
ගින්දර වගෙයි කියමින් ඇසුරටම යනා
මන්දිර දැකුම්කළු කෙරුවත් මැරෙන තැනා
දැන් දර ගොඩක් මෙනි ඒ හැම දුකම දෙනා



පර වෙන විටදී හැම දේමත් විසි කරනා
දුර යන විටදී කැඩී කැඩී පොළවට දිරනා
මරණය පෙනි පෙනී තවමත් නිදි කිරනා
පරතෙර නොදැක තව දුරටත් සැරි සරනා


මලින් කියන මේ උපමා ගෙන සසඳා
ලොවින් තැනෙන අවිදුව නිසි ලෙස විසඳා
වෙසින් එන තිදොස් දූවිලි ලෙස පිසදා
එයින් දෙන නැණින් ඉනු තව භව නොසදා





පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන





# දැකුමට නිවන් මුළු ලොවම විදසුන්.....

ලොව ඇති නිසරුව දැකුමට නොවසා
අවටැති සැම දේ ගත යුතු විමසා
භවයට සත අලවන හැටි පවසා
නිවනට මග පාදයි එම නැණසා

තමන් ඉන්න තැන වුවත් ඉඳ ගෙනා
ගිමන් හරින මොහොතකත් ගෙන නැණා
ගමන් යනෙන විට වුවත් සිහියෙනා
යොමන් එවිට විදසුනක් ගෙන දෙනා

හිඳින යනෙන කන බොන හැම විටකම
හැඳින නියම තතු දහමට අනුවම
බඳින සසර බැමි බිඳලන මොහොතෙම
විඳින මෙ දුක හැර ලැබ ගනු නිවනම

අහරක් කන බොන වේලෙත් රස විඳ
සුවයක් ලෙස තලු මර මර නොම ඉඳ
භවයක් තැනෙනා හැටි දැක පිරි සිඳ
සග මොක් සැප ලැබ ගනු අවිදුව බිඳ

බුදු උපතක් දක්නට ඇති කලෙකා
පිදුවද එක මලකුත් දැන නිසැකා
විදු නැණ මතු වෙත් සිටි තැන නොතකා
මිදුමට දහමක් ඇත පර මලෙකා

මුළු ලොව කමටහනක් කර ගත් විට
සුළු දෙයකුත් ඇති නිදහස් වෙන්නට
ගිලුණොත් දිටුවක අරණක මුත් සිට
සිළුවක් නැණ පන් නැති වෙත් උන් හට

අහනට බුදු බණ තිබුණොත් සුව දෙන
පහසුව ගත හැක කමටන් හැම තැන
වහගෙන ඇති විට මොක් සුව දෙන බණ
පහ කළ හැකි වෙද කෙළෙසුන් එලෙසින

පිළි සමුපන්නව ඇති වුණ දෙය හැම
එළි කර ගන්නට සැකයක් නැතුවම
ගිලිහෙන්නට පෙර ලැබු මනු භවයෙම
මැලි නොම වෙන් සිහි කරනට ලොව දම

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී